# ළමා පුස්තකාලය විපත්තිවය



නිලූෆර්

# ළමා පුස්තකාලයාධිපතිත්වය

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලීය ප්‍රකාශන

01. නව තොරතුරු මාධ්‍ය සහ පාසල් පුස්තකාල
02. මහජන පුස්තකාල ප්‍රමිති
03. මූලික සුචිකරණය
04. ලේඛන ප්‍රතිරූපණ විද්‍යාවේ මූලධර්ම
05. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය
06. පුස්තකාලය හා පරිගණකය
07. කුඩා කාර්මික ආයතන පුස්තකාල (පරිවර්තනයකි)
08. පුස්තකාල බලය (පරිවර්තනයකි)
09. පුස්තකාල පරිපාලනය පිළිබඳ හැඳින්වීමක් (පරිවර්තනයකි)
10. පුස්තකාල විඥාපන සේවා අධ්‍යාපනය හා පුහුණුව (පරිවර්තනයකි)
11. පුස්තකාල දැව භාණ්ඩ (සිංහල සහ දෙමළ)
12. මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනය (සිංහල සහ දෙමළ)

# ළමා පුස්තකාලයාධිපතිත්වය

ශිලා රායි

පුස්තකාල විද්‍යාව පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බර්මින්හැම් බහුතාක්ෂණික ආයතනය
එක්සත් රාජධානිය.

පරිවර්තක

ජී. ඩී. අමරසිරි

ප්‍රකාශනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

ප්‍රථම මුද්‍රණය 1998

BL 74235
09 APR 2001
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

රායි, ශිලා
ළමා පුස්තකාලයාධිපතිත්වය/ශිලා රායි; පරි. පී. ඩී. අමරසිරි
කොළඹ: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1998
පි. xii, 92; සෙ.මී. 21 - Children's librarianship කෘතියේ පරිවර්තනයකි.

ISBN 955-9011-82-0 මිල: රු.

i. 027.625 ඩිවි 21 ii. ග්‍රන්ථ නාමය
iii. අමරසිරි, පී. ඩී. පරි.
1. පුස්තකාල, ළමා 2. පුස්තකාල විද්‍යාව

**ISBN 955-9011-82-0**

Children's Librarianship
(ඉංග්‍රීසි ග්‍රන්ථයේ පරිවර්තනයකි)

ප්‍රකාශනය : **ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,**
14, නිදහස් මාවත, කොළඹ 07.

මුද්‍රණය: **තරංජි ප්‍රින්ට්ස්,** 506, හයිලෙවල් පාර, නාවින්න-මහරගම.

# නිමිත්ත

පුස්තකාල විද්‍යාව සම්බන්ධයෙන් පොත් පළකර එම ක්ෂේත්‍රය පිළිබඳ මුද්‍රිත සාහිත්‍ය පුළුල් කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරී ඇති තවත් එක් කාර්යයකි. මෙම කාර්යය සාර්ථකව ඉටුකරලීම සඳහා විවිධ පියවර ගෙන ඇත. මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අප මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් රචිත පොත් පළකිරීම එක් පියවරක් වශයෙන් සඳහන් කළ හැකිය. වෙනත් ආයතනවල සේවය කරන පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධ විද්වතුන් රචිත පොත් පළ කිරීම සඳහා කටයුතු කිරීම මෙන්ම අප රටේ අවධානයට යොමු විය යුතු මෙම ක්ෂේත්‍රය සම්බන්ධව වෙනත් භාෂාවලින් පළවී ඇති පොත් සිංහලට පරිවර්තනය කර පළ කිරීමද මෙම අරමුණේ තවත් පියවරකි. මෙම හැම පියවරකින්ම අප බලාපොරොත්තුවනුයේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධ මුද්‍රිත සාහිත්‍ය පුළුල් කිරීමය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවය කරන ජී. ඩී. අමරසිරි මහතා 'ළමා පුස්තකාලයාධිපතිත්වය' නමින් පරිවර්තනය කරන ලද මෙම පොත ඉහතින් සඳහන් කළ ක්‍රියාවලියේ එක් ප්‍රතිඵලයකි. මෙහි මුල් කෘතිය Sheila Ray විසින් රචිත Children's Librarianship නම් කෘතියයි.

මෙම පරිවර්තන කාර්යයෙහිලා, පරිවර්තක උනන්දු කරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතාත් මුද්‍රණ කටයුතු මෙහෙය වූ අප මණ්ඩලයේ ප්‍රකාශන නිලධාරී එච්. එන්. පීරිස් මහතාත් මෙහිදී සඳහන් කළ යුතුව ඇත.

**හෙන්රි සමරනායක**
සභාපති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

# පෙරවදන

මෙම ග්‍රන්ථය එක්සත් රාජධානියේ බර්මින්හැම් බහුතාක්ෂණික ආයතනයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන ශීලා රායි මහත්මිය විසින් රචනා කරන ලද "CHILDREN'S LIBRARIANSHIP" නැමති කෘතියේ පරිවර්තනයකි. මෙම කාර්යයෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ තවමත් නොදියුණු තත්ත්වයක පවතින මෙම ක්ෂේත්‍රය වර්ධනය කිරීම සඳහා යම්කිසි දායකත්වයක් ලබා දීමයි. එමෙන්ම ළමා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳව ග්‍රන්ථයක් සිංහල භාෂාවෙන් පළ වී නොතිබීමද මෙම ග්‍රන්ථය පරිවර්තනය කිරීමට තවත් හේතුවකි.

ශ්‍රී ලංකාවේ දැනට ළමා පුස්තකාල පවතින්නේ සුළු ප්‍රමාණයකි. ඒවාද නාගරික ප්‍රදේශවල පවතින ප්‍රධාන මහජන පුස්තකාල ආශ්‍රිතව පවතී. ශ්‍රී ලංකාවේ මහජන සහ පාසල් පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක කිරීමේදී ළමා පාඨක පිරිස කෙසේවත් නොසලකා හැරිය යුතු නොවේ.

ළමා පුස්තකාල සංවිධානය කිරීම, කාර්ය මණ්ඩල, පොත් එකතුන්, ප්‍රමිති, ව්‍යාප්ති සේවා ආදි ළමා පුස්තකාලවලට සම්බන්ධ වැදගත් කරුණු මෙම පොතෙහි ඇතුළත් වේ. මෙම ග්‍රන්ථය පරිවර්තනය කිරීමේ දී හැකි තරම් දුරට ශ්‍රී ලංකාවේ ළමා පුස්තකාල ක්ෂේත්‍රයට ප්‍රයෝජනවත් වන කොටස් කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වන ලදී. මෙම ග්‍රන්ථය විශේෂයෙන්ම ළමා පුස්තකාලයාධිපතින්ටත් පොදුවේ සියලුම පුස්තකාලයාධිපතින්ටත් පුස්තකාල විද්‍යා සිසුන්ටත් ප්‍රයෝජනවත් වේ යයි විශ්වාස කරමි.

මෙම කාර්යය සාර්ථක කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති හෙන්රි සමරනායක මහතාගෙන් සහ අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතාගෙන්

ලැබුණු දිරිගැන්වීමත්, සහයෝගයත්, ප්‍රකාශන කටයුතු කළ ප්‍රකාශන නිලධාරි නෙල්සන් පීරිස් මහතාගෙන් ලැබුණු සහයෝගයත් ස්තුති පූර්වකව සිහි කරමි.

**ජේ. ඩී. අමරසිරි**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
අංක 14,
නිදහස් මාවත, කොළඹ 07.

මෙම පොතේ පෙළට පාදක වී ඇත්තේ ශීලා රායි විසින් ලියැ වී 1979 දී ලන්ඩනයේ ක්ලයිවා බින්ග්ලි විසින් ප්‍රකාශිත 'Children's Librarianship' (Outlines of Modern Librarianship) නමැති කෘතියයි. තම කෘතියේ පෙළ මෙසේ පරිවර්තනය කිරීමට අවසර දුන් ශීලා රායි මහත්මියට අපගේ ස්තූතිය හිමි වෙයි.

The Text of this book is based on Sheila Ray's **Children's Librarianship** (Outlines of Modern Librarianship), Published by Clive Bingley, London, in 1979. Thanks are due to Mrs. Ray who gave permission for her text to be used in this way.

# පටුන


පිටුව

නිමිත්ත v

පෙරවදන vii

පළමුවන පරිච්ඡේදය 01
හැඳින්වීම

දෙවන පරිච්ඡේදය 06
ළමා පුස්තකාල සේවාවන් සඳහා ඉඩ පහසුකම්

තුන්වන පරිච්ඡේදය 14
ළමා පුස්තකාලයක එදිනෙදා කටයුතු

හතරවන පරිච්ඡේදය 24
ළමා පුස්තකාල සේවය සඳහා කාර්ය මණ්ඩලය සැපයීම

පස්වන පරිච්ඡේදය 28
පොත්පත්: ළමයින්ගේ අවශ්‍යතා හා රුචි අරුචිකම්

හයවන පරිච්ඡේදය 43
පොත්පත්: ප්‍රමිති

හත්වන පරිච්ඡේදය 50
පොත්පත්: තෝරා ගැනීමේ ක්‍රියාවලිය

අටවන පරිච්ඡේදය 55
වැඩිහිටි සේවාවන් වශයෙන් ළමා පුස්තකාලය

නවවන පරිච්ඡේදය 59
අනෙකුත් නියෝජිතායතන මගින් ළමයින්ට සේවා සැපයීම

දහවන පරිච්ඡේදය 74
ව්‍යාප්ති කටයුතු

එකොළොස්වන පරිච්ඡේදය 85
ප්‍රදර්ශන

දොළොස්වන පරිච්ඡේදය 87
මහජන සම්බන්ධතා හා ප්‍රචාරක කටයුතු

## පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම

'පොත්වලට ඇති රුචිය පුස්තකාල සහ ඒවායේ සම්පත් භාවිත කිරීමේ පලපුරුද්ද වඩාත් පහසුවෙන් ඇති කර ගත හැක්කේ කුඩා අවදියේ දී ය. ඒ නිසා ළමයින්ට පොත් සහ අනෙකුත් දෑ භාවිත කිරීමට අවස්ථාව සලසා දීම මහජන පුස්තකාලවල විශේෂ යුතුකමක් වේ. විශේෂ එකතුන් ද හැකි නම් පුස්තකාලයේ වෙන ම අංශයක් ද ඔවුන් සඳහා සපයා දිය යුතු ය. ළමා පුස්තකාලය එවිට ඉතා ක්‍රියාකාරී, සිත් ඇද ගන්නාසුලු ස්ථානයක් බවට පත් වන අතර, ඒ තුළ සිදුවන විවිධාකාර ක්‍රියාකාරකම්, සංස්කෘතික අපේක්ෂාවන් ඉටුකර ගැනීමේ මාර්ගයක් වනු ඇත.' (යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රකාශනය 1973.)

ළමා පුස්තකාලයක් පිළිබඳව අප කල්පනා කරන විට යම් කිසි චිත්ත රූපයක් අපේ සිත තුළ ඇති වේ. එහි විශේෂඥ ළමා පුස්තකාලයාධිපතීන් සිටිනු ඇත. පරෙස්සමෙන් තෝරා ගත් පොත් හොඳින් අසුරා තිබෙනු ඇත. එම පොත් විවිධ වයස් කාණ්ඩවලට ගැළපෙන ක්ෂේත්‍ර අනුවත් පැහැදිලි ලෙස සීමා කළ ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර අනුවත් පිළියෙල කොට තිබෙනු ඇත. එහෙත් ළමා පුස්තකාලයක් යන පදයෙන් ඊට වඩා යමක් අදහස් වේ. මෙම පොතේ විස්තර කර ඇත්තේ සියලුම ළමයින්ගේ පුස්තකාල අවශ්‍යතා පිළිබඳවයි. ළමයින් වැඩි දෙනකුට ළමා පුස්තකාලවල සේවය නොලැබේ.

විශේෂ පහසුකම් සහිත පුස්තකාලයට ළමයින්ගේ මෙන්ම දෙමව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ ද සිත් ඇද ගැනීමට හැකි වුවත්, ළමයින් වැඩි දෙනකුට වඩාත් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැක්කේ ඔවුන්ගේ නිවෙස් හෝ පාසල් සඳහා පිහිටුවන ලද පුස්තකාලවලිනි. එක් අන්තයක ඇත්තේ සැලකිය යුතු පොත් එකතුවක් සහිත අංග සම්පූර්ණ ළමා කාමරයකි. අනෙක්

අන්තයේ ඇත්තේ සති දෙකකට වරක් පැමිණෙන ජංගම පුස්තකාලයකි. සුදුසුකම් ලද පලපුරුදු ළමා පුස්තකාලයාධිපතීන් විශාල සංඛ්‍යාවක් බිහි වී ඇතත්, බොහෝ පුස්තකාලවල පූර්ණ කාලීන වශයෙන් පුස්තකාලයාධිපතීන් සේවයේ යොදවා නොමැත. මෙම පුස්තකාලයාධිපතීන්ගේ සේවය ළමයින්ට ලබා දිය යුතු වුවත් එය සිදුවන්නේ කලාතුරකිනි.

ළමා පුස්තකාල සේවාවේ වැදගත්කම වඩාත් පිළිගැනීමට ලක්වූයේ මෑතක දී ය. දහ නව වන ශත වර්ෂයේ දී එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ මහජන පුස්තකාල පිහිටුවනු ලැබූ වත් ළමා පුස්තකාල ආරම්භ කරන ලද්දේ පසු කාලයේ දී ය. එක්සත් ජනපදය 1920 දී ද මහා බ්‍රිතාන්‍යය 1930 දී ද ළමා පුස්තකාල පිහිටුවීම ආරම්භ කරන ලදී. ඉන් පසුව වුවද ඒවායේ වර්ධනය සිදුවූයේ ඉතා සෙමිනි. 1959 දී බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමයේ යොවුන් පුස්තකාල අංශය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව බ්‍රිතාන්‍යයේ ළමයින් සඳහා පුස්තකාල සේවාව ඌන සංවර්ධිත තත්ත්වයකින් පැවති බව අනාවරණය විය. 1959 රොබට් වාර්තාව පෙන්වා දුන් අන්දමට හොඳ පුස්තකාල සේවාවක් සඳහා විමර්ශන පුස්තකාලයාධිපතීන් මෙන්ම ළමා පුස්තකාලයාධිපතීන් ද අත්‍යවශ්‍යය. මෙම වාර්තාව බ්‍රිතාන්‍ය ළමා පුස්තකාල සංවර්ධනයේ වැදගත් සන්ධිස්ථානයක් විය.

උපත් අනුපාතය පහත වැටීම නිසා බ්‍රිතාන්‍යයේ ළමයින් සංඛ්‍යාව ද පහත වැටෙමින් පවතින නමුත් එම රටේ ජනගහනයෙන් සියයට විසි දෙකක් වයස අවුරුදු 14ට අඩු ළමයි වෙති. සංවර්ධිත වෙනත් බොහෝ රටවල ද මීට සමාන තත්ත්වයක් පවතී. සංවර්ධනය වෙමින් පවතින රටවලත් සංක්‍රමණ අනුපාතය අධික රටවලත් ළමයින් සංඛ්‍යාව අධික බව පෙනේ. සමූහයක් වශයෙන්, ළමයින් බොහෝ කොට මහජන පුස්තකාල භාවිත කරති. වයස් මට්ටම අනුව සලකන විට වැඩි ම සංඛ්‍යාවක් පුස්තකාල සාමාජිකත්වය ලබා ගන්නේ වයස අවුරුදු එකොළහේදී හෝ දොළහේදීය. යම් අයකු පුස්තකාලයක සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි වීමට වැඩි නැඹුරුවක් දක්වන්නේ මෙම වයසේදීය. ඉන්පසු සමහර ළමයින් අඛණ්ඩව

පුස්තකාල් භාවිත කරන අතර සමහර ළමයි ක්‍රමයෙන් ඉන් ඈත් වෙති. කෙසේ වෙතත්, අධ්‍යාපනික අවශ්‍යතා හෝ තොරතුරු පිළිබඳ අවශ්‍යතා සඳහා පුස්තකාල සම්පත් භාවිතය අවශ්‍ය වන විට ඔවුන් නැවත මහජන පුස්තකාල වෙත යොමු වෙති. තරුණ වියේදී හෝ වැඩිහිටි වියේදී හෝ ප්‍රථම වතාවට මහජන පුස්තකාල භාවිතය ආරම්භ කරන්නේ ස්වල්ප දෙනෙකි. වැඩි දෙනෙකු ප්‍රථම වතාවට මහජන පුස්තකාලයකට පැමිණෙන්නේ ළමා වියේ දී ය. පුස්තකාල සඳහා ඇති රුචිකත්වය තහවුරු වන්නේ එම අවධියේදී ය. ළමයින්ට පුස්තකාල පිළිබඳ අවබෝධයක් ලබා දීම පාසල් මාර්ගයෙන් පහසුවෙන් කළ හැකිය. අලුත් අත්දැකීම් ලබා ගැනීමට ඔවුහු සූදානම්ය. සිය විවේක කාලය ගත කිරීම සඳහා ළමයින්ට ඇත්තේ විකල්ප මාර්ග ස්වල්පයක් පමණි. මෙම අවධියේ දී ඔවුන්ට කියවීමට අවශ්‍ය වන සියලුම දෑ මිල දී ගැනීමට හැකියාවක් නොමැත.

ළමයින් අතර විවිධ වෙනස්කම් පවතී. සමාජයේ එක් කොටසක් ඔවුන්ගෙන් නියෝජනය වේ. ඔවුන් අතර ඉතා දක්ෂ අය, මානසික වශයෙන් දුබල අය, පොහොසත් අය මෙන් ම දුප්පත් අය ද සිටිති. ළමයින්ගේ රුචි අරුචිකම් සහ හැකියාවන් විවිධ වුවත්, අඩු සම්පත් ප්‍රමාණයකින්, වැඩිහිටි අයට ලබා දෙනවාට වඩා ඵලදායී සේවයක් ඔවුන්ට ලබා දිය හැකි ය. පොත් මිල ගණන් ඉහළ යමින් පැවතුණත්, වැඩිහිටි අය සඳහා වූ පොත්වලට වඩා ළමා පොත් තවමත් මිල අඩු ය. ළමා පුස්තකාලවලින් ඉතා උසස් ප්‍රයෝජන ලැබිය හැකි වන අතර එය අනාගතය සඳහා ඉතා හොඳ ආයෝජනයක් ද වේ.

මෙම පොතේ සඳහන් කරුණු ලෝකයේ ළමා පුස්තකාලවලට පොදුවේ අදාළ වේ. එහෙත් එම කරුණු බ්‍රිතාන්‍ය පුස්තකාලවලට වඩාත් අදාළ වන නිසා බ්‍රිතාන්‍ය මහජන පුස්තකාල පද්ධතිය පිළිබඳව කෙටියෙන් සඳහන් කිරීම ප්‍රයෝජනවත් වේ.

එංගලන්තයේ හා වේල්සයේ පළාත් පාලනය 1974 දී ප්‍රතිසංවිධාන කිරීම නිසා මහජන පුස්තකාලවල පාලනය මහ නගර සභා වෙත පැවරුණි. පුස්තකාල සේවාවන් හා අධ්‍යාපනික කටයුතු ඉටු කිරීම මහ නගර සභාවල වගකීම වේ. මෙම මහජන

පුස්තකාල අධිකාරිහු වැඩි ප්‍රමාණයක් පාසල් පුස්තකාල සඳහා ආධාර ලබා දෙති. ඒ සඳහා මුදල් ලබා දෙන්නේ අධ්‍යාපන කමිටුව මගිනි. කෙසේ වෙතත් ලන්ඩන් නුවර තුළ පිහිටි කැම්ඩන් සහ වෙස්ට්මිනිස්ටර් වැනි කොට්ඨාසවල අධ්‍යාපනික කටයුතු ඉටු කරනු ලබන්නේ ලන්ඩන් අධ්‍යාපනික අධිකාරිය විසිනි. එම අධිකාරිය මගින් මහජන පුස්තකාල සේවාවක් මෙන්ම පාසල් පුස්තකාල සේවාවක් ද ලබා දෙයි. ස්කොට්ලන්තයේ වත්මන් පළාත් පාලන ව්‍යුහය ස්ථාපිත කරන ලද්දේ 1975 දී ය. එහි මහජන පුස්තකාල සේවාවන් ඉටු කිරීම දිස්ත්‍රික්කවලට පවරා ඇත. අධ්‍යාපනය ලබා දීම ප්‍රාදේශීය අධිකාරී ආයතනවල වගකීම වේ. එම ප්‍රදේශීය අධිකාරී ආයතන වැඩි ප්‍රමාණයක් විසින් විශේෂ අධ්‍යාපනික සම්පත් සේවාවන් පිහිටුවා ඇත. ඒවා පාලනය කරනු ලබන්නේ ප්‍රවීණ පුස්තකාලයාධිපතීන් විසිනි. උතුරු අයර්ලන්තයේ 1973 සිට පුස්තකාල සේවාවන් සහ අධ්‍යාපනික කටයුතු ඉටු කිරීම, විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති පුස්තකාල හා අධ්‍යාපන මණ්ඩලයවල වගකීම වේ.

ළමා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳව සැලකීමේ දී මහජන පුස්තකාල හා පාසල් අතර ඇති සම්බන්ධතාව ඉතා වැදගත් වේ. එසේ වැදගත් වන්නේ ළමයින්ට හා තරුණයන්ට සේවාවන් ලබා දෙන්නේ දෙවර්ගයක පුස්තකාල සේවා ස්ථාන මගින් වන නිසාය. එම ස්ථාන, මහජන පුස්තකාල පද්ධතියේ හා පාසල් පුස්තකාලවල කොටසක් වේ. මෙම වර්ග දෙකම සත්‍ය වශයෙන්ම අවශ්‍ය ද යන ප්‍රශ්නය යම් කිසිවකු විසින් නැඟීමට ඉඩ ඇත. පාසල් පුස්තකාලවලට තනිවම එම කාර්යය සාර්ථක ලෙස කළ නොහැකි ද? ළමයින් නිතර පොත්පත් ඇසුරු කරන විට ගුරුවරුන්ට ද එය විශාල පහසුවක් වේ. කෙසේ වුවත්, ළමයින්ගේ ජීවිත සම්බන්ධයෙන් විශාල කාර්ය භාරයක් මහජන පුස්තකාල විසින් ඉටු කළ යුතුව ඇත. පෙර පාසල් අවධියේ පසු වන ළමයින්ට වුවත්, මහජන පුස්තකාලවලින් ප්‍රයෝජන ලබා ගත හැකිය. එමෙන්ම ළමයින් පොත්පත් ඇසුරු කරන විට දෙමාපියන්ට ද ඊට සහභාගි වීමට මහජන පුස්තකාල තුළ අවස්ථාව සැලසේ. පාසල් පුස්තකාල වසා ඇති විට ද මහජන

පුස්තකාල විවෘතව පවතී. ඒ සියල්ලට ම වඩා පොත්පත් යනු, ඉගෙනීම සහ විධිමත් අධ්‍යාපනය සඳහාම පවතින්නක් නොවන බව මහජන පුස්තකාල ඉතා පැහැදිලි ලෙස අපට පෙන්වයි. මහජන පුස්තකාල සහ පාසල් පුස්තකාලවල කාර්ය භාරය ඉතා පැහැදිලි ලෙස විග්‍රහ කර ඇත. අංග සම්පූර්ණ පුස්තකාල සේවාවන් සඳහා මෙම පුස්තකාල දෙවර්ගයම අත්‍යවශ්‍ය වේ. මෙම පුස්තකාල දෙ වර්ගයේම අරමුණ වන්නේ පොත්පත්වලින් ලැබිය හැකි ප්‍රයෝජනය සහ විනෝදය පිළිබඳ අවබෝධයක් ජීවිත කාලය තුළ ම පවතින ආකාරයට ළමයින් තුළ ඇති කිරීම යි. ළමයින් තුළ ආකල්ප වර්ධනය කිරීමේ දී පොත්පත්වලින් ඇති කරන බලපෑම් ප්‍රමාණය පිළිබඳව නොයෙකුත් මතභේද පවතී. එහෙත් ළමයින්ගේ බුද්ධි වර්ධනය හා දැනුම දියුණු කිරීම සම්බන්ධයෙන් මහජන පුස්තකාල ඉටු කරන විශාල කාර්ය භාරයේ වැදගත් කම කවුරුත් පිළිගනිති. පොත්පත්වලට රුචියක් දක්වන ළමයින්ට ඒවා ලබා ගත හැකි ප්‍රධානම මාර්ගය මහජන පුස්තකාල වේ.

ඉහත දැක්වූ කරුණු අනුව සලකන විට, ළමා පුස්තකාලයාධිපති වනාහි ළමා පොත් පිළිබඳ විශේෂඥයකු බව පෙනේ. ළමයින්ගේ ස්වාභාවික වර්ධනය පිළිබඳ අවබෝධයක් සහ ළමයින් හැකි තරම් විශාල ප්‍රමාණයක් වෙත ළඟා විය හැකි ආකාරයේ පොදු පිවිසුමක් ද සමඟ එම විශේෂඥතාව යා කළ යුතු ය. ළමයින්ගේ කියවීම පිළිබඳ සැලකිලිමත් වන දෙමාපියන්, ගුරුවරුන් වැනි අය වෙත පමණක් නොව, ගුරු පුහුණුව, ළමා ආරක්ෂාව වැනි කටයුතුවල යෙදී සිටින අය සමාජ සේවකයන් සහ ළමයින් සඳහා පොත් මිල දී ගැනීමට උපදෙස් විමසන ඥාතීන් වැනි අය සඳහා ද මෙම විශේෂඥ ඥානය ලබාදිය යුතුය. ළමා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ මෙම සියලුම අංශ වඩා විස්තරාත්මකව මෙම පොතේ සලකා බලනු ඇත.

දෙවන පරිච්ඡේදය

# ළමා පුස්තකාල සේවාවන් සඳහා ඉඩ පහසුකම්

"හැම මහජන පුස්තකාල ගොඩනැගිල්ලකම, වැඩිහිටියන් සහ ළමයින් යන දෙකොටස ම සඳහා, බැහැර දීම් සහ විමසුම් පහසුකම් සපයා දීම, සාමාන්‍යයෙන් අවශ්‍ය වුවත්, විවිධ අවස්ථා අනුව මේවායේ සාපේක්ෂ වැදගත්කම සැලකිය යුතු පමණින් වෙනස් වනු ඇත." (මහජන පුස්තකාල සඳහා ඉෆ්ලා ප්‍රමිති 1973)

විශාල මධ්‍ය පුස්තකාලයේ සිට කුඩාම ජංගම පුස්තකාලය දක්වා වූ සෑම මහජන පුස්තකාලයකම ළමයින්ගේ සියලු වයස් මට්ටම්වලට හා හැකියාවන්ට සුදුසු ළමා පොත් එකතුවක් තිබිය යුතුය. එකතුවෙහි පොත් සංඛ්‍යාවත් ඒ සඳහා ඇති ඉඩ ප්‍රමාණයත් වෙනස් විය හැකි ය. එබැවින් ළමයින්ට සැපයෙන පුස්තකාල සේවාවන් ද අසමාන වන බව නොකිවමනාය.

ළමයින් සඳහා පමණක් ඉදි කරන ලද ශාඛා පුස්තකාල සෝවියට් දේශයේ දැකිය හැකි ය. ඒ ක්‍රමයෙහි ප්‍රයෝජන කීපයක් ඇත.. ළමයින් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටින කවර ප්‍රදේශයක වුවද එවැනි පුස්තකාල පිහිටුවිය හැකිය. විශාල ජනගහනයක් සහිත නාගරික ප්‍රදේශවල විශාල ළමා පුස්තකාල සුළු සංඛ්‍යාවක් පිහිටුවීම වෙනුවට ළමයින්ට පහසුවෙන් යා හැකි කුඩා ළමා පුස්තකාල විශාල සංඛ්‍යාවක් පිහිටුවීම ප්‍රයෝජනවත් වේ. විශාල පුස්තකාල සුළු සංඛ්‍යාවක් පවතින විට ළමයින්ට පුස්තකාලවලට යාමට සිදු වන්නේ වැඩිහිටියන් සමඟය. කෙසේ වුවත් ළමයින් සඳහා වෙනම පුස්තකාල පිහිටුවීම අවසිදායක බව බොහෝ රටවලට පෙනී ගොස් ඇත. කාර්ය මණ්ඩල හා තොග පිළිබඳව සලකන විට එය අරපිරිමැසුම්දායක නොවේ. ළමා විය ඉක්මවන විට ළමා පුස්තකාලයේ සිට වැඩිහිටි පුස්තකාලයට මාරුවීම ද මේ නිසා සමහර ළමයින්ට වඩා අසීරු කාර්යයක් වේ. එම නිසා මෙම ක්‍රමය අධ්‍යාපනික වශයෙන් ද යෝග්‍ය නොවේ. සෝවියට් දේශය හැරුණු විට වෙන ම ළමා පුස්තකාල ඉදි කර ඇති වෙනත්

සමහර රටවල් එසේ කර ඇත්තේ ප්‍රාදේශීය වශයෙන් පවතින හේතූන් නිසා ය. වැඩිහිටි පුස්තකාලවල ළමා අංශ සඳහා ඉඩ පහසුකම් නොමැති වීම සහ ජනගහන රටාවේ වෙනස්වීම් වැනි හේතූන් වෙනම පුස්තකාල ගොඩනැගිලි භාවිතය කෙරෙහි බලපා ඇත.

ජනප්‍රිය වෙමින් පවතින වෙනත් පුස්තකාල වර්ගයක් ලෙස ද්විත්ව අරමුණු සහිත ප්‍රජා පුස්තකාල (dual purpose community libraries) හැඳින්විය හැකිය. මෙම පුස්තකාල පාසල්වල පිහිටුවා ඇති අතර ඒවායින් පාසලට පමණක් නො ව මුළු ප්‍රජාවටම සේවාවන් සැපයේ. මේ සඳහා සාමාන්‍යයෙන් ද්විතීයික පාසලක ගොඩනැඟිල්ලක් යොදාගත හැකිය. ප්‍රජාවට මහජන පුස්තකාලයක් නොමැති නැතහොත් සතියකට වරක් පැමිණෙන ජංගම පුස්තකාල සේවයක් ඇති, විශාල පිටිසර ගමකට නැති නම් නාගරික නිවාස යෝජනා ක්‍රමයකට මේ පුස්තකාල වර්ගය විශේෂයෙන්ම කදිමයි. මේ ආකාරයේ පුස්තකාලයක් සඳහා තෝරා ගන්නා ස්ථානය පාසල් හා මහජන යන පුස්තකාල දෙ වර්ගයේම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය විය යුතුය. සේවාවන් දෙකක් එක් ස්ථානයක් මගින් ලබාදීම නිසා කාර්ය මණ්ඩල සහ තොග ප්‍රමාණ අඩු කර ගැනීමේ මාර්ගයක් ලෙස මෙම ක්‍රමය සැලකිය යුතු නැත. සමස්තයක් වශයෙන් සලකන විට මෙම ක්‍රමය ළමයින්ට ප්‍රයෝජනවත් වේ. එහෙත් පාසල් යාමට මැලි නමුත් මහජන පුස්තකාල කෙරෙහි කැමැත්තක් දක්වන ළමයින් සුළු පිරිසකට මෙය ගැටලුවක්ද විය හැකි ය.

කෙසේ වෙතත් ළමයින් වැඩි ප්‍රමාණයකට පුස්තකාල සේවාවක් ලැබෙන්නේ මුළු ප්‍රජාවටම සේවා සපයන ඒක අරමුණු පුස්තකාල (single purpose library) මගිනි. මුල් අවධියේ පැවති ළමා පුස්තකාලවල දකිය හැකි වූ කුඩා කවුන්ටර හා මේස පුටු සහිත වෙන ම ළමා කාමර, දැන් ක්‍රමයෙන් නැති වෙමින් පවතී. බොහෝ පුස්තකාල මගින් ළමයින්ට මෙන්ම වැඩිහිටියන්ට ද පූර්ණ සේවාවක් ලැබේ. එබඳු පුස්තකාලවල ළමයින් සඳහා සුදුසු අන්දමකින් පොත් රාක්ක ආදිය පිළියෙල කර තැබිය හැකි ය. මේ ආකාරයේ පුස්තකාල අධීක්ෂණය කිරීම පහසු වන අතර

වැඩිහිටි පුස්තකාලයෙන් ළමා පුස්තකාලයට මාරු වීම පහසුවෙන් කළ හැකිවේ. යම් යම් විෂයයන් පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන ළමයින්ට අවශ්‍ය අවස්ථාවල දී වැඩිහිටි අංශයේ පොත් ද ඉතා පහසුවෙන් පරිහරණය කළ හැකි වේ. එමෙන්ම ළමා විය ඉක්මවන විට ළමයින්ට වැඩිහිටි පුස්තකාලයට මාරු වීම ද ඉතා පහසුවෙන් කළ හැකිවේ.

ළමයින් සම්බන්ධයෙන් සලකන විට මේ අකාරයේ පුස්තකාලවල ඇති ප්‍රධානම ගැටලුව නම් ළමා අංශයේ නිශ්ශබ්දතාව පාලනය කිරීමට සිදුවීම යි. අලුත් පුස්තකාල බොහොමයක් සැලසුම් කර ඇත්තේ එකී නම්‍ය ස්වරූපයෙනි. එසේවුවත් සේවාව සැපයෙන ජනගහනයේ ප්‍රමාණය හෝ ස්ථානයේ ඇති යම් භෞතික අවශ්‍යතා නිසා සමහර පුස්තකාල සඳහා වෙනම ළමා කාමරයක් අවශ්‍ය විය හැකිය.

ළමා පුස්තකාල සේවාවන් සඳහා ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී ආරක්ෂාව හා අධීක්ෂණය යන කරුණු සැලකිල්ලට ගත යුතුය. එක් කෙනෙකුට හෝ දෙදෙනකුට හෝ වැඩි ළමයින් සංඛ්‍යාවක් සිටින සෑම අවස්ථාවක ම ළමා අංශය අධීක්ෂණය කිරීමට හැකි විය යුතු ය. බොහෝ පුස්තකාලවල ළමා පොත් ගැලරියක ප්‍රදර්ශනය කරනු ලබයි. එහෙත් එය ආරක්ෂා සහිත නොවේ. හැසිරීම ඉතා හොඳ ළමයින් පවා විවෘත තරප්පු පේළිවලත් බැල්කනිවලත් දුවන්නට පනින්නට පුළුවන. එමෙන්ම පහත මාලවල සිටින කාර්ය මණ්ඩලය ද, ළමයින් ආරක්ෂා සහිතව සිටිතියි යන වැරදි නිගමනයෙහි සිටීමට පුළුවන. ළමයින් කඩිසර බැවින් තරප්පු පේළිවල යන්නට ඔවුන් සාමාන්‍යයෙන් අධෛර්යවත් නොවන නිසා ළමා අංශය ඉහළ මාලයක පිහිටුවීම වඩා යෝග්‍ය බව පෙනී යාමට පුළුවන. එහෙත් ගර්භණී මව්වරුන්ට හා කිරි මව්වරුන්ට එය ආරක්ෂා සහිත නොවීමට පුළුවන.

ළමා පුස්තකාලයට පිටින් කෙළින්ම ඇතුළු විය හැකි ආකාරයට වෙනම දොරටුවක් සහිතව සමහර පුස්තකාල සැලසුම් කරනු ලැබී ය. මේ අකාරයට පුස්තකාලය සැලසුම් කිරීමෙන්

බලාපොරොත්තු වූයේ ආරක්ෂාව ඇති කිරීම වුවත් එය සාර්ථක වී ඇත්තේ කලාතුරකිනි. ළමා පුස්තකාලයට කෙළින් ම ඇතුළු වීමට දොරටුවක් ඇතිවිට දී වුවද පුස්තකාල ගොඩනැගිල්ලේ ප්‍රධාන කොටස භාවිත කිරීමට ළමා පුස්තකාලයට පැමිණෙන මහජනයාට මෙන්ම කාර්ය මණ්ඩලයට ද ඉඩ සලසා දිය යුතුය. පොත් නිකුත් කිරීම සඳහා ළමා හා වැඩිහිටි යන කොටස් දෙකටම එකම කවුන්ටරයක් යොදා ගන්නා විට පරිගණක යන්ත්‍රයක් යොදා ගැනීමෙන් ඉක්මනින් සේවා සැපයිය හැකිය. එසේවුවත් මේ ආකාරයේ යාන්ත්‍රික ක්‍රම යොදා ගැනීම නිසා පොත් නිකුත් කිරීමේ දී හා ආපසු භාර දීමේ දී ළමයින් හා පුස්තකාලයාධිපති අතර ඇති වන සම්බන්ධතාව හීන වී යාමට පුළුවන. එහෙත් කාලය සම්බන්ධයෙන් සලකන විට, එය වඩාත්ම යෝග්‍ය ක්‍රමය වේ. ළමයින් යම් යම් ක්‍රියාකාරකම් සඳහා දීර්ඝවේලාවක් පුස්තකාලයේ ගත කරන්නේ නම්, ඔවුන්ගේ ඇඳුම්, ගමන් මලු ආදිය තබා ගැනීම සඳහා වෙනම කාමරයක්, ළමා කාමරයට යාබදව ලබාදීම ප්‍රයෝජනවත් වේ. එමෙන්ම වැසිකිළි පහසුකම් ආදිය සපයා දීමෙන් බොහෝ ගැටලු මග හරවා ගත හැකි ය. එනමුත් එවැනි දේ ඉක්මනින් අපවිත්‍ර කිරීමට හා අලාභහානි වීමට භාජන වන නිසා එවැනි පහසුකම් සැපයීමට මහජන පුස්තකාල කැමැත්තක් නොදක්වයි. පුස්තකාලයේ ළමා අංශයට යාබද ව කුඩා ප්‍රමාණයේ හෝ ගබඩා කාමරයක් තිබීම, පුස්තකාලය පිරිසිදුව තබා ගැනීමට බෙහෙවින් උපකාරී වේ.

පුස්තකාලයේ ළමයින්ට සේවා සලසන කොටස සැලසුම් කිරීමේ දී සාධක කීපයක් සැලකිල්ලට ගත යුතුය. දවසේ ඇතැම් වේලාවන්හි දී ළමයින් විශාල සංඛ්‍යාවක් ළමා අංශයට පැමිණීමට ඉඩ තිබේ. පාසල් අවසන් වන වේලාවලද ළමයින් විශාල සංඛ්‍යාවක් පුස්තකාලයට පැමිණීමට පුළුවන. පුස්තකාලය පාසලක් අසල පිහිටා තිබේ නම්, දිවා විවේක වේලාවේ දී ඔවුන් පුස්තකාලයට පැමිණීමට පුළුවන. පොත් ප්‍රදර්ශනය කිරීමට, පාඨකයන්ට ඔබ මොබ යෑමට, අවිධිමත් කියවීමට, පාඩම් කිරීමට හා පුස්තකාල කටයුතු වලට ඉඩ පහසුකම් අවශ්‍ය වේ. විවිධ අවශ්‍යතාවන් අනුව ඉඩ ප්‍රමාණය විවිධ ආකාරයෙන් භාවිත කිරීමට ඉඩ ප්‍රස්තා තිබීම ඉතා වැදගත් වේ.

1973 වර්ෂයේ දී, පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IFLA) ප්‍රමිති සකස් කිරීමේ දී මෙම කරුණු සැලකිල්ලට ගෙන ඇත.

එම ප්‍රමිතීන්ට අනුව විවෘත රාක්කවල ඇති සෑම පොත් දහසක් සඳහාම වර්ග මීටර් පහළොවක (වර්ග අඩි 161) ඉඩ ප්‍රමාණය තිබිය යුතු ය. මෙම ඉඩ ප්‍රමාණය නිර්දේශ කර ඇත්තේ පුස්තකාල පොත් ගබඩා කිරීම, පාඨකයන්ට ඔබ මොබ යෑම, කවුන්ටරය හා සූචි කැබිනෙට්ටු තබා ගැනීම, නිදල්ලේ අසුන් ගැනීම, සහ ප්‍රදර්ශන භාණ්ඩ තබා ගැනීම සඳහා තරමක ඉඩ ප්‍රමාණයක් යන සියලුම කටයුතු සඳහා ය. මේ අනුව පාඨක ජනගහනය 10,000ක් සඳහා වර්ග මීටර හැත්තෑ පහේ සිට සියය දක්වා ඉඩ ප්‍රමාණයක් (වර්ග අඩි 807 සිට 1076 දක්වා ප්‍රමාණයක්) තිබිය යුතුය. පාඨකයන් 10,000 සිට 20,000 දක්වා සේවා සපයන පුස්තකාලයක ඉඩ ප්‍රමාණය වර්ග මීටර සියය සිටඑකසිය පනහ දක්වා (වර්ග අඩි 1076 සිට 1615 දක්වා) තිබිය යුතු ය. ප්‍රේක්ෂකයන් වශයෙන් සහභාගි වන ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා එක් අයකුට වර්ග මීටර 1.5 බැගින් වෙන් කළ ස්ථානයක් තිබිය යුතු බව පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ (IFLA) ප්‍රමිතීන් පෙන්වා දෙයි. එම කාමරය ශිල්පීය වැඩ සඳහා සැලසුම් කරන්නේ නම්, එක් අයකු සඳහා වර්ග මීටර තුන බැගින් වෙන් කළ යුතුය. කවර ක්‍රියාකාරකම් සඳහා වුවද අඩු වශයෙන් ස්ථාන 30ක් සඳහා වත් ඉඩ පහසුකම් සැලසිය යුතු ය.

නවීන පුස්තකාල සැලසුම් කිරීමේ දී ළමයින් සඳහා ඉඩ පහසුකම් ඉතා හොඳින් සැලසේ. ළමයින්ට අපහසු නොවන පරිදි පොත් රාක්ක ප්‍රමාණවත් උස ප්‍රමාණයකින් යුක්තව සකස් කෙරේ. එවන් පොත් රාක්කයක උස ප්‍රමාණය මීටර් එකහමාරකට (අඩි පහයි අඟල් දෙකකට) වඩා වැඩි නොවිය යුතුය. පින්තූර පොත් සඳහා විශේෂ ප්‍රදර්ශන රාක්ක සැපයිය යුතු අතර පොත් නොවන පුස්තකාල ද්‍රව්‍ය සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද ඒකක සැපයිය යුතු ය. තුනී, පැතලි පුස්තකාල ද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ප්‍රමාණවත් උසකින් යුත් පෙට්ටි ලබාදීම වඩා ප්‍රයෝජනවත් වේ. මේස සහ පුටු ලබා දීමේ දී පුස්තකාලයේ

වැඩිහිටි පාඨකයින් සඳහා සැපයෙන ආසන ආදියෙන් වැඩි ප්‍රමාණයක් ළමයින් සඳහා සුදුසු වේ. කෙසේ වුවත් කුඩා ළමයින් සඳහා කුඩා මේස පුටු ලබා දිය යුතු ය. ඉඩ ප්‍රමාණවත් අයුරින් තිබේ නම්, ළමයින්ට වාඩි වී හෝ හාන්සි වී හෝ සිටිය හැකි ආකාරයේ පුටු ආදිය සැපයිය හැකි ය.

බිත්තියේ එල්ලන, අගුළු දැමිය හැකි ප්‍රදර්ශන පුවරු මගින් පින්තූර හෝ ත්‍රිමාන භාණ්ඩ ළමයිගෙන් හානියක් නොවන අයුරින් ප්‍රදර්ශනය කළ හැකිය. පුස්තකාලයේ ළමයින් ගැවසෙන ප්‍රදේශයේ බිම් ඇතිරිලි යෙදීමෙන් ළමයින් ඇවිදින විට ඇති වන ශබ්දය අඩු කර ගත හැකි අතර ඒ මත වාඩි වීමට ද ඔවුන්ට පහසු වනු ඇත. ශාරීරික ආබාධිත ළමයින් සඳහා ද සේවා සැපයීම එක් වගකීමකි. ඔවුන් සඳහා ඉඩ පහසුකම් සැපයිය හැකි නම් ඔවුන් නිතර පුස්තකාලයට පැමිණෙනු ඇත.

ඉතා කුඩා ළමයින් සඳහා පොත් බැහැර දෙන අංශයේ දී විශේෂ පහසුකම් සැපයිය යුතු ය. නව යොවුන් වියේ පසුවන ළමයින් සඳහා සේවා සැපයීම ළමා පොත් බැහැර දෙන අංශයේ හෝ වැඩිහිටියන් සඳහා බැහැර දෙන අංශයේ කොටසක හෝ කළ හැකිය. ළමා පුස්තකාලයාධිපති සඳහා ද තැනක් සලසා දිය යුතුය. පොත් බැහැර දෙන අංශයේ දී තම උවමනාවෙන්ම කියවීමට බොහෝ ළමයි කැමැත්තක් දක්වති. ඒ සඳහා ඉඩ පහසුකම් ලබා දීම වැදගත්ය. වැඩි ඉඩ පහසුකම් හා නිශ්ශබ්දතාව අවශ්‍ය වන ළමයින් වැඩිහිටි විමර්ශන පුස්තකාලය භාවිත කිරීම සඳහා දිරි ගැන්විය හැකිය.

1960 ගණන්වල 1970 මුල් කාලයේ දී බ්‍රිතාන්‍යයේ සැලසුම් කළ සමහර පුස්තකාලවල පාසලේ දී ළමයින්ට පැවරෙන ගෙදර වැඩ කිරීම සඳහා ළමා අංශයට යාබදව විශේෂ කාමර සපයා තිබුණි. එහෙත් බොහෝ පුස්තකාලවල එසේ ඉඩ ප්‍රමාණ වෙන් කිරීම නාස්තියක් සේ සලකන ලදී. දැන් එම කාමර බොහෝවිට සම්පූර්ණයෙන්ම පුස්තකාල කටයුතු සඳහා යොදා ගනු ලැබේ. කෙසේ වුවත් සාමාන්‍ය සේවා සඳහා පුස්තකාලය විවෘත ඇති විට, ක්‍රියාශීලී ක්‍රියාකාරකම් සඳහා අමතර කාමරයක් අවශ්‍ය වේ.

කාමර දොර ජනෙල් සහිත වූ ද ශබ්දරෝධක වූ ද හොඳින් වාතාශ්‍රය සහිත වූ ද තැනක් විය යුතු ය. හැමදෙනාගේම යහපත සඳහා ක්‍රියාකාරකම් කාමර සැලසුම් කිරීමේ දී ඒවා තුළ ඉටු කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් පිළිබඳව කල්පනා කළ යුතුය. පාසල්වලින් ළමයින් කණ්ඩායම් පැමිණීම, කථා පැය හා පොත් සම්බන්ධ අනෙකුත් කටයුතු මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් විය හැකිය. මෙම ක්‍රියාකාරකම් පාසල් කාලය තුළ හා ඉන් පසුව මෙන් ම නිවාඩු දිනවල දී ද කළ හැකි ය. ශිල්පීය කටයුතු ද අත්‍යවශ්‍ය යැයි හැඟෙන්නේ නම් ඒ සඳහා ද ඉඩ පහසුකම් ලබා දිය හැකිය. රංගන හා චිත්‍රපට දර්ශන සඳහා පහසුකම් සෑම පුස්තකාලයකින් ම සැපයිය නොහැකි ය.

පවතින ඉඩ ප්‍රමාණයන් අනුව ක්‍රියාකාරකම් සැලසුම් කර ගත යුතුය. ප්‍රාදේශීය ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා සමහර පුස්තකාලවල රැස්වීම් කාමරයක් සපයා දිය හැකිය. එමෙන් ම එම කාමරය වැඩිහිටියන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා නොගන්නා අවස්ථාවල දී ළමයින්ගේ කටයුතු සඳහා යොදා ගත හැකිය. මෙම දෙකොටසෙහිම අවශ්‍යතා සැලකිල්ලට ගෙන, භාණ්ඩ සැපයීමත් කාමරය අලංකාර කිරීමත් කළ හැකිය. විශාල හා මධ්‍යම පුස්තකාලවල නම් කථාපැය සඳහා විශේෂ කාමර සැපයිය හැකිය.

ළමා පුස්තකාලයේ පරිපාලන කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් ළමා පුස්තකාලයාධිපති විසින් සිදුකරන්නේ නම්, ඒ සඳහා වෙනම කාර්යාලයක් තිබිය යුතුය. කෙසේවුවත් එවන් අවශ්‍යතාවක් මතු වන්නේ, ළමයින් සහ යෞවනයන් සඳහා සේවා භාරව ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරයකු සිටින අවස්ථාවල දී ය. මධ්‍යම හෝ ප්‍රාදේශීය පුස්තකාලවල ළමා පොත් සඳහා ඉඩ ප්‍රමාණ ද, විශේෂ එකතුන් ගබඩා කිරීම හා ප්‍රදර්ශන පැවැත්වීම සඳහා ඉඩ ප්‍රමාණ ද තිබිය යුතුය. කුඩා ප්‍රජාවල හුදකලාව ජීවත් වන ළමයින් සඳහා සියලු පහසුකම් සහිත දුර පිහිටි පුස්තකාලයකට වඩා අඩු පහසුකම් සහිත ආසන්නව පිහිටි

පුස්තකාලය වඩා ප්‍රයෝජනවත් වේ. ලබාදිය යුතු සේවාවල ස්වභාව ඒ ඒ ප්‍රජාවේ ප්‍රමාණය හා ස්වභාව අනුව තීරණය කළ යුතුය. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන, විශේෂයෙන් පෙර පාසල් යන වයසේ ළමයින්ට සංස්කෘතිකමය වශයෙන් ලැබෙන වරප්‍රසාද අඩුය. ජංගම පුස්තකාල සේවා මඟින් පෙර පාසල් ළමයින්ට සේවාවක් ලබාදිය හැකි අතර දෙමාපියන්ට ද තම දරුවන්ගේ කියවීම් කටයුතුවලට සම්බන්ධ වීමට එමගින් අවස්ථා ද සැලසේ.

### තුන්වන පරිච්ඡේදය

# ළමා පුස්තකාලයක එදිනෙදා කටයුතු

"මහජන පුස්තකාලයක අරමුණු ඉටුවීමට නම් ඊට පහසුවෙන් ප්‍රවේශ විය හැකි විය යුතු අතර ජන වර්ග, වර්ණ, ජාති, වයස්, ලිංග, ආගම්, භාෂා, තරාතිරම්, අධ්‍යාපනික සුදුසුකම් ආදිය කුමක් හෝ වේවා ප්‍රජාවක සියලුම සාමාජිකයන් හට එකසේ නිදහස්ව භාවිත කිරීම පිණිස පුස්තකාල දොර විවෘත විය යුතු ය." (යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රතිපත්ති ප්‍රකාශනය

ළමයින්ට සේවා සැපයීමේ දී එදිනෙදා පරිපාලන හා සංවිධාන කටයුතු පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්විය යුතුය. එය ඕනෑම පුස්තකාලයක කාර්යක්ෂමතාව කෙරෙහි බලපායි. ළමයින්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා එහි කවර වෙනස්කම් කළ යුතුද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය.

## පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම

සාමාජිකත්වය ලබාදීමේ අවම වයස් මට්ටම පිළිබඳව වර්තමානයේ බොහෝ ළමා පුස්තකාලවල ඇත්තේ නම්‍ය ආකල්පයකි. වයස කුමක් වුවත් දෙමාපියන් විසින් පුස්තකාලයට රැගෙන එන ළමයින්ට සාමාජිකත්වය ලබා ගැනීමට ඉඩ දෙනු ලබන අතර ඔවුන් සඳහා පාඨක බලපත්‍රයක් ද නිකුත් කරනු ලැබේ. ළමයින් යම් කිසි වයස් මට්ටමකට ළඟා වන තුරු එනම් පාසල් යන අවධිය වන තුරු හෝ කියවීමට හැකියාව ලැබෙන තුරු හෝ සමහර පුස්තකාල දෙමාපියන්ට ද පාඨක බලපත්‍ර නිකුත් කරනු ලැබේ. මේ ආකාරයේ නම්‍යතා නිසා සමහර විට පොත් සැපයීම පිළිබඳ ගැටලුවලට ද මුහුණ දීමට සිදු වේ.

ළමයින් විසින් වැඩිහිටි පොත් භාවිත කිරීම ආරම්භ කළ යුතු වයස් මට්ටම පිළිබඳව ද වර්තමානයේ පුස්තකාල විසින් නම්‍ය ආකල්පයක් දරන බව පෙනේ. වැඩිහිටියන් සඳහා සම්පාදනය කර ඇති තොරතුරු සැපයෙන බොහෝ පොත්වල

පින්තූර සහිතව සරල ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කර ඇති හෙයින් වයස අවුරුදු අට හෝ නවය තරම් වයසැති වුත් කියවීමේ හැකියාව ඇති වුත් ළමයින් සඳහා ඒවා සුදුසු වේ. අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවක වැඩිහිටි පොත් එකතුවෙන් පොත් ලබා ගැනීමට ළමයින් දිරිමත් කළ යුතු ය. බොහෝ පුස්තකාලවල මේ ආකාරයේ නම්‍යතාවක් දැකිය හැකි ය.

ප්‍රබන්ධ සම්බන්ධයෙන් ඇති ගැටලුව මීට වඩා සංකීර්ණ වේ. වයස අවුරුදු දොළහක හෝ දහ තුනක ළමයකුට වැඩිහිටි පොත් අතරින් තමන්ට රස විඳිය හැකි යමක් සොයා ගැනීම දුෂ්කර විය හැකිය. එමෙන්ම කියවීමට ඉතා අමාරු පොත් පුස්තකාලයෙන් ලබා ගැනීමට ඉඩ තිබේ. එසේවුවහොත් සිදු වන හානිය නම් ළමයා නැවත පොත් ලබා ගැනීමට ඉදිරිපත් නොවීමයි. එමනිසා වැඩිහිටි එකතුවෙන් පොත් ලබා ගැනීම සඳහා වයස් සීමාවක් නියම කිරීම යෝග්‍ය වේ. ඒ සඳහා වයස අවුරුදු දාහතර වඩාත් යෝග්‍ය වේ. අවුරුදු දාහතරට අඩු ළමයින්ට වෙනස් වර්ණයකින් යුත් පාඨක බල පත්‍රයක් නිකුත් කිරීමෙන් කාර්ය මණ්ඩලයට ඒ පිළිබඳව පරීක්ෂා කර බැලීම පහසු වනු ඇත.

ඕනෑම ළමයකුට පුස්තකාල සාමාජිකත්වය දීමේ දී සාමාන්‍යයෙන් වැඩිහිටි ඇපකරුවෙක් අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් මෙම ඇපකරු මව පියා හෝ භාරකරු වේ. එසේනැතිනම් ගුරුවරයකුගේ අත්සන වුවද පිළිගත යුතුය. කෙසේවුවත් පාසල් හැර යන වයස පමණ වන තුරු, ළමයින් සඳහා ඇප කරුවෙක් අවශ්‍ය වේ. ප්‍රථම වරට පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගන්නාවුත් වයස අවුරුදු පහළොවක් වන්නා වූත් ළමයින් සම්බන්ධයෙන් නම්‍ය ආකල්පයක් දැක්විය හැකිය. ඇපකරුවකුගේ අවශ්‍යතාව දැක්වූ විට ඔවුන් සමහර විට දුර්මුඛ වීමට පුළුවන.

## නිකුත් කළ යුතු පාඨක බලපත්‍ර සංඛ්‍යාව

පොත් නිකුත් කිරීමේ සමහර නවීන යාන්ත්‍රික ක්‍රම නිසා එක් වරකට පුද්ගලයකුට ලබා ගත හැකි පොත් සංඛ්‍යාව පාලනය කිරීම අසීරු වී තිබේ. කෙසේවුවත් එක් අවස්ථාවක දී එක්

බලපත්‍රයකට නිකුත් කරන පොත් ප්‍රමාණය නියම කළ හැකි ය. වැඩිහිටි අයට ලබාදෙන සංඛ්‍යාවට අඩු පොත් සංඛ්‍යාවක් ළමයින්ට නිකුත් කිරීම යෝග්‍ය වේ. පුස්තකාලයට ආසන්නව පදිංචි ළමයින් සඳහා වරකට පොත් දෙකක් හෝ තුනක් හෝ නිකුත් කිරීම යෝග්‍ය වේ. පොත් ඉක්මනින් කියවන අයට ඒවා ඉක්මනින් මාරු කර ගතහැකි වනු ඇත. පුස්තකාලයට දුරින් පදිංචි ව සිටින ළමයින්ටත්, දුහග ළමයින්ටත්, ආබාධිත ළමයින්ටත් වෙනස් ආකාරයකින් කටයුතු කිරීම වැදගත් වේ.

**දඩ අය කිරීම.**

නිකුත් කරනු ලබන පොත් සංඛ්‍යාවේ සීමාවක් තිබිය යුතුවාක් මෙන්ම ඒවා තබා ගත හැකි නිශ්චිත කාල පරිච්ඡේදයක් ද තිබිය යුතුය. සෑම පාඨකයකුටම පොත් තබා ගත හැකි නිශ්චිත කාල පරිච්ඡේදයක් නියම කිරීම පරිපාලනමය වශයෙන් පහසු වේ. කෙසේවුවත් කියවා අවසන් වූ වහාම පොත් ආපසු භාර දීමට ළමයින් දිරිමත් කළ යුතුය. බොහෝ අය සිතන්නේ පොත් ආපසු භාර දීම සඳහා අවසාන දිනය දක්වාම සිටිය යුතු බවයි.

පොත් භාර දීමේ දිනය ඉක්මවා තබා ගැනීම වෙනුවෙන් දඩ අය කිරීමෙන් ලැබෙන්නේ අඩු ප්‍රයෝජනයකි. පුස්තකාලයෙන් විශාල වශයෙන් ප්‍රයෝජන ගන්නා ළමයින්ගෙන් දඩ අය කිරීමෙන් ඔවුන්ගේ උනන්දුව හීන විය හැකිය. කෙසේවුවත් නියමිත කාලය ඉක්මවා තබා ගත් පොත් ආපසු භාර දෙන අවස්ථාවල දී ඒ පිළිබඳව කරුණු පෙන්වා දීමට කාර්ය මණ්ඩලය කටයුතු කළ යුතුය. පොත් නියමිත කාලය ඉක්මවා තබා ගන්නා විට ඒ පිළිබඳව දෙමාපියන්ට හෝ භාරකරුට හෝ දැනුම් දීමක් කර පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ නැතිනම් පාසල වෙත දැනුම්දීමක් කළ හැකිය. හානි වූ හෝ නැති වූ පොත් සඳහා අය කිරීමක් කළ යුතුය.

පුස්තකාලයේ නීතිරීති පිළිබඳව ළමයින්ට දැනුම් දීමේ පහසු ම වේලාව ඔවුන් පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගන්නා අවස්ථාවයි. ළමයින්ගේ රුචි-අරුචිකම් හා ප්‍රජාවේ අනෙකුත්

අයගේ රුචි-අරුචිකම් පිළිබඳව පුස්තකාලයාධිපතිට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. එම අංශ දෙක අතර සමබරතාවක් පවත්වා ගෙන යාම පුස්තකාලයාධිපතිගේ වගකීම වේ. කෙසේ වුවත් හැකි තාක් දුරට ළමයින්ගේ රුචි-අරුචිකම් කෙරෙහි ප්‍රමුඛත්වයක් දීමට පුස්තකාලයාධිපති උත්සාහ කළ යුතුය. මහජන මුදල් වියදම් කරන්නකු වශයෙන් ප්‍රජාව කෙරෙහි වගකීමක් පුස්තකාලයාධිපති සතුවේ.

## පොත් කලින් වෙන් කිරීම

ළමයින් සඳහා පුස්තකාලයේ පොත්පත් කලින් වෙන් කිරීමේ දී වැඩිහිටි අය සම්බන්ධයෙන් මුහුණ පාන ප්‍රශ්නවලට මුහුණ දීමට පුස්තකාලයාධිපතිට සිදුවේ. මෙසේ වෙන් කර තබනු ලබන පොත් විවිධාකාරයේ ඒවා විය හැකිය. එවන් පොත්, තොරතුරු ලබාදීම සඳහා විශේෂිත මාතෘකාවක් යටතේ ලිවූවක් විය හැකිය. එසේ නැති නම් චිත්‍රපට ගත කර ඇති කථා පොතක් විය හැකිය. පුස්තකාලය සඳහා පොත් තෝරා ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වන්නේ නම් හා පුස්තකාලය සතු සැලකිය යුතු පොත් එකතුවක් තිබේ නම් ළමයින්ගේ පාඨක අවශ්‍යතා ඉක්මනින් සපුරා ලිය හැකිය. පුස්තකාලය බුද්ධිමත් ලෙස පාවිච්චි කිරීමට ළමයින්ට ඉගැන්වීම හොඳ ක්‍රියාවකි.

පුස්තකාලය සඳහා පොත් තෝරා ගැනීමේ අරමුණ විය යුත්තේ ළමයින්ගේ අවශ්‍යතා ක්ෂණිකව ඉටු කළ හැකි එකතුවක් ගොඩනැගීමයි. පොත් කලින් වෙන් කර තැබීමේ සේවය වෙනුවෙන් ගාස්තුවක් අය නොකළ යුතුය. පොත් කලින් වෙන් කර තැබීමේ දී සාමාජිකයන්ගේ අවංක ඉල්ලීම් හා වෙනත් විකල්ප මාර්ගයකින් පහසුවෙන් ලබා ගත හැකි පොත් සඳහා කෙරෙන ඉල්ලීම් අතර වෙනස හඳුනාගෙන කටයුතු කිරීමට කාර්ය මණ්ඩලය උනන්දු කළ යුතුය.

## පුස්තකාලය විවෘතව තබන වේලාවන්

විවෘත ~~සැලසුම් පුස්තකාලයක් විවෘතව තබන සෑම~~ අවස්ථාවකම ළමා [redacted] තැබිය යුතුය. කෙසේ වුවත් ළමයින් සඳහා වෙනම පුස්තකාල කාමරයක් පවතින විට

පුස්තකාල ගොඩනැඟිල්ලේ අනෙක් අංශ විවෘතව තබන වේලාවලම ළමා අංශය ද විවෘතව තැබීම එතරම් ප්‍රයෝජනයක් නැත. සවස් වරුවේ ළමා පුස්තකාලය වසන වේලාව රඳා පවතින්නේ ප්‍රදේශයේ සමාජ හැසිරීම් රටාව අනුවයි. සවස හය දක්වා පමණ ළමා අංශය විවෘතව තැබිය යුතු ය. උදේ කාලයේ පවතින ප්‍රධාන ගැටලුව නම් පෙර පාසල් ළමයින් දෙමාපියන් සමඟ පුස්තකාලයට පැමිණීමයි. තම ළමයින් වෙනුවෙන් පොත් ලබා ගැනීමට දෙමාපියෝ කැමති වෙති. ළමයින් සඳහා වෙන ම පුස්තකාල කාමරයක් පවතින විට දිවා කාලයේ පාසල් ළමයින් හා පෙර පාසල් ළමයින් සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ද යෙදවිය යුතු ය. පොත් තේරීම හා අනෙකුත් කටයුතු සඳහා කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයකු යෙදවිය යුතුය.

## පුස්තකාලය තුළ හැසිරීම

පුස්තකාලය තුළ සම්මත හැසිරීම් රටාවක් පැවැත්වීම පුස්තකාලයාධිපතිගේ වගකීම වේ. පුස්තකාලයට පැමිණීමෙන් හා එහි පහසුකම් භාවිත කිරීමෙන් කිසිම ළමයකු වැළැක්විය යුතු නැත. එහෙත් කාර්ය මණ්ඩලයටත් විනීත පාඨකයන්ටත් අවිනීත හැසිරීම්වලින් පීඩාවක් ඇති විය යුතු නැත.

පිළිගත් ළමා චර්යා රටාව නිරීක්ෂණයකර අධ්‍යයනය කරන තුරු කාර්ය මණ්ඩලයේ නව නිලධාරීන්, ළමා අංශය භාර ව නොයෙදිය යුතුය. අසාධාරණ අයුරින් කරන සීමා කිරීම් නිසා වැරදි චර්යාවන් ඇති විය හැකි අතර, පුස්තකාල අරමුණු ඉටු කර ගැනීමට ද බාධා ඇති වේ. තත්ත්වයන් නරක අතට හැරීමට පෙර දැඩිව කටයුතු කිරීම අවශ්‍ය වේ. සීමා කිරීම් කළ යුත්තේ කවර අවස්ථාවල දී ද යන්න පුස්තකාලයාධිපති විසින් උගත යුත්තේ අත්දැකීමෙන් පමණි.

කථා පැය හෝ වෙනත් ක්‍රියාකාරකමක හෝ ළමයින් කණ්ඩායමක් යොදවනු ලබන අවස්ථාවක, එම ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර එම කණ්ඩායම පාලනය කර ගත යුතුය. එසේ පාලනය කිරීමට නොහැකි අවස්ථාවල දී යොදා ගැනීම

සඳහා (උදාහරණ වශයෙන් අසල පිහිටි පාසලක් අවසන් වීම නිසා ළමයින් විශාල සංඛ්‍යාවක් පුස්තකාලයට ඇතුළු වන අවස්ථාවක) යම් කිසි නීති රීති මාලාවක් හඳුන්වා දිය යුතුය. පිළිගත නොහැකි හැසිරීම්වල යෙදෙන ළමයින්ට අවවාද කළ යුතු ය. අවවාද නොතකන්නේ නම් පුස්තකාලයෙන් පිටතට යන ලෙස අණ කළ යුතුය.

## පුස්තකාලය තුළ උදව් කිරීම

පුස්තකාලය තුළ උදව් කරන්නන් වශයෙන් ළමයින් යොදා ගැනීමේ ක්‍රමයක් අතීතයේ දී සමහර පුස්තකාල අනුගමනය කළේ ය. මෙය හොඳ අදහසක් වන අතරම පාසල් පුස්තකාලයක් හොඳින් ගෙන යෑමට අත්‍යවශ්‍ය විය හැකි වුවත් මහජන පුස්තකාලවල නම් එසේ ස්වේච්ඡාවෙන් උදවු ලබා ගැනීම කළ යුත්තේ පරෙස්සම් සහිතවය. දින මුද්‍රා තැබීම, රාක්කවල පොත් සකස් කිරීම, පුස්තකාලය පිරිසිදු ව තබා ගැනීම වැනි කටයුතු සඳහා ළමයින් යොදා ගත හැකි ය. කෙසේ වුවත්, අනතුරුවලින් ළමයින් වළක්වා ගැනීම ප්‍රශ්නයක් විය හැකිය. ළමා ක්‍රියාකාරකම් වැඩසටහන් පුස්තකාලය විසින් පවත්වාගෙන යන විට සමහර ළමයි නායකත්ව ලක්ෂණ පෙන්නුම් කරති. ඇතැම් ළමයින් කෙරෙහි පුස්තකාලයාධිපතීන් විශේෂ සැලකිලි දක්වීමට ද ඉඩ තිබේ. ඒ කෙසේ වුවත්, පුස්තාලය තුළ ළමයින් සියලු දෙනාට ම සමාන ව සැලකිය යුතු අතර, ළමයින්ගේ බල පුළුවන්කමත් තරගයත් අවම මට්ටමින් පවත්වා ගත යුතුය. පාසල් පුස්තකාල භාවිතයෙන් ඇත් වූ ළමයින්ට විකල්පයක් ලෙස ළමා පුස්තකාල සේවාව යොදා ගත හැකි වනුයේ ඒ ආකාරයෙන් පමණි.

## පොත් එකතු සකස් කිරීම

හැකි තරම් දුරට වැඩිහිටි පුස්තකාලයේ පොත් එකතුව සකස් කර ඇති ආකාරයටම ළමා පුස්තකාලයේ පොත් එකතුව සකස් කිරීමද යෝග්‍ය වේ. බොහෝ අවස්ථාවල ප්‍රබන්ධ නොවන පොත් එකතුන් සඳහා ඩිවි දශම වර්ගීකරණය යොදා ගැනීම සුදුසු ය. මෙම වර්ගීකරණ ක්‍රමය පිළිබඳව ළමයින්ට ඉගැන්විය

හැකි ස්වර්ණමය අවස්ථා තිබේ. ළමයින් කණ්ඩායම් වශයෙන් පුස්තකාලය නැරඹීමට පැමිණෙන අවස්ථාවල විධිමත් ලෙස ද යම් කිසි මාතෘකාවක් පිළිබඳව පොතක් ඉල්ලා සිටින අවස්ථාවල අවිධිමත් ලෙස ද එය ඉගැන්විය හැකි ය. ඔවුන් පුස්තකාලයේ වැඩිහිටි පාඨකයන් බවට පත් වන විට ද එම දැනුම ප්‍රයෝජනවත් වේ. මෙහි දී අවශ්‍ය වන්නේ ඩිවි දශම වර්ගීකරණ ක්‍රමයේ සරල ස්වරූපයකි. දශම තිතෙන් පසු ඉලක්කම් තුනක් යොදා ගැනීමට සිදු වන්නේ ක්‍රීඩා සහ ඉංජිනේරු වැනි විෂයන් සුළු සංඛ්‍යාවක් සම්බන්ධයෙන් පමණි. පොත්, වර්ග කළ යුත්තේ ඒවා භාවිත කරන ආකාරය පිළිබඳව අවබෝධයකින් යුක්ත ව ය. ළමා පොත් හා වැඩිහිටි පොත් සඳහා පොදු සැකසුම් ක්‍රියාවලියක් අනුගමනය කළ ද ළමා පොත් වර්ගීකරණයේ දී ළමා පුස්තකාලයාධිපතිට එයට සම්බන්ධ විය හැකි ය. සමහර ළමා පොත්වල, වැඩිහිටි පොත්වලට වඩා වැඩි විෂය ක්ෂේත්‍රයක් ඇතුළත් වේ. ඊට හේතුව, ඒවා පාසල් ව්‍යාපෘති සඳහා යොදා ගැනීම පිණිස සැලසුම් කර තිබීම යි. උදාහරණ වශයෙන් ගින්දර පිළිබඳ ව ලියැවී ඇති පොතක, මිනිසා මුලින් ම ගින්දර නිපද වූයේ කෙසේ ද සහ ගිනි දෙවියන් ඇදහීම වැනි තොරතුරු ඇතුළත් වීම දක්විය හැකිය. ප්‍රධාන වශයෙන්ම ගින්දර පිළිබඳ ව්‍යාපෘතිවල නිරතව සිටින ළමයින්ට හා ගුරුවරුන්ට එවැනි පොත් අවශ්‍ය වන නිසා එවැනි පොත් සඳහා දිය යුතු වර්ගීකරණ අංකය පිළිබඳව තීරණයකට එළඹිය යුතුය. තව ද එම විෂයයට අවශ්‍ය විය හැකි සියලුම පොත් එක්තැන් කොට තැබිය යුතු ය. යම් කිසි පුළුල් විෂයයක් යටතේ පොත් වර්ග කිරීමෙන් ළමයින් ඒවා භාවිත කිරීමට දක්වන නැඹුරුව අඩු විය හැකිය. උදාහරණ වශයෙන් ආර්ථික විද්‍යාව යටතේ වර්ග කළ පොත් ළමයින් විසින් භාවිත කරනු ලබන්නේ ඔවුන්ට අවශ්‍ය යම් කිසි විශේෂිත කර්මාන්තයක් හෝ වෙළෙඳ භාණ්ඩයක් හෝ පිළිබඳ තොරතුරු දැන ගැනීමට පමණක් විය හැකිය. එබැවින් සරල විෂය සූචියක් මඟින් පොත් පිහිටි තැන් සොයා ගත හැකි වන පරිදි, හැකි තරම් පොත් ප්‍රමාණයක් වර්ග කළ යුතුය.

ප්‍රබන්ධ පොත් ඇහිරීමේ දී, ළමයින්ගේ මට්ටම අනුව පොත් සොයා ගැනීමට හැකි වන පරිදි ඒවා අහුරා තැබිය යුතුය. පින්තූර පොත් සාමාන්‍යයෙන් වෙනම අංශයක් ලෙස තැන්පත්

කෙරේ. එහෙත් එම පින්තූර පොත්, වැඩිහිටියන් විසින් ළමයින්ට ශබ්ද නඟා කියවීම සඳහා ඇති පොත් සහ ළමයින්ට තනි ව පහසුවෙන් කියවිය හැකි සරල වචන හා වාක්‍ය සහිත පොත් වශයෙන් වෙන් කිරීම සුදුසු වේ. බැලූ බැල්මට මේ පොත් වෙන් කර හඳුනා ගැනීමට අපහසු නිසා මුලින් ම පොත් අසුරන අවස්ථාවේ දී ඒ සඳහා යම් සලකුණක් යොදා ගැනීම යෙහෙකි.

කියවීමට ඉගෙන ගැනීමෙන් පසු විවිධාකාරයේ ළමා ප්‍රබන්ධවලට ළමයින් යොමු වීමට ඉඩ තිබේ. ඊට පෙර, ඔවුන්ට ඒ සඳහා සෑහෙන පෙර හුරුවක් අවශ්‍ය වේ. මේ නිසා, කුඩා ම පුස්තකාල හැර අනෙක් සියලු ම පුස්තකාලවල අවුරුදු පහේ සිට අට දක්වා වයසේ ළමයින් සඳහා වෙන ම පොත් එකතුවක් තිබීම අවශ්‍යය. ළමා ප්‍රබන්ධ 'වීර කථා', 'ඓතිහාසික කථා', 'සතුන් පිළිබඳ කථා' ආදී වශයෙන් වෙන් කිරීමේ පුරුද්ද බොහෝ පුස්තකාලවලින් දැන් තුරන්ව ගොස් ඇත. එවැනි ප්‍රභේදවලට වෙන් කිරීම අසීරු වන තරමට, නවීන ළමා ප්‍රබන්ධ වර්ධනය වී ඇත. එසේ පොත් වර්ග කිරීමෙන් ළමයින් කියවීමට පෙළඹීම අඩු වන බවට පවතින විශ්වාසය සත්‍ය නුවූවත්, එමගින් විශේෂිත පොතක නම ඉක්මනින් සොයා ගැනීමට නොහැකි වනු ඇත.

වයසින් වැඩි ළමයින් සඳහා පොත් ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රවණතාවක් මෑතක දී ඇති වී තිබෙන නිසා නවයොවුන් වියේ ළමයින් සඳහා විනෝදාත්මක කියවීම සඳහා වෙන්වූ අංශයක් සෑම පුස්තකාලයක ම තිබීම අවශ්‍ය ය. එසේ නොවුවහොත් බාල වියේ ළපැටියන් අතට එම පොත් පත් වනු ඇත. එම පොත් වැඩිහිටි අංශයට දැමුවහොත් ඒවායින් වැඩි ම වින්දනයක් ලබන අයට ඒවා නොලැබී යාමට පුළුවන. කියවීමේ හැකියාව දුර්වල ළමයින් සඳහා වෙනම පොත් එකතුවක් පිළියෙල කිරීම අපහසු ය. ඊට හේතුව, 'කියවීමේ හැකියාව දුර්වල ළමයින් සඳහා' යැයි නම් කිරීම ළමයින්ගේ මානසිකත්වයට සුදුසු නොවීම ය. එම නිසා ඒවා සුදුසු පරිදි නම් කළ යුතුය.

## පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය

ළමා පුස්තකාලයක ග්‍රන්ථ නාමාවලිය ප්‍රධාන වශයෙන් ම අවශ්‍ය වන්නේ ඉගැන්වීමේ උපක්‍රමයක් ලෙසයි. ජීවිතයේ අනෙක්

පොත් කිසිම වයසක දීට වඩා ළමා වයසේදී පුස්තකාල පොත් නාමාවලියක් භාවිත කිරීමට ඉගෙන ගැනීම පහසුය. පොත්වල වටිනාකම පිළිබඳ හැඟීමක් හා ඒවාට ආදරයක් ළමයින් තුළ ඇති කළ හොත් අවශ්‍ය වූ අවස්ථාවල පුස්තකාල නාමාවලිය භාවිත කිරීමටත් පොත් හා අනෙක් තොරතුරු මූලාශ්‍ර කාර්යක්ෂම ලෙස භාවිත කිරීමටත් ළමයින් ඉගෙන ගන්නා බව පෙනී ගොස් ඇත. ප්‍රාථමික පාසල් වයසේ පසුවන ළමයින් තුළ ඉගෙනීමට විශේෂ උනන්දුවක් තිබෙන බව සත්‍යයකි. විශේෂයෙන් වැඩිහිටියන්ගේ පාලනයෙන් නිදහස්ව ස්වාධීනවීමට අවශ්‍ය හැකියාක් ලබා ගැනීමට ඔවුහු විශේෂ උනන්දුවක් දක්වති. පසුකාලීන ජීවිතයේ දී ද ප්‍රයෝජනවත් වන එම දනුම ලබා ගැනීමට ඇති උනන්දුවට බාධා වන අයුරින් කටයුතු නොකළ යුතුය. ළමයින්ට අවශ්‍ය පොත් පත් සොයා ගැනීමට උදවු විය හැකි උපක්‍රම සපයා දීමෙන් ළමා පුස්තකාලය තුළ විධිමත් පුස්තකාල පොත් නාමාවලියක් සැපයීමට වැය කරන කාලයෙන්, වැඩි ප්‍රයෝජන ලැබෙන සේ යොදා ගත හැකි ය. වර්ගීකරණ ක්‍රමයක් සඳහා හොඳ විෂය සූචියක් ලබාදීම ප්‍රථමයෙන්ම කළ යුත්තකි. මෙය සරල පත්‍ර සූචියක් (card index) විය යුතුය. එහෙත් වැඩි ඉල්ලුමක් සහිත විෂයයන් සඳහා පිටපත් කරන ලද පත්‍රිකා ද ලබා දිය හැකිය. පුස්තකාලය ප්‍රයෝජනයට ගැනීම ඉගැන්වීමේ දී මෙම උපක්‍රම ප්‍රයෝජනවත් වේ.

විෂයය මාතෘකා කීපයක් පිළිබඳ පොත් කවි එකතු සහ චරිතාපදාන එකතු සඳහා විශ්ලේෂණාත්මකව පිළියෙල කරන ලද නාමාවලියක් ප්‍රයෝජනවත්වේ. කෙසේ වුවත් පුස්තකාලයේ ප්‍රමාණය අනුව එවැනි සූචියක් සම්පාදනය කිරීම සාධාරණ දැයි සිතා බැලිය යුතු ය.

ප්‍රබන්ධ පිළිබඳ ව සලකා බලන විට, කර්තෘ සූචියකට වඩා පොත් නාම සූචියක් ළමයින්ට වඩාත් ප්‍රයෝජනවත් වේ. ළමයින් වඩාත් උනන්දුවක් දක්වන්නේ රාක්කවලින් ඉක්මනින් ලබා ගත හැකි පොත්වලටය. සූචියේ වාර්තා ගත කර ඇති පොත් කෙරෙහි ඔවුන් එතරම් සැලකිල්ලක් නොදක්වති. පවතින පොත් එකතුව හා අවශ්‍යතා සැලකිල්ලට ගෙන සකස් කරන ලද සූචියක් සඳහා

කාලය වැය කිරීම ප්‍රයෝජනවත් ක්‍රියාවකි. විවිධ මාතෘකා සූචිගත කිරීම සඳහා යොදා ගනු ලබන පද ළමයින්ට තේරුම් ගත හැකිවුත් ඔවුන් භාවිත කරන්නා වූත් පද විය යුතු ය.

## පොත් එකතුන් සංකලනය කිරීම

වඩා කුඩා පුස්තකාලවල ළමා හා වැඩිහිටි පොත් එකතුන් සංකලනය කිරීමේ නැඹුරුවක් පවතී. සමහර ළමයින්ට, විශේෂයෙන් යම් මාතෘකාවක් කෙරෙහි තරමක් හොඳ උනන්දුවක් දක්වන ළමයින්ට, එසේ කිරීම ප්‍රයෝජනවත් විය හැකි යි. එමෙන් ම ළමා පුස්තකාලයේ සිට වැඩිහිටි පුස්තකාලයට ළමයින් මාරු වීමත් එමගින් පහසුවෙන් සිදු වෙයි. එහෙත් සමහර ළමයින්ට තම වයස් මට්ටමට ගැළපෙන පොත් සොයා ගැනීමට නොහැකි වීමත් පොත් විශාල සංඛ්‍යාවක් දකීමෙන් වකිතයකට පත් වීමත් නිසා ළමයින්ගේ පැමිණීම අඩු වීමේ අනතුරක් ද ඇති විය හැකි යි. මේ ආකාරයෙන් සතුටුදායක ලෙස සකස් කළ හැකි පොත් එකතුවේ ප්‍රමාණය පිළිබඳ උපදෙස් තහවුරු කර ගැනීමට පෙර, යම් අත්හදා බැලීමේ කාල පරිච්ඡේදයක් තුළ දී පොත් එකතුන් එසේ සංකලනය කිරීම නිසා, කියවීමේ පුරුද්දත් පුස්තකාල පුරුද්දත් වර්ධනයවන වයසේ (වයස අවුරුදු දහයට අඩු) සිටින ළමයින්ට ඉන් බාධාවක් ඇති වන්නේ දැයි දැන ගැනීමට පුස්තකාලයාධිපති සැලකිලිමත් විය යුතු ය.

පුස්තකාලයේ කළමනාකරණ කණ්ඩායම විසින් පුස්තකාලයේ පරිපාලන කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීමේ දී හා තීරණ ගැනීමේ දී ළමයින්ගේ අවශ්‍යතා හරි හැටි ඉටු වන්නේ දැයි සොයා බැලීම ජ්‍යෙෂ්ඨ ළමා පුස්තකාලයාධිපතිගේ කාර්යයක් වේ. බොහෝ පුස්තකාලවල පාඨක සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ ළමයි වෙති. එහෙත් තීරණවලට එළඹීමේ දී බොහෝවිට ළමයින්ගේ අවශ්‍යතා සැලකිල්ලට නො ගැනේ. මේ හේතුව නිසා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තුළ ළමා පුස්තකාලයාධිපති ද නියෝජනය විය යුතු ය.

හතරවන පරිච්ඡේදය

# ළමා පුස්තකාලයක කාර්ය මණ්ඩලය

'පුස්තකාලයක සාර්ථකත්වය රඳා පවත්නා ප්‍රධානතම සාධකය, එහි අධීක්ෂකයාවේ. මේ සඳහා ඉතා කරුණාවන්ත, හොඳ අධ්‍යාපනයක් ඇති, සංවිධාන හැකියා ඇති, හොඳ මනෝභාවයකින් යුත් කාන්තාවක් හැකි නම් තෝරා ගත යුතු ය. එය ගරුකටයුතු පදවියක් වෙයි, සේවා කාලය මධ්‍යස්ථ විය යුතුයි. හොඳ පඩියක් ගෙවිය යුතු වෙයි. එවැනි තනතුරකට නියම පුද්ගලයා පත් වුව හොත්, අපූරු මෙහෙයක් ඉටුවනු ඇත.' (ජෝන් බැලියාර්, කාඩිෆ් පුස්තකාලයාධිපති 1903)

බොහෝ මහජන පුස්තකාල පද්ධතිවල ළමයින් සහ තරුණ අය සඳහා විශේෂ වගකීමක් ඇති කාර්ය මණ්ඩල සාමාජිකයකු සිටිය ද සමහර ළමයින් පුස්තකාලයට පැමිණෙන අවස්ථාවල විශේෂඥ ළමා පුස්තකාලයාධිපතිවරයකු හමු වීමට ඉඩ නො ලැබේ. සංසන්දනාත්මක ව බලන විට පූර්ණකාලීන ළමා පුස්තකාලයාධිපතිවරයකු යෙදවීමට හැකියාව ඇත්තේ පුස්තකාල සේවා ස්ථාන සුළු සංඛ්‍යාවකට පමණි. එවැනි තනතුරක වටිනාකම රඳා පවතින්නේ ළමයින් විශාල සංඛ්‍යාවකට ප්‍රයෝජනවත්වන පරිදි, පුස්තකාල ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් පොත් පත් ආදි ද්‍රව්‍ය තෝරා ගැනීමටත් ළමයින් සඳහා පුස්තකාල ක්‍රියාකාරකම් වර්ධනය කිරීමටත් කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් පැවැත් වීමටත් කොතෙක් දුරට දායක වියහැකි ද යන කරුණු මත ය.

එසේ දායක විය හැකි අය, මුලින්ම පුස්තකාලයාධිපතීන් වශයෙන් පුහුණු කළ යුතුය. එහි දී පුස්තකාලයාධිපතිත්වයේ සියලු ම අංශ පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතු වේ. දෙ වනු ව ඔවුන් ළමා පුස්තකාලයාධිපති ක්ෂේත්‍රයේ විශේෂඥයන් වශයෙන් පුහුණු කළ යුතුය. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා ඇති බොහෝ පාඨමාලා මගින් ළමා

හා යොවුන් අය සඳහා පුස්තකාල හා සාහිත්‍ය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා ගැනීමට අවස්ථාව ලැබේ. පසු කාලීන ව තව දුරටත් විශේෂඥ දැනුම ලබා ගැනීමට අදහස් කරන අය සඳහා පශ්චාත් සුදුසුකම් සඳහා ද විධිමත් හා අවිධිමත් අවස්ථා තිබේ. කෙසේ වුවත් ළමයින් සමඟ සම්බන්ධතා පවත්වන බොහෝ පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල සහායකයන් ළමා කටයුතු සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා නොමැත. එම නිසා මේ අයට සේවාස්ථ කාර්ය මණ්ඩල පුහුණුව ඉතා වැදගත් වේ.

සෑම මහජන පුස්තකාල පද්ධතියකම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තුළ ජ්‍යෙෂ්ඨ ළමා පුස්තකාලයාධිපතිවරයකු සිටිය යුතුය. තනතුරේ නාමය වෙනස් විය හැකි ය. උදාහරණ වශයෙන් 'ළමා', 'පාසල්', 'ළමා හා යොවුන්', 'අධ්‍යාපන' වැනි කවර පදයක් යටතේ වුවද එය ළමයින් හා සම්බන්ධ වනු ඇත. එනමුත් අධ්‍යාපන බලධාරීන් වෙනුවෙන් මහජන පුස්තකාල විසින් පාසල් සඳහා සේවාවන් පවත්වන හැම විට ම එම සේවය සඳහා සම්පූර්ණ වගකීම පැවරෙන එක් පුද්ගලයකු සිටිය යුතුය. පුස්තකාලයේ පවතින සම්පත්වලින් සාධාරණ කොටසක් ළමා හා යොවුන් අයට ලැබෙන්නේ ද යන්න සොයා බැලීම, නව පුස්තකාල සැලසුම් කිරීම, ළමා හා පාසල් පුස්තකාල සඳහා පොත් පත් තෝරා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම, එම පොත් පත් සකස් කිරීම සම්බන්ධයෙන් උපදෙස් සැපයීම, පොත් ලැයිස්තු වැනි ප්‍රකාශන මගින් ද ව්‍යාප්ති කටයුතු මගින් ද විවිධ කණ්ඩායම් මගින් ද ළමා පොත් වර්ධනය කිරීම යන කටයුතු සම්බන්ධ වගකීම පැවරෙන්නේ ජ්‍යෙෂ්ඨ ළමා පුස්තකාලයාධිපති වෙත ය. මේ සියලු ම කටයුතු ඉටු කිරීම සඳහා, විශේෂඥ ළමා පුස්තකාලයාධිපති කණ්ඩායමක සහයෝගය අවශ්‍ය වේ.

අවශ්‍ය අවස්ථාවල දී සේවාවන් පාලනය කිරීමේ වගකීම භාර දීම සඳහා නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයකු සිටිය යුතු ය. සමහර විට නියෝජ්‍ය පුස්තකාලයාධිපතීන් දෙදෙනකු සිටිය හැකි ය. අවුරුද්දේ යම් යම් කාල පරිච්ඡේද අනුව හා පාසලේ කටයුතු අනුව සපයනු ලබන සේවාවන් වෙනස් වන නිසා සේවා සැපයීමේ දී යම් ආකාරයක නම්‍යතාවක් තිබිය හැකිය. යම් කිසි

පුස්තකාල පද්ධතියක ළමා පුස්තකාලයාධිපතීන් කොපමණ සිටිය යුතු ද යන්න රඳා පවතින්නේ එම පද්ධතියේ විශාලත්වය හා සංවර්ධන තත්ත්වය මත යි.

පුස්තකාල පද්ධතියක සිටිය යුතු විශේෂඥ ළමා පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඇත්තේ ද සුළු වශයෙනි. යම් යම් සුවිශේෂ කාර්යයන් සඳහා විශේෂඥ කාර්ය මණ්ඩල විසින් සතියකට වැය කළ යුතු පැය ගණන ලම්සැක් වාර්තාවේ (Lamsac Report) සඳහන් වේ. කෙසේ වුවත් ඒ පිළිබඳ ප්‍රමිතීන් ඉදිරිපත් කිරීමට එම වාර්තාව උත්සාහ ගෙන නැත.

යම් යම් වගකීම් වෙන් කිරීමේ දී සිතේ තබා ගත යුතු වැදගත් කරුණක් තිබේ. සේවාවේ ඒ ඒ කොටස් කාර්යක්ෂම ලෙස ඉටු කරන්නේ ද යන්න ස්ථිර වශයෙන් දැන ගැනීමේ හොඳ ම මාර්ගය නම් එය සොයා බැලීමේ කාර්යය එක් පුද්ගලයකුට පැවරීමය. කාර්ය මණ්ඩලයේ සෑම මට්ටමක් සඳහා ම මෙම ක්‍රමය යොදා ගත හැකි ය. වයස අවුරුදු පහට අඩු ළමයින්, ආබාධිත ළමයින් හෝ නව යෞවනයන් වැනි විශේෂ සමූහ සඳහා සේවා සැපයීමේදීත් ප්‍රකාශන හෝ ප්‍රදර්ශන වැනි විශේෂ ක්‍රියාකාරකම් ආදි කටයුතු ඉටුකිරීමේදීත් මධ්‍යම කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඒ ඒ කාර්ය පිළිබඳ වගකීම වෙන වෙන ම පැවරිය යුතු ය. ඒ සමඟ ම ළමා පුස්තකාලයේ පොත් එකතුව මනා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා එක් පුද්ගලයකු වෙත වගකීම පැවරිය යුතුය. ළමයින් වෙත සෘජු ව හෝ වක්‍ර ව හෝ සපයනු ලබන සේවාවන් පිළිබඳ ව ඔහුට හොඳ අවබෝධයක් තිබිය යුතු ය.

හොඳ සේවාවක් සැපයීම සඳහා මූලික කරුණක් නම්, කාර්ය මණ්ඩලය තුළ හොඳ සන්නිවේදනයක් තිබීමයි. ප්‍රතිපත්ති සාකච්ඡා කිරීමටත් සංවර්ධන කටයුතු සැලසුම් කිරීමටත් එකතුව සඳහා පොත් පත් තෝරා ගැනීමටත් ළමා පුස්තකාලයාධිපතීන් නිරතුරුව රැස්විය යුතුය. ළමයින්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය තොරතුරු, තොරතුරු පත්‍රිකා (Information Bulletins) මගින් ඒ අයට නිරතුරු ව ලබා දිය යුතු ය.

පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කළ යුතු ය. පාඨමාලාව සඳහා එක් ඒකකයක් සැලසුම් කිරීමේ වගකීම ළමා පුස්තකාලායාධිපතිවරයා වෙත පැවරීම වැදගත් වේ. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පාසල් හෝ ඒවායේ වෘත්තිමය සමිති සමාගම් විසින් සංවිධාන කරනු ලබන ජාතික හා ප්‍රාදේශීය පාඨමාලාවලට හා සම්මන්ත්‍රණවලට සහභාගි වීමට විශේෂඥ ළමා පුස්තකාලයාධිපතීන් දිරිමත් කළ යුතු ය. ඒ මගින් ඔවුන්ගේ දැනුම හා කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට හැකි වේ. අධ්‍යාපන චින්තනයේ සිදු වන වෙනස් වීම්වලට ගැළපෙන පරිදි කටයුතු කිරිමට ළමා පුස්තකාලයාධිපතිට සිදු වේ. පුහුණු පාඨමාලා සැලසුම් කිරීමේ දී ලද හැකි සම්පත් පිළිබඳ වත් වයස අවුරුදු පහට අඩු ළමයින්, නව යෞවනයන්, ආබාධිත ළමයින් වැනි විශේෂ සමූහ සඳහා අවශ්‍යතාවන් කෙරෙහි සැලකිලිමත් විය යුතු ය. මෙම පුහුණු පාඨමාලාවල දී ළමයින්ට කතන්දර කීම, වැඩිහිටි සමූහවලට කථා කිරීම, ශිල්පීය කටයුතු වැනි කුසලතා ඉගැන්විය යුතු ය. අධ්‍යාපනය නිරතුරු වෙනස් වීම්වලට හා සංවර්ධනයන්ට භාජනය වන බැවින් එම වෙනස් වීම් හා සංවර්ධන ළමා පුස්තකාලයාධිපතිට විශේෂයෙන් වැදගති. ඒ පිළිබඳ ව ඔහු දැනුවත් කර විය යුතු ය. පුස්තකාලයාධිපතිවරයකුට පොදුවේ තිබිය යුතුසෑම ගුණාංගයක් ම විශේෂඥ ළමා පුස්තකාලයාධිපතිවරයෙකුට තිබිය යුතුය. එම ගුණාංග අතර අනුකම්පාව, ඉවසීම හා සංවිධානය කිරීමේ හැකියාව යන්න අත්‍යවශ්‍යය ගුණාංග වේ. ළමා පුස්තකාලවලත් ළමා පුස්තකාල සම්පත්වලත් වටිනාකම පිළිබඳ ව ඇති විශ්වාසය හා ඒවා දියුණු කිරීමට ඇති ආශාව අනෙකුත් ගුණාංග වශයෙන් සැලකිය හැකි ය.

පස්වන පරිච්ඡේදය

# පොත්පත්
# ළමයින්ගේ අවශ්‍යතා සහ රුචි අරුචිකම්

පොත්පත් තෝරා ගැනීමේදී ළමයින්ගේ කියවීමේ අවශ්‍යතා සහ රුචි අරුචිකම් සැලකිල්ලට ගත යුතුය. ළමයින්ට අවශ්‍ය නොවන පොත්පත් මිල දී ගැනීම මුදල් නාස්ති කිරීමක් වේ.

කියවීම සඳහා පොත්පත් ළමයින්ට බොහෝ විට ලැබෙන්නේ වැඩිහිටියන්ගෙන්, දෙමාපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් හෝ පුස්තකාලයාධිපතීන්ගෙනි. බොහෝ ළමයින්ට පහසුවෙන් හා කෙළින් ම ලබා ගත හැක්කේ චිත්‍රකතා පොත් ය. පොත්පත් ලබා ගැනීමේ දී සාමාන්‍යයෙන් ළමයින්ට වැඩිහිටි අතරමැදියන් මත යැපීමට සිදුවේ. තමන්ට රුචියක් ලබා නොදෙන පොත්පත් කෙරෙහි ළමයි එතරම් සැලකිල්ලක් නො දක්වති. එමනිසා ඔවුන්ට රසයක් ගෙන දෙන පොත්පත් ලබා ගැනීමට පුස්තකාලයාධිපති හැකි තරම් උත්සාහ ගත යුතු ය.

සමාජයේ ජීවත් වන සෑම කෙනෙක්ම පොත්පත්, පුස්තකාල පරිහරණය නොකරති. එනමුත් උගත් සමාජයක දැනුම ලබා ගැනීමේ ප්‍රධාන ම මාර්ගය පොත්පත් වන නිසා සමාජයේ හොඳින් කටයුතු කිරීමට නම්, කියවීමේ හැකියාව තිබිය යුතු යි. මූලික කියවීමේ කුසලතා දියුණු කිරීමේ කාර්යයේ දී ළමා පුස්තකාල ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

පොත්පත් හොඳින් කියවා තේරුම් ගැනීමට හැකි ළමයා විශ්වාස කරන්නේ තමා විනෝදය පිණිස කියවන බව යි. එහෙත් ඊට වඩා ප්‍රායෝගික මනෝවිද්‍යාත්මක වැදගත්කමක් එහි ගැබ් වේ. අතීත හා වර්තමාන අත්දැකීම් අවබෝධ කර ගැනීමටත් අනාගත අත්දැකීම්වලට සූදානම් වීමටත් කතන්දර කියවීමෙන් අවස්ථා සැලසේ. දැනුම හා අවබෝධය දියුණු කර ගැනීමටත් ප්‍රබන්ධ කථා ළමයින්ට උපකාරී වේ. පොත් මගින් ළමයින්ට

තමන් අවබෝධ කර ගැනීමට අවස්ථා ලබා දෙනවා පමණක් නො ව, අන් අය පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමට හා වඩා ඉක්මනින් ඔවුන්ට සමීපවීමටත් එය උපකාරී වේ.

පොත් මඟින් මෙම කාර්යයන් ඉටු වන බව අප පිළිගන්නේ නම් ළමයින්ට ලබා ගැනීමට හැකි වන්නේ කිනම් පොත් වර්ගද යන්න ගැන සැලකිලිමත් වීම අවශ්‍ය වේ. ප්‍රේමය පිළිබඳ කථාවලින් අපේක්ෂා සඵල වීමේ හැඟීම් ප්‍රකාශවේ. එනමුත් එමඟින් ප්‍රකාශ වන අගයයන් හා සාරධර්ම යථාර්ථවාදී ද යන කරුණ පිළිබඳව අප ස්ථිර වශයෙන්ම දැනගත යුතු ය. සාර්ථකත්වය පහසුවෙන් ලබා ගත නොහැකි විය යුතු ය. සාර්ථකත්වය ඉබේ පහළවන දෙයක් හෝ වාසනාව නිසා ඇති වන දෙයක් හෝ නො ව, මහන්සි වී වැඩ කිරීම තුළින් ලබා ගත හැකි දෙයක් බව පෙන්විය යුතු ය. ළමයින් සහ නව යෞවනයන් සඳහා වන කථා, සර්වසුභවාදය පිළිබිඹු වන තේමාවන්ගෙන් යුක්ත විය යුතු ය. නව යෞවනයන් සඳහා පොත් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් විශේෂඥතාවක් ඇති වූ ද දිගු කාලයක් ඒ සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් දිනා ඇති වූ ද ප්‍රකාශකයින්ගේ පොත්වල සාමාන්‍යයෙන් පිළිගත හැකි අදහස් ප්‍රකාශ වේයයි විශ්වාසය තැබිය හැකි ය. එහෙත් ඒ සෑම පොතක් ම මිල දී ගැනීමට පෙර පරෙස්සමෙන් පරීක්ෂා කර බැලිය යුතු ය.

පුස්තකාලය සඳහා ප්‍රබන්ධකථා තෝරා ගැනීමේ දී පුස්තකාලයාධිපති මතක තබා ගත යුතු කරුණු කීපයක් ඇත. පුස්තකාලය වෙත ළමයින්ගේ අවධානය යොමු කර ගැනීමේ කාර්යය ඉතා සැලකිල්ලෙන් කළ යුතු වුවත් ගුණාත්මක වශයෙන් උසස් පොත් රස විඳිම කෙරෙහි ඔවුන් දිරි ගැන්වීම ද ඉතා වැදගත් වේ. ළමා පුස්තකාලයක ඇති සෑම පොතක් ම ගුණාත්මක වශයෙන් යහපත් පොතක් විය යුතු ය. ළමයින් තුළ ඇති කියවීමේ නියම හැකියා මට්ටමට ඉහළින් නො ව ඊට පහළ මට්ටමකින් පොත්පත් කියවීමට ළමයි නැඹුරු වෙති. වඩා උසස් පොත් කියවීම කෙරෙහි ළමයින් දිරි ගැන්විය යුතු ය. මහජන පුස්තකාලවලින් ළමා පාඨකයින්ට ලැබෙන විශාල ප්‍රයෝජනයක් නම්, ළමයින්ට පොතපත සොයා ගැනීමටත් අත්හදා බැලීමටත්

තමන්ට ම තෝරා ගැනීමටත් අවස්ථාවක් ලැබීම යි. එමනිසා ළමයින්ගේ කියවීමේ කුසලතාව දියුණු කිරීම සඳහා පහසු කියවීම් පිණිස පොත් විශාල ප්‍රමාණයක් අවශ්‍යවේ. එනමුත් ළමයාගේ අත්දැකීම්වලට කිසිවක් අලුතෙන් එක් නොකරන පොත්වලින් ප්‍රයෝජනයක් නො ලැබේ. කියවීමට පහසු, සරල පොත්, උසස් පොත් තරමට ම ඵලදායී විය හැකි ය. කියවීමට පහසු සරල පොත්වලට ළමයි වැඩි කැමැත්තක් දක්වති. කියවීමේ කුසලතාව වර්ධනය කර ගැනීම සඳහා කරුණු තුනක් අවශ්‍ය වේ.

1. භාෂා හැකියාව
2. යම් යම් තේමාවන් කෙරෙහි දක්වන රුචිකත්වය
3. එම තේමාවන් ඉදිරිපත් කර තිබෙන ආකාරය

හේතු කීපයක් නිසා ළමයි පොත්පත් කියවති. තම විවේක කාලයෙන් වැඩි ප්‍රමාණයක් වැය කරමින් ආශාවෙන් කියවන්නේ විනෝදය සඳහා ය. කියවීමට ප්‍රිය කරන දෑ අතින් ළමයින් අතර සමානත්වයක් පවතින බව සමීක්ෂණ මගින් පෙනී ගොස් ඇත. ඒ සඳහා හැකියාමය වෙනස්කම් බල පාන්නේ නැත.

කියවීමේ රුචිකත්වය හා කියවන ප්‍රමාණය තීරණය කරන ප්‍රධානතම සාධකය, ස්ත්‍රී-පුරුෂ භාවය යි. පිරිමි ළමයින්ට වඩා ගැහැනු ළමයි කියවීමට වැඩි රුචිකත්වයක් දක්වති. දෙ වැනි ප්‍රධාන සාධකය නම් ගෙදර පරිසරය යි. දෙමාපියන් නිතර පොත් කියවන්නා වූ තම ජීවිතවල අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් පොත් සලකනු ලබන්නා වූත් නිවෙස්වල හැදෙන වැඩෙන ළමයි එවැනි පරිසරයක් නොමැති පවුල්වල හැදෙන වැඩෙන ළමයින්ට වඩා කියවීමට වැඩියෙන් නැඹුරු වෙති. කෙසේ වුවත්, බාල වයසේ දී එවැනි යහපත් පරිසරයක් පැවතිය ද සමහර ළමයි කියවීමේ පුරුද්දක් ඇති කර නො ගනිති. ඒ අනුව කියවීමේ පුරුද්ද කෙරෙහි ගෙදර පරිසරයෙන් පූර්ණ බලපෑමක් නොලැබේ නම්, පුස්තකාලයාධිපතීන් හා ගුරුවරුන්, කියවීම කෙරෙහි ළමයින් වඩා ධෛර්යමත් කළ යුතු ය.

තම ජීවිතවලට අදාළ, පහසු පොත් වැඩියෙන් තිබේ නම්, කම්කරු පන්තියට අයත් ළමයින් වැඩියෙන් කියවන බවට මතයක් බොහෝ විට පවතින නමුත්, එම මතය තහවුරු කිරීමට

සාක්ෂ්‍ය නැති තරම් ය. පොත් තුළින් තමාත් තම අපේක්ෂාවනුත් පිළිබිඹු වීම ඇත්තෙන් ම ළමයින්ට ඉතා වැදගත් ය. කෙසේ වුවත් පසු ගිය වර්ෂ කීහිපය තුළ ළමා ප්‍රබන්ධ කථා රචනා කරන ලේඛකයන් විසින් ජීවිතය පිළිබඳ වඩා යථාර්ථවාදී අදහසක් පොත් මගින් ළමයින්ට ලබා දීමට වැඩි සැලකිල්ලක් දක්වා ඇත. විවිධ සමාජ පසුබිම් හා සමාජ තත්ත්වයන් එම කථා මගින් නිරූපණය කිරීමට ඔවුන් උත්සාහ ගෙන ඇත.

ළමයින් පොත්වලින් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණ නම් හොඳ කථා වස්තුවක් සහ පහසුවෙන් කියවීමේ ගතියක් තිබීම යි. මෙම ගුණාංග සහිත ඕනෑ ම පොතක්, විවිධ පරිසරවලට අයත් පාඨකයන්ගේ සිත් ඇද ගැනීමට නැඹුරු වනු ඇත. බොහෝ ළමයි ස්වභාවයෙන් ම සර්වසුභවාදී වෙති. ඔවුන් යම් කිසි පොතකින් ලබා ගන්නේ කුමක් දැයි නිශ්චය වශයෙන් වැඩිහිටියකුට පැවසීම අසීරු ය.

තමන් කැමති දේ පොත්වලින් නිරූපණය වනු දැකීමට ළමයි බොහෝ විට අපේක්ෂා කරති. ඔවුන්ගේ ජීවිතයේ අනෙකුත් අංශවලට ද ඔවුහු ඒවා සම්බන්ධ කරති. යම්කිසි පොතක් රස විදිමට ඇති හැකියාව සංකීර්ණ හේතු රාශියක් මත රඳා පවතී. එම හේතු පැහැදිලි ව ම වෙන් කර හඳුනා ගැනීම අසීරු ය. එසේ වුවත්, බොහෝ ළමයින්ගේ සිත් ඇද ගන්නා ගුණාංග මොනවා දැයි ඇතැම් ජනප්‍රිය පොත් මගින් දැන ගත හැකි ය.

එමනිසා ළමයින්ගේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පොත් තෝරා ගැනීමේ දී ළමයින්ගේ රුචි-අරුචිකම් හා ඔවුන්ගේ කියවීමේ වර්ධනය පිළිබඳ ව පුස්තකාලයාධිපති තුළ අවබෝධයක් තිබිය යුතු ය. එමෙන් ම පොත් කියවන සෑම ළමයකුගේ ම සිත් ඇද ගන්නා සුලු පොත් එකතුවක් ඉදිරිපත් කිරීමට පුස්තකාලයාධිපති උත්සාහ කළ යුතු ය.

පෙර පාසල් ළමයින් සහ පාසල්වල පහළ ම පන්තිවල ළමයින් වැනි බාල වයස් ළමයින් සඳහා, විවිධ වර්ගවලට අයත් අලංකාර පින්තූර පොත් ලබා දිය යුතු ය. බොහෝ පින්තූර පොත් සකස් කර තිබෙන්නේ ළමයින් විසින් ම කියවීම සඳහා නොව

වෙනත් අයකු විසින් ළමයින්ට ඇසෙන සේ කියවීම සඳහා ය. කථා වස්තුව හා වාක්‍ය සරල වුවත් වාංමාලාව අවශ්‍යයෙන් ම එසේ සරල විය යුතු නැත. හඬ නගා කියවීම සඳහා බොහෝ විට පින්තූර පොත්වල යොදා ගෙන ඇති රසවත් භාෂාව ළමයාගේ භාෂා වර්ධනය සඳහා වැදගත් වේ.

සමහර පින්තූර පොත් සකස් කර ඇත්තේ අක්ෂර හෝඩිය හෝ සංඛ්‍යා හෝ වැනි දේ පදනම් කර ගෙන ය. තවත් සමහරෙක වර්ණ වැනි සංකල්ප යොදා ඇත. එහෙත් පොත් වැඩි සංඛ්‍යාවක සරල කතන්දර ඇතුළත් වේ. කතන්දරයක් ඇතුළත් නම්, සුදුසු තේමාවක් ද සිත් තුළට කාවදින චරිත ද එහි තිබිය යුතු යි. විසඳුමක් අවශ්‍ය වන හා තේරුම් ගත හැකි ගැටලුවක් සහිත කථා වස්තුවක් තිබිය යුතු යි. හොඳ ගලායෑමක් හා ස්ථානය පිළිබඳ හැඟීමක් ද තිබිය යුතු ය. පින්තූර මඟින් කථා වස්තුව පැහැදිලි විය යුතු ය. වර්ණ සහ චිත්‍ර අන්තර්ගතයට යෝග්‍ය විය යුතු ය. පොතේ සමස්ත සැලස්ම ළමයාගේ නෙත් සිත් පිනවිය යුතු ය.

සෑම පින්තූර පොතකම කථාවත් පින්තූරත් අතර ගැළපීමක් තිබිය යුතුය. කථාව රචනා කරන පුද්ගලයා විසින් ම රූප සටහන් ද සකස් කරන්නේ නම් මෙම ගැළපීම වඩාත් හොඳින් තහවුරු වනුඇත. අතිරේක විස්තර ලබා දීම සඳහා පින්තූර යොදා ගත හැකිය. ළමයාට හා කතන්දරය කියවන වැඩිහිටියන්ට ඒවා පිළිබඳ සාකච්ඡා කළ හැකි ය. පසු ව එය ළමයාට තනි ව ම රස විඳිය හැකි ය. සෑම පින්තූර පොත් රචකයකුට ම පැරණි කතන්දර ඉදිරිපත් කළ නො හැකි ය. බොහෝ අය සාම්ප්‍රදායික කතන්දරවලින් බොහෝ ප්‍රයෝජන ලබා ගනිති. පැරණි කතන්දරවල රටාව පින්තූර පොත් සඳහා ඉතා යෝග්‍ය වේ.

පින්තූර පොත් කියවන අවධියේ සිටින ළමයි තමන් වැනි ළමයින් පිළිබඳ කතන්දර කියවීමට කැමැත්තක් දක්වති. බාධක රාශියක් මධ්‍යයේ ජය ගන්නා කුඩා වීරයින් හා වීරවරියන්ට ඔවුහු කැමැත්තක් දක්වති. මෙම අවධියේ සිටින ළමයින්ට අවශ්‍ය වන්නේ ලෝකයට හැඩ ගැසීමේ දී මුහුණ පාන්නට සිදුවන ගැටලු

හා සම්බන්ධ කතන්දර යි. කුඩා ළමයින්ට මුහුණ දෙන්නට සිදුවන ගැටලු අවස්ථාවන් හා සම්බන්ධ පොත් විශාල සංඛ්‍යාවක් තිබේ. සාමාන්‍ය හා ප්‍රීතිදායක අත්දැකීම් පිළිබඳ කථා තාත්වික ය. මිනිසුන් වෙනුවට සතුන් හා සෙල්ලම් බඩු යොදා ගනිමින් ප්‍රබන්ධ කළ කථාවල ළමයින්ට කෙළින් ම හඳුනාගත නොහැකි චරිතයක් තුළින්, ජීවිතයේ අත්දැකීම් පිළිබඳ දැනුමක් ලැබේ.

වයස අවුරුදු හතට අඩු ළමයි තමන්ට ඇසෙන සේ කියවනු ලබන දෙය කෙරෙහි එතරම් විවේචක බවක් නො දක්වති. පින්තූර පොත් පිළිබඳ අත්දැකීම් සම්බන්ධයෙන් වැදගත් ම අංශය වනුයේ වැඩිහිටියන් ද එයට කැමැත්තෙන් සහභාගි වීමයි. මෙහි සඳහන් කරන ලද මිනුම් දඬුවලට සරිලන හොඳ තත්ත්වයෙන් යුත් පින්තූර පොත් එමට ඇත.

ප්‍රධාන ම ගැටලුව වශයෙන් සඳහන් කළ හැක්කේ උපරිම ප්‍රයෝජන ලැබෙන ආකාරයට තිබෙන මුදල් ප්‍රමාණය යෙදවීම යි. වර්ණ මුද්‍රණය නිසා පින්තූර පොත් සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මෙය වියදම අඩු කර ගැනීම සඳහා බොහෝ පින්තූර පොත් රටවල් කීපයක එක වර ප්‍රකාශයට පත් කරනු ලැබේ. එමගින් වඩා පුළුල් අලෙවියක් ලබා ගත හැකි වේ. කෙසේ වුවත්, සමහර පොත්, මුලින් ප්‍රකාශයට පත් කරනු ලැබූ රටේ ළමයින්ට කොතරම් යෝග්‍ය වුවත්, වෙනත් රටක ළමයින්ට සුදුසු නොවිය හැකි ය.

අනෙක් ඕනෑ ම පොතක් මෙන් ම පින්තූර පොත් ද නව මෝස්තර හා ප්‍රවණතාවලට භාජනය වේ. මෑත වර්ෂවලදී කාටූන් චිත්‍ර රටාව පින්තූර පොත් කෙරෙහි බලපා තිබේ. කියවීමට ඉගෙන ගන්නා අවධියේ පසු වන ළමයින්ගේ අවශ්‍යතා සපුරා ලන්නේ සාපේක්ෂ වශයෙන් පින්තූර පොත් සුළු සංඛ්‍යාවක් පමණි.

වයස අවුරුදු හතත් දහයක් අතර ළමයින් පින්තූර පොත් භාවිතයෙන් ඉවත් වුවත් ඔවුන් ළමා නවකතා කියවීමේ අවස්ථාවට පැමිණ නමුත් ඔවුන්ගේ ආත්මකේන්ද්‍රීය භාවයද අඩු වන්නට පටන් ගනී. මේ අයිතමයන් පිළිබඳ ව කල්පනා කරන්නේ

පුද්ගල අනන්‍යතාව කෙරෙහි ඔවුහු වඩා සංවේදී වෙති. අන් අය පිළිබඳ ව වැඩියෙන් දැනුවත් වෙති. චමත්කාර අද්භූත කථා අවශ්‍ය වන්නට පටන් ගනී. සම වයසේ කණ්ඩායම් ඉතා වැදගත් වන්නේ මෙම අවස්ථාවේ දීය. එබැවින් ළමා කල්ලි පිළිබඳ කතන්දර සඳහා ඉල්ලුමක් ඇත. සම වයස් කණ්ඩායම්වල කටයුතුවලට සමහර අවස්ථාවල දී දෙමාපියෝ අකමැති වෙති. ළමයින් වඩා ස්වාධීන වන විට, එතරම් ප්‍රබල නොවූ දෙමාපිය චරිත සහිත කතන්දර කියවීමට ඔවුහු ප්‍රිය කරති.

මෙම අවධිය වන විට ළමයින්ට සාමාන්‍යයෙන් කියවීමේ හැකියාව ලැබී ඇත. එසේ වුවත් දක්ෂ පාඨකයන් වීමට නම්, තව දුරටත් පුහුණුව ලැබීම අවශ්‍යය. එම නිසා භාෂාව හා වාක්‍ය ව්‍යුහය සරල විය යුතු ය. නොයෙක් කථා වස්තු හා චරිත ඇතුළත් විය යුතු ය. මේ මට්ටමේ ළමයින් සඳහා ලියැවුණු පොත් බොහොමයක් ම එම වයසේ ම ළමයින් පිළිබඳ සරල වික්‍රමාන්විත කථා පොත් ය. සමහර කතා ඓතිහාසික පසුබිමක් සහිත ඒවා වේ. තවත් සමහරක් විදේශ රටවල් පසුබිම් කොට ලියැවුණු ඒවා වේ. මෙම කතන්දරවල සතුන්ට වැදගත් ස්ථානයක් හිමි වේ. මෙම පොත් බොහොමයක් පළ කෙරෙනුයේ පොත් පෙළක් වශයෙනි. බොහෝ බ්‍රිතාන්‍ය පොත් ප්‍රකාශකයෝ අඩු වශයෙන් මෙම මට්ටමේ එක් පොත් පෙළක් වත් ප්‍රකාශයට පත් කර ඇත.

වයස අවුරුදු නමය වන විට ගැහැනු ළමයින්ගේ හා පිරිමි ළමයින්ගේ රසඥතාව සැලකිය යුතු ලෙස විවිධ වේ. ගැහැනු ළමයින් ඒ වන විටත් සුරංගනා කථා කියවන අතර, බොහෝ පිරිමි ළමයි ඒවා ප්‍රතික්ෂේප කරති. වයස අවුරුදු දහයේ සිට එකොළහ දක්වා ගැහැනු හා පිරිමි ළමයි සමූහ ක්‍රියාකාරකම් සහිත වික්‍රමාන්විත කථාවලට කැමැත්තක් දක්වති. එනමුත් පිරිමි ළමයි වඩා පුළුල්, ප්‍රචණ්ඩ, වික්‍රමාන්විත ක්‍රියා කෙරෙහි වැඩි කැමැත්තක් දක්වති. පෞද්ගලික සම්බන්ධතා සහිත පවුල් පසුබිම් වූ කථාවලට හා ආදරය කිරීමේ හා ආදරය ලැබීමේ අවශ්‍යතා පිළිබිඹු වන කථාවලට ගැහැනු ළමයි කැමැත්තක් දක්වති. ගැහැනු ළමයින් වයස අවුරුදු දොළහ වන විට, තමන්ට

වඩා තරමක් වයසින් වැඩි ගැහැනු ළමයින් පිළිබඳ ප්‍රේම කථා කෙරෙහි උනන්දුවක් දක්වන අතර, පිරිමි ළමයි විද්‍යා ප්‍රබන්ධ, අභිරහස් හා සිද්ධාන්ත පිළිබඳ කථා කෙරෙහි උනන්දුවක් දක්වති.

පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය නම් මේ රුචි අරුචිකම්වලට ගැළපෙන පොත් තෝරා ගැනීම යි. ඉතා ඉක්මනින් සිත් ඇද නොගන්නා පොත් 'නිරස' පොත් වශයෙන් වහා ප්‍රතික්ෂේප වේ. පොත් පිළිබඳ ව ළමයින් විසින් කෙරෙන ප්‍රධාන ම විවේචනය එය යි. කියවීමට අපහසු, නුහුරු නම් ගම් ද ශෛලියේ අමුතු බවක් ද නිසා බොහෝ ළමයින්ට පොත් කියවීමට සිත් නො දෙයි. අධෝලිපි හා පෙරවදන් වැනි දේ ද ළමයින් පොත්වලින් ඈත් කරවයි. අතිරේක පසුබිම් තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍ය යැයි කර්තෘට හෝ ප්‍රකාශකයාට හෝ හැඟී යන්නේ නම්, ඒවා සටහනක් වශයෙන් හෝ පාරිභාෂික ශබ්ද මාලාවක් වශයෙන් හෝ පොත අවසානයේ යෙදිය යුතු ය.

මේ අවධියේ දී චිත්‍ර එතරම් වැදගත් නො වේ. එහෙත් ළමයාගේ ඇස පොත කෙරෙහි ඇද ගැනීම සඳහා ඒවා යොදා ගත හැකි ය.. සම්භාව්‍ය කෘති පිළිබඳ ප්‍රතිපත්තියක් තීරණය කිරීමට පුස්තකාලයාධිපතිට සිදු වේ. රොබින්සන් කෘෘසෝ', ගලිවර්ස් ට්‍රැවල්ස් වැනි පොත් මුලින් රචනා කරන ලද්දේ ළමයින් සඳහා නො වේ. එහෙත් දැන් ඒවා සංස්කෘතික උරුමයේ කොටස් බවට පත්වී තිබේ. එම පොත් මුල් ස්වරූපයෙන් ම කියවනු ලබන්නේ සුළු පිරිසක් විසිනි. මෙම පොත් ළමා කාලයේ දීම නොකියවුව හොත් ඒවා කිසි දිනෙක නොකියවීමට පුළුවන. එවැනි පොත්වල, ළමයාට ගැළපෙන පරිදි සංක්ෂේපණ කොට, චිත්‍රද ඇතුළත් ව මුද්‍රණය කරන ලද සංස්කරණ ළමා පුස්තකාලයක තිබිය යුතු යි. සෑම ළමයකුටම කියවීමට අවස්ථාව ලබා දිය යුතු යම් යම් සම්භාව්‍ය කෘති තිබේ. යම් කථාවක් රූපවාහිනියෙන් නැරඹීමෙන් පසු එම කථා පොත පිළිබඳ ව බොහෝ ළමයි විමසති. එනමුත් බොහෝ විට සම්පූර්ණ පිටපත කියවා ගැනීමට ඔවුන්ට නොහැකි වේ. එහි අත්‍යවශ්‍ය ගුණාංගය නම් එය ලියා වී ඇති ආකාරය යි. එබැවින් ඒ පොත්වල නැවත මුද්‍රණ නො ගෙන, ඒවායේ සංක්ෂිප්ත මුද්‍රණ ලබා ගැනීම ගැන ළමා පුස්තකාලයාධිපතින් තීරණය කළ යුතු ය.

වයසින් වැඩි ළමයින්ට හා නව යෞවනයන්ට බොහෝ නවකථා දන් ප්‍රකාශ කරනු ලැබේ. වයස අවුරුදු දොළහට හෝ දහ තුනට හෝ වැඩි ළමයින් සඳහා කවර පහසුකම් තිබුණ ද වෙන ම පොත් එකතුවක් තිබීම අවශ්‍ය ය. වයස අවුරුදු දහයේ සිට දොළහ දක්වා වයස් කාණ්ඩයේ ළමයින් හා නව යොවුන් වියේ ළමයින් සඳහා සුදුසු ප්‍රබන්ධ, පොත් ලැයිස්තුවල හා පොත් නාම ලේඛනවල ඇතුළත් කර ඇත.

පොත් වර්ග දෙකක් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් යොමු විය යුතු ය. එනම්, සාම්ප්‍රදායික කථා පොත් සහ කවි පොත් ය. ළමා අවදියේ සෑම අවස්ථාවක දී ම ඒවා වැදගත් වේ. විවිධ වයස් සමූහවල අවශ්‍යතාවන්ට අනුකූල ව සකස් වූ උසස් කෘති විශාල ප්‍රමාණයක් තිබේ. ළමයින්ගේ භාෂාමය හා සාහිත්‍යමය සංවර්ධනයේ දී කාව්‍යමය පොත් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. මුද්‍රණ කලාව හා පොත් පත් බිහි වීමට බොහෝ කලකට පෙර පැවති ප්‍රාථමික සමාජවල බිහි වූ සාම්ප්‍රදායික කථාවලින් මිනිසුන්ගේ මූලික අපේක්ෂාවන් නිරූපණය වේ. ළමා පුස්තකාලයක සාහිත්‍ය අංශය වැඩි වශයෙන් ම කවි පොත්වලින් සමන්විත වන්නා සේ ම ආගමික අංශය විශාල වශයෙන් ම බයිබල් කථා හා ආගමික කථාවලින් සමන්විත වේ. මෙම පොත් තෝරා ගැනීමේ දී ද සාම්ප්‍රදායික කථා. මිථ්‍යා කථා, වීර කථා, සුරංගනා කථා ආදි කථා පොත් තෝරා ගැනීමේ දී යොදා ගන්නා මිනුම් දඬු ම යොදා ගත හැකි ය. භාෂාව හා ශෛලිය, කථාවේ ගුණාත්මක භාවයට උචිත විය යුතු ය. රූප සටහන් මගින් කථාව ප්‍රබල කිරීමෙන් ඒත්තු ගැන්වීමත් සිදු කළ යුතු ය.

පරිකල්පනාත්මක සාහිත්‍ය සම්බන්ධයෙන් බොහෝ ළමයින් තුළ ඇති අවශ්‍යතාව සපුරා ලිය හැක්කේ මෙහි සඳහන් ආකාරයට පොත් එකතුව ගොඩනැගීමෙනි. කෙසේ වුවත් විශේෂ සැලකිල්ලක් දක්විය යුතු අවශ්‍යතා ඇති ළමයින් කාණ්ඩ තුනක් ඇත. විශේෂයෙන් ම නාගරික ප්‍රජාවන්, විවිධ සංස්කෘතික හා ජනවාර්ගික අංගවල මිශ්‍රණයක් බවට ඉතා වේගයෙන් පත්වෙමින් පවතී. අධ්‍යාපනය හා රැකියා නියුක්තිය යන ක්ෂේත්‍රවල

සාධාරණ ලෙස සාර්ථකත්වයක් ලබා ගැනීමට නම් බහුතර ජනතාවගේ භාෂාව ඉගෙන ගැනීමට සුළුජන කොටස්වල ළමයින්ට අවස්ථාව ලබා දිය යුතු ය. ඔවුන්ගේ ප්‍රජාවේ සංස්කෘතියත් ඔවුන්ගේ ම පැවැත්මත් පුස්තකාලයේ ඇති පොත් මගින් නිරූපණය වනු ඔවුන්ට දකීමට හැකි විය යුතු ය. සුළුජන කොටස්වලට අයත් ළමයින් පිළිබඳ කථා පොත් තෝරා ගැනීමට පුස්තකාලයාධිපති උත්සාහ කළ යුතු ය. සුදුසු සාම්ප්‍රදායික කථා පොත් ද විවිධ ජන වර්ගයා පැවත ආ රටවල්, ආගම් සහ විවිධ ජන වර්ගයාගේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් ද තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය.

විශේෂ සැලකිල්ලක් දක්විය යුතු දෙ වන ළමා කාණ්ඩය වනුයේ, භාෂා දෙකක් කථා කරන අය යි. එනම් ඔවුන් ජීවත් වන රටේ භාෂාව පමණක් නො ව, ඔවුන්ගේ මව්පිය දෙ දෙනාගෙන් එක් අයකු හෝ දෙ දෙනාගේම හෝ භාෂාව කථා කරන අය යි. සුළු ජාතීන්ගේ භාෂාවන් ආරක්ෂා කිරීම සඳහා ඇති සැලකිල්ල දැන් වර්ධනය වෙමින් පවතී. බහුතර ජනතාවගේ භාෂාවට අමතර ව සුළු ජාතීන්ගේ භාෂාවලින් ලියැවුණු පොත් ද සෑම ළමා පුස්තකාලයක ම තිබිය යුතුය.

ආසියාවෙන් හා බටහිර ඉන්දීය දූපත්වලින් බ්‍රිතාන්‍යය වෙත කෙරෙන සංක්‍රමණය 1960 දී පමණ සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ විට ළමයින් කෙරෙහි වැඩි අවධාරණයක් යොමු කළේ ඔවුන්ට ඉංග්‍රීසි භාෂා හැකියාව ලබා දීම කෙරෙහිය. අධ්‍යාපන බලධාරීන්ගේ සාමාන්‍ය ප්‍රතිපත්තිවලට සහයෝගය දක්වීමක් වශයෙන් මෙම ළමයින්ගේ අත්දැකීම් හා පසුබිම් සම්බන්ධ ඉංග්‍රීසි පොත් ලබා දීමට මහජන පුස්තකාල අවධානය යොමු කළේය. කතන්දර, ජන කථා හා සරල තොරතුරු පොත් නිදසුන් වශයෙන් දක්විය හැකි ය. කෙසේ වුවත්, මෑත දී ඇති වූ අදහස් අනුව ආසියානු ළමයින් තමන්ගේ ම භාෂාව අත් නොහළ යුතුය. එම නිසා පන්ජාබි, හින්දි හා අනෙකුත් ආසියානු භාෂාවලින් පොත් ලබා දීමට සමහර පුස්තකාල උත්සාහ කරයි. මෙහි දී මතු වන ගැටලුව නම් එවැනි පොත් ප්‍රමාණවත් තරම් නොතිබීමත් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත පොත් තරම් ඒවා පෙනුමෙන් අලංකාර නොවීමත්ය.

ඉංග්‍රීසි භාෂාවෙන් පළ වන පොත් පහසුවෙන් සැපයිය හැකි නිසාත් අනෙකුත් භාෂාවලින් පළ වී ඇති පොත් ලබා ගැනීමට ඇති පෙළඹීම අඩු නිසාත් ඉංග්‍රීසි භාෂාවෙන් හැර අනෙකුත් භාෂාවලින් ළමයින්ට පොත් ලබා දීමේ ප්‍රතිපත්ති බ්‍රිතාන්‍ය පුස්තකාලවල වර්ධනය වී ඇත්තේ සෙමිනි. මේ හේතුව නිසා තම මව් භාෂාව ඉංග්‍රීසි නොවන ළමයින්ට විශාල පාඩුවක් සිදු වී තිබේ. ප්‍රංශ, ජර්මන්, ඉතාලි හෝ අනෙකුත් බටහිර යුරෝපීය භාෂාවලින් ලියැවී ඇති පොත්, ප්‍රාදේශීය පුස්තකාලවලින් සොයා ගැනීම ඉතා අසීරු වී තිබේ. එවැනි ප්‍රදේශවල ජාතික හෝ ප්‍රාදේශීය සහයෝගි සේවයන් සංවර්ධනය කිරීම සුදුසු ය.

ඕනෑ ම මහජන පුස්තකාලයක ප්‍රධාන ම ඉලක්කය විය යුත්තේ කියවීමේ හැකියාව දුර්වල ළමයින්ය. පසුබට පාඨකයන් සඳහා පොත් එකතුවක් ස්ථිර ලෙස ප්‍රදර්ශනය වන තැනක් හෝ පහසුවෙන් ලබා ගත හැකි තැනක් හෝ සෑම පුස්තකාලයක ම තිබිය යුතුය. ළමයින්ගේ වයස අවුරුදු දහය හෝ දොළහ හෝ වන විට විශේෂ පොත් අවශ්‍ය වේ. එම පොත් කියවීමට පහසු ඒවා විය යුතුය. එම පොත්වල මාතෘකා හා තේමාවන් සම වයසේ සිටින වැඩි හැකියාවක් ඇති ළමයින් කියවන පොත්වල මාතෘකා හා තේමාවන් සමඟ සමාන බවක් තිබිය යුතුය. පසු ගිය වසර දෙක තුන හෝ ඇතුළත මේ තත්ත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

විවේකීය ලෙස ළමයින් කියවන දෑ ගැන සලකා බැලීමේ දී, තොරතුරු-පොත් කියවීම සාපේක්ෂ වශයෙන් අඩු බව පෙනී ගොස් ඇත. කෙසේ වුවත්, 1950 දශකයේ පටන් ළමා තොරතුරු-පොත් ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති වී තිබේ. ළමයින් කැමැත්තක් දක්වන්නට ඉඩ ඇති හෝ ඔවුන්ට අවශ්‍ය තොරතුරු සැපයෙන හෝ බොහෝ මාතෘකා යටතේ විවිධ මට්ටම් සඳහා දූන් පොත් සංඛ්‍යාවක් පළ වී ඇත.

ප්‍රබන්ධ නොවන පොත් තෝරා ගැනීමේ දී ළමයින්ගේ අවශ්‍යතාවන් හා හැකියාවන් පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. ළමයින් කැමැත්තක් දක්වන විෂයයන් පිළිබඳ පොත් හා පාසල්

විෂයමාලාවට ගැළපෙන පොත් ලබා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

ළමයින් සඳහා තොරතුරු පොත් ලිවීමේ දී මූලික පිවිසුම් දෙකක් තිබේ. කර්තෘ එම විෂය පිළිබඳ පිළිගත් විශේෂඥයකු විය හැකි ය. එසේ නැති නම් ළමයින්ට තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ ගුරු විශේෂඥයකු විය හැකි ය. පිවිසුම් දෙක ම අවශ්‍යයෙන් ම වැරදි නො වේ. අවශ්‍ය කරුණු තෝරා ගැනීමටත් විෂය කෙරෙහි උනන්දුවක් ඇති කරවීමේත් පාඨකයින්ට කථා නො කොට, ඔවුන් සම්බන්ධකර ගැනීමේත් හැකියාවක් කර්තෘට තිබිය යුතු ය. මෑත වසරවල දී කතන්දර පිවිසුම ඒතරම් සාර්ථක වී නැත. එනමුත් අවධානය ලබා ගැනීමටත් එම අවධානය රඳවා තබා ගැනීමටත් එය ඉතා ඵලදායී ක්‍රමයකි. ප්‍රසිද්ධ ප්‍රකාශකයින්ගේ පොත්වල ඇති දෝෂ තිබෙන්නේ, නොසැලකිලිමත්කමට වඩා, අනවශ්‍ය ලෙස සරලව කිරීමට උත්සාහ ගැනීම නිසා ය.

තොරතුරු-පොත් තිබෙන්නේ හුදෙක් ම නොකඩවා කියවීමට වඩා, ප්‍රයෝජනය සඳහා ය. පොත්වල පටුනක්, සූචියක් හා වැඩිදුර කියවීම සඳහා පොත් ලැයිස්තුවක් ද ඇතුළත් කිරීමෙන් පොත ප්‍රයෝජනයට ගැනීම වඩාත් පහසු වේ. රූපසටහන් පැහැදිලි විය යුතු මෙන් ම තොරතුරුවලට අදාළ විය යුතු ය. වර්ණවත් රූප සටහන් අනිවාර්යයෙන් ම යෙදිය යුතු යම්යම් මාතෘකා තිබේ. සමහර ළමා තොරතුරු පොත්වල දෝෂවලට හේතු වී ඇත්තේ මෙම මූලධර්ම පිළිබඳ අවබෝධය මදිකමයි. එසේ නැති නම් පොතේ වියදම හැකි තරම් පහළ මට්ටමක තබා ගැනීමට ඇති අවශ්‍යතාව යි. මෙම කරුණු, රූප සටහන් ක්‍රමය තෝරා ගැනීම හා රූපසටහන් යෙදීම කෙරෙහි බල පායි.

තොරතුරු පොත්වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරනුයේ කාණ්ඩ වශයෙනි. එහි ඇති වාසිය නම්, නිෂ්පාදන වියදම අඩු කර ගැනීමටත් පොත්වල මිල පහළ මට්ටමක තබා ගැනීමටත්හැකි වීම ය. එසේ වුවත්, යම් කිසි පොතකට අයත් සියලු ම කාණ්ඩ කට්ටලයක සමාන මාතෘකාවන්ට අයත් කරුණු එක් එක් කාණ්ඩයේ ඇතුළත් වන්නේ නම්, නිදසුන් වශයෙන්

විදේශ රටවල් පෙළක් ගත හොත් සෑම රටක් පිළිබඳ ව ම රසවත් කරුණු, සමාන ප්‍රමාණයෙන් තිබේ යැයි සිතීම අපහසු ය.

ඊට අමතර ව ශබ්දකෝෂ, ලෝක සිතියම් හා දේශීය සිතියම් ළමයින්ගේ ප්‍රයෝජනය සඳහා තිබිය යුතුය. ඒවා මගින් අත්‍යවශ්‍ය තොරතුරු සැපයෙනවා පමණක් නොව, අනාගතය සඳහා වටිනා පුහුණුවක් ද ලැබේ. ළමයින් සඳහා සැලසුම් කළ වෙළුම් ගණනාවකින් යුතු උසස් විශ්වකෝෂ තිබේ.

තොරතුරු ද්‍රව්‍ය තෝරා ගැනීමේදී ඒවායේ ප්‍රයෝජනවත් බව තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. පත්‍රිකා, බිත්ති සටහන්, රූප සටහන් හා ඡායාරූප මගින් උසස් ප්‍රයෝජන ලබාගැනීමට ළමයින්ට හැකි ය. විශේෂයෙන් ම පාසලේ ව්‍යාපෘති වැඩවල දී අවශ්‍ය වන ඒවා ඉතා ප්‍රයෝජනවත් වේ. මහජන පුස්තකාල සම්බන්ධයෙන් බලන විට ඇති විශාල ම ගැටලුව නම් මෙම ද්‍රව්‍ය පාලනය කිරීම යි. එමෙන්ම දූෂණය සංරක්ෂණය හා කාන්තා අයිතිවාසිකම් වැනි සමකාලීන වැදගත් කමක් ඇති මාතෘකා ද තිබීම අවශ්‍යවේ. ජාතික ආයතනවලින් වාණිජ ආයතනවලින් හෝ වෙනත් ආයතනවලින් නොමිලේ ලබාගත හැකි ඉතා ප්‍රයෝජනවත් ද්‍රව්‍ය තිබේ.

ළමයින්ගේ විනෝදය හා දනුම සඳහා සකස් කරන ලද තැටි හා පටි බොහෝ පුස්තකාල විසින් මිල දී ගනු ලැබුවත් ඒවා ළමයින්ට ලබා දෙන්නේ කලාතුරකිනි. අනෙකුත් පුස්තකාල කටයුතු මෙන් ම සංගීත හා කතන්දර ඇතුළත් කැසට්පට ද පුස්තකාලයේ දී භාවිත කළ හැකි ය. ස්කැන්ඩිනේවියාවේ ළමා පුස්තකාලවල මෙය පොදු ලක්ෂණයකි. බොහෝ පාසල් පුස්තකාලවල දනට මත් ශ්‍රව්‍ය මාධ්‍ය ඇත. පුස්තකාලය විසින් ඒවා දෙමාපියන්ට ද නිකුත් කරනු ලැබේ. සෑම නිවෙසක ම වාගේ ටේප්රෙකෝඩර් යන්ත්‍ර තිබෙන නිසා පොත් නිකුත් කරන ආකාරයෙන් ම කැසට්පට නිකුත් කිරීමට පුස්තකාලයාධිපතිට හැකි වේ. වෙනත් ද්‍රව්‍ය පරිහරණය කළ නොහැකි ආබාධිත

ළමයින්ටත් මහජන පුස්තකාලවල සාමාන්‍යයෙන් සේවයක් නොලැබෙන අන්ධ ළමයින්ටත් කැසට්පට නිකුත් කිරීමෙන් පුස්තකාල සේවය දියුණු කළ හැකිය.

චිත්‍රපට එකතුන් පවත්වා ගෙන යන මහජන පුස්තකාල සාමාන්‍යයෙන් ඒවා නිකුත් කරන්නේ සංවිධානාත්මක සමූහවලට පමණි. කෙසේ වුවත් ස්ලයිඩ්-රූප කට්ටල සහ චිත්‍රපට බහුල ව ඇති බැවින් මේ සම්බන්ධ ප්‍රතිපත්ති ද අඛණ්ඩ ව සමාලෝචනයට ලක් කළ යුතු ය. ශ්‍රව්‍ය දෘශ්‍ය ක්ෂේත්‍රය කෙතරම් ශීඝ්‍රයෙන් වර්ධනය වන්නේ ද යත්, ළමයින්ට පොත් නිකුත් කරන අන්දමට ම, ස්ලයිඩ්-රූප කට්ටල සහ චිත්‍රපට ද ඔවුන්ට නිකුත් කළ යුතු කාලය ළඟදීම උදා වනු ඇත.

චිත්‍රපට හා ශ්‍රව්‍ය ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී පදනම් කර ගත යුතු මිනුම් දඬු, මුද්‍රිත ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී යොදා ගත යුතු මිනුම් දඬුවලට ඉතා සමාන විය යුතු ය. මෙම ද්‍රව්‍යවලින් ළමයින්ගේ උනන්දුව උත්තේජනය වෙයි ද? ඒවා නිවැරැදි ද? අලුත් ද? ඒවා පාඨකයින්ට අදාළ ද? ඒවා ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය අතින් අවශ්‍ය තත්ත්වයේ තිබේ ද? සමූහවලට ඒවා පහසුවෙන් භාවිත කළ හැකි ද? ගෙවන මුදලට ඒවා වටී ද? ළමයින් සඳහා ප්‍රායෝජනවත් වන මාධ්‍ය කීපයක් යොදා ගත හැකි විෂයක් නම් දේශීය අධ්‍යයන යි. ළමයාගේ සමීප පරිසරයට සම්බන්ධ බැවින් ඉතිහාසය, භූගෝලය, සමාජ අධ්‍යයනය, ස්වාභාවික ඉතිහාසය වැනි විෂයයන් උගෙනුම පටන්ගැන්මට කදිම වේ. විශේෂිත නගර හා දේශීය ස්ථාන පිළිබඳ පොත් කීපයක් ළමයින් සඳහා ලියැවී ඇත. දේශීය අධ්‍යයනවලට ද අදාළ විය හැකි ළමා පොත් හඳුනාගත හැකි තත්ත්වයක් ළමා පුස්තකාලයාධිපති සතු විය යුතුය.

ගොඩනැගිලි හා ජලමාර්ග දෙස බැලිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ප්‍රායෝගික පොත් ද දේශීය මාළිගා හෝ දේශීය කර්මාන්ත පිළිබඳ පොත් ද චරිතාපදාන ආදිය ද උදාහරණ වශයෙන් දක්විය හැකිය. වැදගත් ගොඩනැගිලි පිළිබඳ පත්‍රිකා

හා අනෙකුත් දේශීය ස්ථාන, විශේෂයෙන් අතීතයේ පැවති ගොඩනැගිලි හා සමාන ගොඩනැගිලි සහිත ඡායාරූප ප්‍රයෝජනවත් වේ. මෙය පාසල් කටයුතුවලට මහජන පුස්තකාලවලට කාර්යක්ෂම ලෙස සහාය විය හැකි ක්ෂේත්‍රයකි. ඇතැම් රටවල මෙම සේවය සපයනු ලබන්නේ දේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගිනි. මෙම සේවය සැපයීමේ දී ළමා පුස්තකාලයාධිපති ඊට සම්බන්ධ වන අතර, එහි ප්‍රචාරය සඳහා ද හවුල් වෙයි.

විශේෂයෙන් ම ළමයින් සඳහා වූ සඟරා සංඛ්‍යාව ඉතා සුළු ය. වැඩිහිටියන් සඳහා සැලසුම් කළ සඟරා කෙරෙහි ද ළමයින් රුචියක් දක්වීමට පුළුවන. පොදු රුචිකත්වයක් ඇති හොඳ තත්ත්වයේ සඟරා වැඩි වශයෙන් චිත්‍රකථා සඟරා වේ. මෑතක් වන තුරු ම මේවා මහජන පුස්තකාලවලින් බැහැර දෙයක් ලෙස සැලකිණි. සමහර මහජන පුස්තකාල චිත්‍රකථා සඟරාවල සුළු එකතුවක් අත්හදා බැලීමක් ලෙස සපයා ඇත. එවැනි එකතුවක් පවත්වා ගෙන යාමේ එක් අරමුණක් නම්, පුස්තකාලය වෙත නොපැමිණෙන ළමයින් පුස්තකාලය වෙත ඇද ගැනීම යි. තවත් අරමුණක් නම්, ප්‍රථම වරට පුස්තකාලයට පැමිණෙන ළමයින්ට කියවීමට හුරුපුරුදු යමක් ලබා දීම යි.

හය වන පරිච්ඡේදය

# පොත්පත් : ප්‍රමිති

"කුඩාතම පරිපාලන ඒකකවල යටත් පිරිසෙයින් පාඨකයකුට වෙළුම් තුනක් වත් බැගින් තිබීම අවශ්‍යය. එහෙත් පාඨක සංඛ්‍යාව වැඩි වත් ම එකී අවශ්‍යතාව ද අඩුවනු ඇත. පාඨකයකුට වෙළුම් දෙකක් බැගින් තිබීම, සතුටුදායක සාමාන්‍ය ප්‍රමිතියකි. වයස අවුරුදු 14 දක්වා වූ ළමයින් සංඛ්‍යාව මුළු පාඨක ගහනයෙන් සියයට 25ක් 30ක් පමණ වන බැවින්, මුළු පොත් තොගයෙන් දළ වශයෙන් තුනෙන් පංගුවකට පමණ ඒකී ප්‍රමිති බල පැවැත්විය යුතුය. සියයට 30කට අධික ළමයින් සංඛ්‍යාවක් සිටින විට, ඊට අනුරූප ලෙස වැඩි වෙළුම් සංඛ්‍යාවක් අවශ්‍ය විය යුතුය." (ඉෆ්ලා ප්‍රමිති 1973)

ළමයින් සම්බන්ධයෙන් සලකන විට වඩාත් වැදගත් වනුයේ, ඕනෑම විටෙක ප්‍රයෝජනය සඳහා ගැනීමට රාක්කවල අහුරා ඇති පොත්ය. එහි ඉතා කුඩා එකතුවක් තිබීමෙන් පොදු අවශ්‍යතා ඉටු නො වේ. ඉතා විශාල එකතුවක් ඔවුන්ට දරා ගත නොහැකි තරම් විය හැකියි. පොත් ඉතා හොඳින් තෝරා ගෙන ඇත්නම් පොත් 1500ක එකතුවක් ළමයින් වැඩි දෙනකුගේ අවශ්‍යතා පිරිමැසීමට ප්‍රමාණවත් වේ. 5000කට අධික පොත් ප්‍රමාණයක් වර්ග කොට තිබුණත් එය වුමනාවට වඩා විශාල විය හැකිය. එක ම පොතේ පිටපත් අනවශ්‍ය තරම් තිබීම නිසා මුළු පොත් සංඛ්‍යාව වැඩිවීමට හේතු වන බැව් පෙනී යා හැකි ය. එම නිසා නියම එකතුව පොත් 1500ත් 5000ත් අතර විය යුතු යැයි යෝජනා කර තිබේ. කුඩා ම පුස්තකාලය (ජංගම පුස්තකාලය හැර) පොත් 1500කින් ද විශාල ම පුස්තකාලය පොත් 5000කින් ද යුක්ත විය යුතු යැයි ද යෝජනා කර තිබේ. නිකුත් කරන ලද අතිරේක පොත් එකතුව ශේෂය වේ. විශේෂිත මාතෘකා පිළිබඳ විශේෂිත පොත් සඳහා කෙරෙන ඉල්ලීම් ඉක්මනින් ඉටු කිරීමට හැකි වන පරිදි පහසුවෙන් ලබා ගත හැකි වෙන ම පොත් එකතුවක් තිබිය යුතුය.

සියලු ම වර්ගවල පුස්තකාලවල පොත් නොවන ද්‍රව්‍යවල වැදගත්කම වැඩි වෙමින් පැවතියත් ළමා පුස්තකාලයක විශාල ම කොටස සමන්විත වන්නේ පොත්වලිනි. නුදුරු අනාගතයේ දී ද එය එසේ ම වනු ඇත. පොත් එකතුවේ ප්‍රමාණය කලින් ඡේදයේ සඳහන් කරන ලදී. කුඩා ළමයින් සඳහා පින්තූර පොත් තිබිය යුතුය. කියවීමට හැකියාව ඇති ළමයින් සඳහා කියවීමට පහසු පොත් තිබිය යුතු ය. එම පොත් අතර, වයසින් වැඩි ළමයින් හා නව යොවුන් වියේ පසු වන ළමයින් සඳහා නවකථා හා විවිධ කථා පොත් ද තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ පොත් එකතුවක් ද තිබිය යුතුය. එමෙන් ම විශේෂ ළමා සමූහවල අවශ්‍යතා කෙරෙහි ද අවධානය යොමු කරනු ඇත.

පොත් තෝරා ගැනීමේ ප්‍රතිපත්තිය ළමා පුස්තකාලයේ අරමුණු අනුව තීරණය වේ. එක් අරමුණක් නම් ළමයින් හැකි තරම් ප්‍රමාණයක් අතර, කියවීමේ රුචිය වර්ධනය කිරීමයි. ඒ සඳහා සරල වූත් පහසුවෙන් කියවිය හැකි වූත් සිත් ගන්නාසුලු පොත් බහුල වශයෙන් සැපයීම අවශ්‍ය වේ. සිත් ගන්නාසුලු පින්තූර හා පහසුවෙන් කියවිය හැකි කථා මඟින්, පොතක් රස විඳීමට තුඩු දෙන ස්වභාවයක් ලැබේ. එමෙන් ම ළමයින්ට උසස් කියවීමේ හැකියාවක් ලබා දීමට එය උපකාරී වේ. අනෙක් අරමුණ නම්, පොත් හා අනෙකුත් ද්‍රව්‍ය යනු දැනුම ලබා ගැනීමේ ප්‍රයෝජනවත් මාර්ගයක් බව ළමයින්ට අවබෝධ කරවීමයි. ළමයින් හා යෞවනයන් කෙරෙහි උනන්දුවක් දක්වන නියෝජිතායතනවලට උදවු කිරීමේ අවශ්‍යතාවය මඟින් පොත් එකතුව හා විවිධ අංශවල පොත් සංඛ්‍යාව කෙරෙහි බලපානු ඇත. ක්‍රීඩා සමාජ, පාසල් හෝ තරුණ සමාජ වැනි ආයතනවලට පොත් නිකුත් කිරීමේ සේවයක් තිබේ නම්, එම සමූහවල අවශ්‍යතා අනුව, පොත්පත් තොග වර්ධනය කළ යුතුය.

පොත් තෝරා ගන්නා සෑම අවස්ථාවක මං මූලික අරමුණ විය යුත්තේ ළමයින්ගේ මූලික අවශ්‍යතාවලට සරිලන ආකාරයේ එකතුවක් ඒ ඒ පුස්තකාලවලට ලබා ගැනීම යි. කලින් අසා ඇති කථාවක් කියවීම, පොත් කීපයක් පමණක් කියවා ඇති ප්‍රබන්ධ පොත් පෙළක වෙනත් පොතක් කියවීම, විශේෂ උනන්දුවක්

දක්වන මාතෘකාවක් පිළිබඳ පොතක් කියවීම, අවශ්‍ය තොරතුරු හෝ විනෝදය හෝ සඳහා පොතක් කියවීම යනාදිය ළමයින්ගේ අවශ්‍යතා විය හැකිය. මේ අකාරයේ පුළුල් අරමුණක් ඉටු කර ගැනීමේ දී කුඩා පුස්තකාලයකට නියත වශයෙන් ගැටලු ඇති විය හැකිය. ළමා සම්භාව්‍ය කෘතිවල පිටපත් කීපයක් තිබීම අවශ්‍ය වේ. කාණ්ඩ වශයෙන් පළ වූ කෘතිවල සම්පූර්ණ පොත් සංඛ්‍යාව තිබිය යුතුය. කාණ්ඩ කීපයකින් යුත් පොත් සම්බන්ධයෙන් සමහර පුස්තකාල දක්වන ආකල්පය එතරම් පැහැදිලි නැත.

කෙසේ වෙතත් ළමා පොත් පරිහරණය කිරීමට ළමයින්ට අවස්ථාව සලසා දීමේ අරමුණ ඉටු කළ හැකි එක් ආයතනයක් නම් මහජන පුස්තකාලයයි. ළමයින්ට ත්‍යාග වශයෙන් ලබා දෙන පොත් ළමයින්ට පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි උසස් මට්ටමේ ජනප්‍රිය ප්‍රබන්ධ කථා වැනි ඒවා විය යුතු ය. ප්‍රයෝජනවත් පොත්පත් ලබා ගැනීම පාසල්වල එක් සුළු කාර්යයක් පමණි. හොඳ ළමා පොත් සම්බන්ධයෙන් සමහර ගුරුවරුන්ට ඇත්තේ විශේෂඥ පුස්තකාලයාධිපතීන්ට සමාන දැනුමකි. ප්‍රමිතීන් වැදගත් සේ සැලකුව හොත්, තෝරා ගන්නා සෑම පොතක් ම හොඳ පොතක් යැයි සහතික කිරීමෙන් ප්‍රමිතීන් පහසුවෙන් ම පැනවිය හැකි ස්ථානය මහජන පුස්තකාලය වේ.

පුස්තකාල සඳහා කිසි සේත් තෝරා නොගන්නා සමහර පොත් තිබේ. සෑම පොතක් ම පොත් එකතුවේ ඊට නිසි ස්ථානයේ තැබිය යුතු අතර එම පොත්, ගෙවන මුදලට වටිනා පොත් විය යුතුය. විවිධ හේතු නිසා පොත් ප්‍රතික්ෂේප විය හැකිය. පොතේ භෞතික ස්වරූපය අසතුටුදායක විය හැකිය. බොහෝ ළමා පුස්තකාල විසින් සවිමත් සැකසුමෙන් යුත් පොත් වැඩි ප්‍රමාණයක් මිල දී ගනු ලැබේ. ඇත්ත වශයෙන් ම පින්තූර පොත් මිල දී ගැනීමේ එක ම පිරිමැසුම්දායක මාර්ගය මෙය වේ. පොත් නිෂ්පාදනයේ ගුණාත්මක බව, කඩදාසිවල හා පොත් බැඳීමේ තත්ත්වය, පොතේ මුද්‍රණ රටාව හා අකුරුවල ප්‍රමාණය වැනි කරුණු කෙරෙහි ද ළමා පුස්තකාලයාධිපතිවරු සැලකිලිමත් වෙති. කඩදාසි පිටකවර (paper backs) සහිත පොත් ලබා ගැනීම සම්බන්ධයෙන් ළමා පුස්තකාලයාධිපතීහු වැඩි කැමැත්තක්

දක්වති. මෙම ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල පර්යේෂණ නොමැති වුවත් නිරීක්ෂණයෙන් හා පළ පුරුද්දෙන් පෙනී ගිය කරුණක් නම් එක ම පොතේ ඝනකම් පිටකවර සහිත වෙළුමක් කියවීමට අකමැති ළමයින් කඩදාසි පිටකවර සහිත වෙළුම කියවීමට වැඩි කැමැත්තක් දක්වන බව යි.

සමහර අවස්ථාවල දී පොතේ බාහිර ස්වරූපය එහි අන්තර්ගතයට යෝග්‍ය නොවන ආකාරයෙන් පවතී. යම් කිසි පොතක් පින්තූර පොතක් මෙන් පෙනුණත් එහි අන්තර්ගත කරුණු වයසින් වැඩි ළමයින් සඳහා නම්, එවැනි පොත් තෝරා ගැනීම යෝග්‍ය නොවේ. ඊට හේතුව එවැනි පොත්වලින් ළමයින්ට එතරම් ප්‍රයෝජනයක් නොවීම යි. එය කුඩා ළමයින් සඳහා වන පොතක් ලෙස බාහිර ස්වරූපයෙන් පෙනෙන නිසා වයසින් වැඩි ළමයින් ද එය ප්‍රතික්ෂේප කරනු ඇත.

ළමයින්ගේ සිත් නොගන්නා එහෙත් ඉතා වටිනා සමහර පොත් තිබේ. ළමයින් තුළ ඇති එම ආකල්පය වෙනස් කිරීමට පුස්තකාලයාධිපතිට නොහැකි නම්, එවැනි පොත් මිල දී ගැනීම මුදල් නාස්ති කිරීමකි. විදේශීය භාෂාවලින් පරිවර්තනය කරන ලද පොත්වල ශෛලිය හා නම් ආදිය නුහුරු නිසා ළමයින් ඒවා ප්‍රතික්ෂේප කිරීමට නැඹුරු විය හැකි නිසා ඒවා මිල දී ගැනීම ද නිෂ්ප්‍රයෝජන විය හැකි ය. යම් වර්ගයක කථා පොත් නොමැති වීම, යම් පොත් පෙළක ප්‍රමාණවත් පොත් වෙළුම් සංඛ්‍යාවක් නොතිබීම වැනි කරුණු සම්බන්ධ පැමිණිල්ලක් හැර, පොත් එකතුව සම්බන්ධයෙන් ළමයි විවේචන ඉදිරිපත් නො කරති. පුස්තකාලයාධිපති අනුකම්පා සහගත අයකු නම් එම විවේචනවලට සවන් දී විකල්පයන් යෝජනා කිරීමට සූදානම් වනු ඇත. පොත් තෝරා ගැනීම කෙරෙහි බලපාන විවේචන ලැබෙන්නේ වැඩිහිටියන් ගෙනි. බ්‍රිතාන්‍ය ළමා පුස්තකාලයාධිපතීහු විශාල වශයෙන් මහජන විවේචනවලින් නිදහස් ව සිටින අය වෙති. නමුත් ඔවුන් මහජන විවේචන පිළිබඳ ව සැලකිල්ලක් නොදක්විය යුතු යැයි මෙයින් අදහස් නොකෙරේ. මෙයින් අදහස් කරන්නේ ඔවුන් තෝරා ගන්නා පොත් සම්බන්ධයෙන් යහපත් ආකල්පයක් ඔවුන් තුළ තිබිය යුතු බවයි.

ළමා පුස්තකාල සඳහා තෝරා ගෙන ඇති පොත් සම්බන්ධයෙන් බාහිරින් ඇති වන විවේචනවලට ප්‍රධාන හේතු කීපයක් තිබේ. යම් යම් සමාජ ආකල්ප, වැරදි භාෂාව, ලිංගික කරුණු වැනි දෑ අඩංගු පොත්පත් එම පුස්තකාලවල තිබීම මෙම හේතු වශයෙන් දැක්විය හැකිය. නිරුවත් පින්තූර, ලිංගික සම්බන්ධතා හෝ ලිංගික අවයව හා සම්බන්ධ කරුණු අඩංගු ලිංගික අධ්‍යාපනික පොතක් මෙම පුස්තකාල සඳහා තෝරා ගෙන තිබුණ හොත් මහජන විවේචන එල්ල වීමට ඉඩ තිබේ. වසර කීපයකට පෙර ළමයින් සඳහා ප්‍රකාශයට පත් කළ පොත්වලින් එම කරුණු ඉවත් කරන ලදී. එනමුත් මෑතකදී නැවත වරක් ඒ සම්බන්ධයෙන් ලිහිල් ආකල්පයක් වර්ධනය වී ඇති බව පෙනේ. එවැනි කරුණු අඩංගු පොත්පත්වලින් තම එකතුව ආරක්ෂා කර ගැනීමට ළමා පුස්තකාලයාධිපති වග බලා ගත යුතුය. වැරැදි කරුණු අඩංගු පොත් ද වැඩිහිටියන් විසින් විවේචනය කිරීමට ඉඩ තිබේ. එමෙන් ම සමහර පොත්පත්වල අඩංගු ක්‍රියා ළමයින් අනුකරණය කළ හොත් එයින් භයානක ප්‍රතිඵල අත් විය හැකිය. එවැනි පොත් ද වැඩිහිටියන්ගේ විවේචනයට ලක්වේ.

ඇතැම් ආකල්ප කෙරෙහි අනුබල දක්වන දෑ අඩංගු ළමා පොත් ද විවේචනයට භාජනය වීමට පුළුවන. කලින් පැවති ආකාරයට ළමා ප්‍රබන්ධ කථා පැහැදිලිව ම උපදේශාත්මක නොවුවත් එමඟින් සදාචාර මට්ටමේ දියුණුවක් සහ සමස්තයක් වශයෙන් නිදහස් අදහස් ප්‍රකාශයක් ඇති වේ. 1965න් පසු ප්‍රකාශයට පත් ළමයින් සඳහා ම ලියැවුණු ප්‍රබන්ධවලින් පමණක් ළමයින්ට බලපෑමක් ලැබුණේ නම්, සුළු ජාතීන් කෙරෙහි යහපත් ආකල්ප ඇති හා ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්පූර්ණයෙන් ම විරුද්ධ පරම්පරාවක් නියත වශයෙන් ම බිහි වීමට ඉඩ තිබිණි. කෙසේ වුවත් සමහර පොත් පිළිබඳ ව නැවත වරක් පරීක්ෂා කර බැලීම අවශ්‍යවේ.

ලිංගික අදහස් ඇති කරවන ළමා පොත් සම්බන්ධයෙන් පවතින පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉතා අසීරු කාර්යයක් වී තිබේ. අවුරුදු දහස් ගණනක් තිස්සේ ගැහැනු හා

පිරිමි ලිංගික භූමිකා පිළිබඳ ව අදහස් මුල් බැස ගෙන ඇත. අද පවා ලිංගික භූමිකා පැහැදිලි ලෙස වෙන් කිරීම සම්පූර්ණයෙන් ම අයහපත් දෙයක් නොවන බව, සැලකිය යුතු ජන සංඛ්‍යාවක් විශ්වාස කරති. කෙසේ වුවත්, ලිංගික භූමිකා පිළිබඳ අදහස් ඇති නොකරන පොත් නිර්දේශ කිරීම මගින් මෙම ගැටලුව තරමක් දුරට අඩු කිරීමට පුස්තකාලයාධිපතිට හැකිවේ.

ඉහත සඳහන් කරන ලද ආකාරයේ විවේචනවලට භාජනය නොවන අන්දමේ පොත් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් හොඳ ප්‍රසිද්ධියක් ලබා ඇති ප්‍රකාශකයින් කෙරෙහි විශ්වාසය තැබීමට ළමා පුස්තකාලයාධිපතිට හැකිය. හොඳ ම ප්‍රතිපත්තිය නම් පොත් මිල දී ගැනීමට පෙර, ඒවා පරීක්ෂාකාරිව සෝදිසි කිරීම යි. පොතක් සම්බන්ධයෙන් යම් කිසි අනුමානයක් ඇති නම් එය ප්‍රතික්ෂේප කළ හැකි ය. පොත් එකතුවට ගැළපේ යැයි හැඟෙන පොත් තෝරා ගැනීම කෙරෙහි පුස්තකාලයාධිපති සිය අවධානය යොමු කළ යුතුය.

පුස්තකාලයාධිපතීන් ප්‍රතික්ෂේප කරන පොත් සම්බන්ධයෙන් සලකා බලන විට පෙනී යන එක් කරුණක් නම්, අපකීර්තිමත් ලේඛකයින්ගේ පොත්වලට වැඩිහිටියන්ගේ විවේචන සීමා වන බව යි. ප්‍රාදේශීය මෙන් ම ජාතික පුවත්පත් ද කලින් ප්‍රකාශ කළ කරුණක් නම්, පුස්තකාල විසින් පොත් මිල දී ගනු ලබන්නේ කිසි යම් කර්තෘවරයකු මුල් කර ගෙන නොවන බව යි. මේ සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයේ කර්තෘන් හතර දෙනකු පිළිබඳ ව සඳහන් කළ හැකි ය. ඉනිඩ් බ්ලයිටන් (Enid Blyton) ඩබ්ලිව්. ඊ. ජෝන්ස් (W. E. Johns), රිච්මල් ක්‍රොම්ප්ටන් (Richmal Crompton) හා ෆ්‍රැන්ක් රිචඩ්ස් (Frank Richards) ඒ සිවු දෙනා වෙති. මුල් තුන් දෙනා කෙරෙහි ප්‍රතිචාරය වර්ධනය වූයේ 1950 ගණන්වල දී ය. බ්ලයින්ටන් සම්බන්ධයෙන් 'තහනමක්' පැන වීමට සිදු වූයේ ඇගේ විශාල ජනප්‍රිය භාවය හා පොත් විශාල සංඛ්‍යාවක් නිෂ්පාදනය වීම නිසාය. ඩබ්ලිව්. ඊ. ජෝන්ස්ගේ පොත් විවේචනයට භාජනය වූයේ යල් පැන ගිය අධිරාජ්‍යවාදී ආකල්ප ඇතුළත් වූ නිසාය. 'බිලි බන්ටර්' (Billy Bunter) යනු පාසල් කතා පෙළක වූ සුළු චරිතයකි. එය 1920 හා 1930

දශකවල පැවති චිත්‍රකථා පත්‍රවල පළ විය. ජෝර්ජ් ඕවෙල් (George Orwell) විසින් 1940 දී එය විවේචනයට ලක් කර ඇත. පොත් පෙළක හා චිත්‍රකථාවල බන්ටර් වීර චරිතයක් බවට පසු ව පත් විය. එම පොත් සඳහා විශාල ඉල්ලුමක් පැවති අතර වැඩිහිටි පුස්තකාලවල ඒවාට ඉහළ තැනක් ලැබිණි. ක්‍රොම්ප්ටන්ගේ 'විලියම්' කථා පොත් පෙළ පිළිබඳ ව තේරුම් ගැනීමට ඉතා දුෂ්කරය. ඒවායේ හොඳින් ගොඩනගන ලද හාස්‍ය රසයෙන් පිරුණු කෙටි කථා විය. එවැනි වෙනත් පොත් හිඟ විය. එහෙත් ඒවා ජනප්‍රිය නොවීමට හේතු වූයේ, එම වෙළුම්වල ගුණාත්මක බව අඩු වීමත් එම කථාවල වීර චරිතයේ ස්වභාවය හා කථා විලාසය, මීට අවුරුදු හතළිහකට පෙර සිටි වැඩිහිටියන් අතර එතරම් පිළිගැනීමකට ලක් නොවූ නිසාත්ය.

කෙසේ වුවත්, පොත් තෝරා ගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කර ගැනීමට බ්‍රිතාන්‍ය ළමා පුස්තකාලයාධිපතීන්ට ඉඩ දී තිබේ. පොත් තෝරා ගැනීමේ දී ඔවුන් ගන්නා තීරණ යහපත් හේතුන් මත පදනම් වේ. එම නිසා බොහෝ විට විවේචනවලට භාජනය නොවී සිටීමට ඔවුන්ට හැකි වී තිබේ. එහෙත්, අවශ්‍යතාවක් ඇති වුව හොත් එම ප්‍රතිපත්ති නැවත සලකා බැලීමට ඔවුන් සූදානමින් සිටිය යුතුය.

## හත් වන පරිච්ඡේදය

# පොත්පත් : තෝරා ගැනීමේ ක්‍රියාවලිය

පොත්පත් තෝරා ගැනීමේ දීත් ලබා ගැනීමේ දීත් ළමා පුස්තකාල විසින් කටයුතු කළ යුතු ආකාරය මෙම පරිච්ඡේදයේ දී කෙටියෙන් විස්තර කෙරේ. කලින් පරිච්ඡේද දෙකෙහි සඳහන් කර ඇති ආකාරයට පොත්පත් තෝරා ගැනීම ළමා පුස්තකාලයාධිපතිගේ වැදගත් කාර්යවලින් එකකි. ප්‍රජාවේ අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයේ සමබර පොත් එකතුවක් තිබීම අවශ්‍යය. එමෙන් ම ගුරුවරුන්ටත් දෙමාපියන්ටත් ළමයින්ටත් කාර්යක්ෂම ලෙස උදවු කිරීමට හැකි වන පරිදි පුස්තකාලයාධිපති විසින් ළමා පොත් පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගත යුතු ය.

වියදම නියම ආකාරයෙන් සැලසුම් කර ගැනීමට හැකි වන පරිදි මුදල් වර්ෂය ආරම්භයේ දී ම ළමා පුස්තකාල පොත් සඳහා මුදල් වෙන් කර ගත යුතුය. අලුතින් ප්‍රකාශයට පත් වන පොත් මිල දී ගැනීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් සෑම වර්ෂයක ම වෙන් කර ගත යුතුය. මුදල් වර්ෂය අවසානයේ දී පැවැත්වීමට බලාපොරොත්තු වන විශාල පොත් ප්‍රදර්ශනයක් හෝ නව පුස්තකාල සේවා ස්ථානයක් පිහිටුවීමට හෝ පැරණි සේවා ස්ථානයේ පුළුල් කිරීමක් හෝ වැනි දේ සඳහා ද මුදල් වෙන් කළ යුතුය.

ළමයින් සමඟ කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීමක් ඇති කාර්ය මණ්ඩලයේ සියලු ම නිලධාරීන් පොත්පත් තෝරා ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ විය යුතුය. එසේ සම්බන්ධ වීම කාර්ය මණ්ඩලයේ දියුණුවට ද හේතුවේ. පොත්පත් තෝරා ගැනීමේ දී, වැඩි අත්දැකීමක් නැති අයට කණ්ඩායමේ පළපුරුදු අයගෙන් බොහෝ දේ ඉගෙන ගත හැකිය. පොත්පත් හා වෙනත් ද්‍රව්‍ය මිල දී ගැනීමට පෙර ඒවා පරීක්ෂා කිරීමට අවස්ථාවක් තිබිය යුතුය. එමෙන් ම මතභේදයට තුඩු දෙන පොත්පත් සම්බන්ධයෙන්

සාකච්ඡා කිරීමට ද අවකාශ තිබිය යුතු ය. පොත්පත් මිල දී ගැනීමේ ක්‍රියාවලියේ දී සමහර ප්‍රකාශකයන් විසින්, අනුමත පිටපත් සේවයක් (Approved Copy Service) පුස්තකාල වෙත දෙනු ලැබේ. මෙම ක්‍රමය යටතේ එකඟත්වයකට පැමිණි යම් කිසි කාලපරිච්ඡේදයක් තුළ, පුස්තකාලය විසින් එම පොත් රඳවා තබා ගෙන පසුව ආපසු යවනු ලැබේ. තෝරාගැනීමේ පිටපත් සේවයකට (Selection Copy Service) සමහර පුස්තකාල ප්‍රිය කරයි. එහි දී බොහෝ අලුත් පොත්වලින් තනි පිටපත බැගින් මිල දී ගනු ලැබේ. මෙම ක්‍රමය නාස්ති සහගත සේ බැලූ බැල්මට පෙනුණත්, පොත් ආපසු පොත් වෙළෙන්ද වෙත යැවීමට සිදු නොවීම වාසියක් වේ. පුස්තකාලයේ පොත් තෝරා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූල වන්නේ කවර පොත් ද යන්න පිළිබඳ ව පොත් වෙළඳුන් වෙත උපදෙස් ලබා දීම මගින් නාස්තිය අඩු කර ගත හැකිය. නැත හොත් පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු, වරින් වර පොත් සැපයුම්කරුවන් හෝ පොත් වෙළඳුන් හෝ වෙත ගොස් මිල දී ගත යුතු පොත් කලින් තෝරා ගත හැකි ය. තෝරාගත් හෝ අනුමත හෝ පිටපත් තෝරා ගැනීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට පෙර ඒවා කියවීම සඳහා විශේෂඥ ළමා පුස්තකාලයාධිපතීන් වෙත යැවිය හැකිය. එම පොත් කියවන ලද හෝ පරීක්ෂා කරන ලද හෝ විශේෂ ළමා පුස්තකාලයාධිපති විසින් තෝරා ගැනීමේ කමිටුවේ දී එම පොත් පිළිබඳ කෙටි හැඳින්වීමක් කළ යුතු ය. පොතේ කර්තෘ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට හෝ ප්‍රශ්න ඇසීමට හෝ කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ට හැකි ය. මේ ආකාරයෙන් සලකා බලනු ලබන පොත් පිළිබඳ ලිඛිත අගැයීම් වාර්තාවක් තබා ගැනීම වැදගත්වේ. පොත් ලැයිස්තු සකස් කිරීමේ දී හා සමහර පොත්, එකතුවෙහි ඇතුළත් නොවන්නේ ඇයි ද යන්න පිළිබඳ ව කරුණු දැක්වීමේ දී මෙම අගැයීම් වාර්තා ප්‍රයෝජනවත් වේ.

පොත් තෝරා ගැනීමේ කමිටු රැස්වීම් පවත්වන වාර ගණන හා තෝරා ගන්නා පිටපත් හෝ අනුමත පිටපත් හෝ යොදා ගන්නා ආකාරය එම ප්‍රදේශයේ භූගෝලීය ස්වභාවය මත

සහ පොත් තෝරා ගන්නා විශේෂඥ ළමා පුස්තකාලයාධිපති කණ්ඩායමේ ප්‍රමාණය ද මත රඳා පවතී. සන්නිවේදනය එතරම් දියුණු නැති ප්‍රදේශවල, අනුමත පිටපත් හෝ තෝරා ගන්නා පිටපත් කට්ටල් දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් හෝ තිබීම යෝග්‍ය ය. එම රැස්වීම් ප්‍රාදේශීය මට්ටමින් ද සතියකට වරක් වෙනුවට මසකට වරක් පැවැත්විය හැකිය.

ඇණවුම් කිරීමට පෙර පොත් දක්නට අවස්ථා ලැබෙන නිසා, ඇණවුම් කරන අවස්ථාවේ දී වර්ගීකරණ අංකය තීරණය කළ හැකිය. වර්ගීකරණ අංකය ද ඇණවුම් පතෙහි සඳහන් කළ හැකිය. මහජන පුස්තකාල සේවා ස්ථානවලට හා පාසල් පුස්තකාල සේවාව සඳහා එක්වර පොත් ඇණවුම් කිරීම පිරිමැසුම් දායකවේ. යම් කිසි පොතකින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීමට තීරණය කළ විට, එම පොත ඇණවුම් කර, එම පිටපත් ලැබුණු පසු, සැකසුම් අංශය විසින් ඒවා සකස් කරනු ලැබේ.

වඩාත් හොඳ සේවාවක් ලබා ගත හැක්කේ එක් ග්‍රන්ථ නාමයකින් පිටපත් කීපයක් එක වර සැපයිය හැකි පොත් සමාගම් වලින් බව පෙනී ගොස් ඇත. වාර්ෂික මුදල් ප්‍රතිපාදනවලින් අඩකට වැඩි ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ අලුතෙන් ප්‍රකාශයට පත් නොවූ පුස්තකාල ද්‍රව්‍ය මිල දී ගැනීමටයි. පොත් මිල දී ගැනීමේ දී පාඨක ඉල්ලීම් ද පදනම් කර ගත යුතු ය. එසේ නැති නම් නැවත තොග ගැනීමේ ක්‍රමානුකූල වැඩ සටහනක් ක්‍රියාත්මක කළ හැකිය. මෙම ක්‍රම දෙක ම ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍යවේ. සෑම මාසයකට ම වරක් පුස්තකාල පද්ධතිය තුළ ඩිවි අනුපිළිවෙළ හා අකාරාදී අනුපිළිවෙළ පරීක්ෂාකර බලා පොත් එකතුව සැලකිය යුතු තරම් ඒකාකාර ප්‍රමිතියකට ගෙන ආ යුතුය.

පොත් එකතුවේ ඇති අලුත්වැඩියා කළ යුතු පොත් ද යල් පැන ගිය පොත් ද භාවිත නොවන පොත් ද පිළිබඳ ව නිතර පරීක්ෂා කළ යුතු යි. දකුම්කලු හා ප්‍රාණවත් ගතියෙන් යුතු පොත් එකතුවක් පවත්වා ගෙන යාමේ අරමුණ ඇති ව කටයුතු කළ යුතු යි. අලුත් පුස්තකාලයක් සඳහා පොත් එකතුව ගොඩනැගීමේ

දී පුස්තකාලයට අවශ්‍ය වන විවිධ වර්ගයේ ප්‍රබන්ධ හා ප්‍රබන්ධ නොවන පොත් පිළිබඳ ව සැලකිලිමත් වීම අවශ්‍ය වේ. අලුත් පුස්තකාලයක පොත් එකතුව සම්පූර්ණයෙන් ම අලුත් පොත්වලින් යුක්ත වීම යෝග්‍ය නොවේ.

ළමා පොත් තෝරා ගැනීම විශාල වශයෙන් පොත් මත ම පදනම් කර ගන්නා නිසා ඒවා පිළිබඳ තොරතුරු මූලාශ්‍රවල අවශ්‍යතාව සමහර අවස්ථාවල දී පැහැර හරිනු ලැබේ. එබැවින් ළමා පුස්තකාල ද්‍රව්‍ය නිෂ්පාදනය කරන පොත් ප්‍රකාශකයන් හා මෘදුකාරක නිෂ්පාදකයන් පිළිබඳ කාලීන නාමාවලියක් ළමා පුස්තකාලය විසින් පවත්වා ගෙන යා යුතුය. එවන් නාමාවලි තිබීමේ අරමුණ විය යුත්තේ, ඒවායේ සඳහන් තොරතුරු මූලාශ්‍රයන් ලෙස භාවිත කිරීමත් පොත්වල මුද්‍රණය හා මිල පිළිබඳ ව තොරතුරු සැපයීමත්ය.

ළමා පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ බොහෝ ග්‍රන්ථ නාමාවලි අලංකාර ලෙස සකස් කර ඇත. පොත්වල කර්තෘන් හා රූප සටහන් පිළිබඳ තොරතුරු ද ඒවායේ ඇතුළත් වේ. පොත් සෙවීමේ දී එම තොරතුරු මහ පෙන්වීමක් ලෙස යොදා ගත හැකිය. ඕනෑ ම කාලපරිච්ඡේදයක් තුළ ප්‍රකාශයට පත් වන ළමා පොත් සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් සුළු ප්‍රමාණයකි. එම නිසා ප්‍රධාන පුස්තකාල ද්‍රව්‍ය සපයන සැපයුම්කරුවන්ගේ ලැයිස්තු මගින් දැනට පවතින පොත් පිළිබඳ වැදගත් ග්‍රන්ථ විඥාපන තොරතුරු ලබා ගත හැකි වේ.

ජාතික ග්‍රන්ථ නාමාවලි සේවාවන්ට ද සාමාන්‍යයෙන් ළමා පොත් ඇතුළත් කෙරේ. සමහර පුස්තකාලයාධිපතීහු මේ ආකාරයේ සේවාවන්වලින් විශාල ප්‍රයෝජන ලබා ගනිති. මේ ආකාරයේ විමර්ශන ග්‍රන්ථ, වෘත්තීය සංවිධාන හෝ පුස්තකාල හෝ විසින් ම සම්පාදනය කරනු ලබයි. ග්‍රන්ථ නාමාවලී, පොත් ලැයිස්තු ආදි විමර්ශන කෘති කාලීන විය යුතු ය. ළමා පුස්තකාලවල දී වැඩි අවධාරණයක් යොමු කරනු ලබන්නේ දැනට පවතින හා පහසුවෙන් මිල දී ගත හැකි පොත් පිළිබඳ ව යි.

ළමා පොත් පිළිබඳ සමාලෝචන අඩංගු වාරසඟරා පිළිබඳ ව සලකා බැලීම ද වැදගත් වේ. සමහර සමාලෝචන සාමාන්‍ය පාඨකයා සඳහා වන අතර, සමහර ඒවා ඉතා විශේෂිත වශයෙන් ලියන ලද ඒවා වේ.

කෙසේ වුවත් වැදගත් අලුත් පොත් පුළුල් වශයෙන් සමාලෝචනයට ලක් කරනු ලැබේ. පොත් නොවන මාධ්‍ය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දී අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සම්පාදනය කරන ලද පොත් ලැයිස්තු හා වාර සඟරා ප්‍රයෝජනවත් වේ. තොරතුරු මූලාශ්‍ර හෝ පොත් ලැයිස්තු ද පොත් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සම්පාදනය කළ හැකිය.

අටවන පරිච්ඡේදය

# වැඩිහිටි සේවාවක් වශයෙන් ළමා පුස්තකාලය

පුස්තකාලයාධිපතිගේ සෘජු බලපෑමක් ලැබෙන ළමයින්ගේ සංඛ්‍යාව හැම විට ම සුළුය. මහජන පුස්තකාලවල පවා කාර්යවලින් වැඩි කොටසක් ඉටු කරනු ලබන්නේ, විශේෂඥතාවක් නොමැති පුස්තකාලයාධිපතීන් විසිනි. සේවාස්ථ පුහුණු මගින්, හැකි තරම් කාර්යක්ෂම ලෙස වැඩ කිරීමට ඔවුන්ට හැකි වී ඇත.

කෙසේ වුවත්, ළමා පොත් පිළිබඳ ව හා ළමයින්ගේ කියවීමේ වර්ධනය පිළිබඳ ව පුළුල් දැනුමක් ඇති, ප්‍රජාවේ සිටින පුද්ගලයා විශේෂඥ ළමා පුස්තකාලයාධිපතිය. මෙම විශේෂඥ දැනුමෙන් වැඩි ප්‍රමාණයක් ලබා ගන්නේ මූලික පුහුණු අවධියේ දී වන අතර පාඨමාලා හැදෑරීම හා ඉහළ සුදුසුකම් ලබා ගැනීම වැනි මාර්ගවලින් ද රැකියාව තුළින් හා පෞද්ගලික උනන්දුව වැනි අවිධිමත් මාර්ගවලින් ද එම විශේෂඥ දැනුම අලුත් කර ගනු ලැබේ. ළමා පුස්තකාලවල සේවාවන්ගෙන් ප්‍රයෝජන ලබා ගත හැකි ප්‍රධාන වැඩිහිටි සමූහ දෙකක් නම් ගුරුවරුන් හා දෙමාපියන්ය. ගුරුවරුන් සඳහා සේවා සැපයීමේ දී පාසල්, පාසල් පුස්තකාල සංගම්වල ප්‍රාදේශීය ශාඛා, ගුරු සංවිධාන, ගුරු පුහුණු ආයතන හා විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතාවන් ගොඩනඟා ගත යුතුය. දෙමාපියන්ට සේවා සැපයීමේ දී දෙමාපිය හවුල්වලට කථා කිරීමට අවස්ථා සලසා ගැනීමත් ළමා පොත් සංගම් වැනි සංවිධානවල කටයුතුවලට සහයෝගය දීමත් වැනි ක්‍රියාමාර්ගවලින් එය ආරම්භ කළ හැකිය. මේ පිළිබඳ ව හා අනෙකුත් වැඩිහිටි සංවිධාන පිළිබඳ ව වඩා විස්තරාත්මක ලෙස ඊ ළඟ පරිච්ඡේදයේ දී සාකච්ඡා කරනු ඇත. මෙහි දී අප විසින් සලකා බලන ලද්දේ ළමා පුස්තකාලයාධිපති විසින් වැඩිහිටියන්ට කෙළින් ම දෙනු ලබන සේවා පිළිබඳවයි.

ළමා පොත් කියවීම හා සම්බන්ධ යම් යම් අංශ පිළිබඳ ව විස්තර කරන මෙන් ළමා පුස්තකාලයාධිපතිගෙන් ඉල්ලා සිටිය හැකිය. සෑම කණ්ඩායමකට ම එම කණ්ඩායමට ගැළපෙන ආකාරයට එම තොරතුරු ළමා පුස්තකාලයාධිපතිගෙන් ලබා ගත හැකිය. ක්‍රීඩක කණ්ඩායම්, ගුරුවරුන්, උනන්දුවක් දක්වන දෙමාපියන් මෙම කණ්ඩායම සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකිය. මේ සෑම දේශනයක දී ම පොත්පත් හා යෝග්‍ය පොත් නාම ලේඛන උපයෝගී කර ගත හැකිය.

පුස්තකාලයාධිපතීන් නොවන අය වඩාත් උනන්දු කිරීමේ හොඳ ම ක්‍රමයකි, ළමා පොත් කියවීමට සැලැස්වීම හා ඒවා පිළිබඳ සාකච්ඡා කිරීම. යම් කිසි පොතක් කියවීමට උනන්දු කිරීමට, තමා එම පොත කලින් කියවා තිබීම නිසා පහසු වනු ඇත. ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන වැඩිහිටියන්ට සමහර විට සවස පන්ති මාලාවක් පැවැත්විය හැකි ය. එසේ නැත්නම් ගුරුවරුන් සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලාවකට සහයෝගය දැක්විය හැකි ය. ක්‍රියාකාරකම් වැඩසටහන්වල කොටසක් වශයෙන් සාකච්ඡා කණ්ඩායම් පුස්තකාලය තුළ සංවිධාන කළ හැකි ය.

හවුලේ කියවන පවුල් (Family Reading Groups) පිළිබඳ අදහස මුලින් ම ඉදිරිපත් වූයේ 1972 දී ය. එය ක්‍රියාත්මක කරන ලද්දේ නැගෙනහිර යෝක්ෂයර් ප්‍රදේශයේය. එහි අරමුණ වූයේ උසස් නවීන ළමා පොත්පත් පිළිබඳ ව දෙමාපියන් දැනුවත් කිරීමත් වැඩියෙන් කියවීම සඳහා ළමයින් ධෛර්යවත් කිරීමත් පොත් කියවීමෙන් ලැබෙන සතුට ළමයින් හා දෙමාපියන්ට බෙදා හදා ගැනීමට අවකාශ සැලසීමත්ය. ඉන් පසු වෙනත් ආයතන කීපයක් විසින් ද ඒ ආකාරයේ ම හවුල් පිහිටුවන ලදී. පොත් පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන රැස්වීමට පෙර එම පොත්, එම හවුලේ සාමාජිකයන් අතර බෙදා දෙනුලැබේ. පුස්තකාලයක් හෝ පාසලක් හෝ පදනම් කර ගෙන මෙම හවුල් පිහිටුවා ගත හැකි ය. යම් කිසි සැසි වාරයක දී සාකච්ඡා කිරීමට නියමිත සියලු ම පොත් කියවන ලෙස දෙමාපියන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පොත් ප්‍රදර්ශන ද මෙහි දී උපයෝගී කර ගත හැකිය. එමගින් ඊට සහභාගි වන ළමයින්ට කෙළින් ම ප්‍රයෝජනයක් ලැබේ.

පෙර පාසල් වියේ දරුවන් සිටින බොහෝ මවුවරුන්ට තනිකමක් දනෙන විට පුස්තකාලයේ රැස්වීම්වලට පැමිණීමෙන් ඔවුන්ට විනෝදයක් ලැබිය හැකිය. මෙවැනි අවස්ථාවක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙ දෙනකු යොදා ගැනීම ප්‍රයෝජනවත් වේ. මවුවරුන් සඳහා රැස්වීම් සංවිධාන කිරීමට එක් අයකු යොදා ගත යුතු අතර තවත් අයකු ළමයින්ට සහාය වීම සඳහා යෙදිය යුතුය.

කෙසේ වුවත්, දෙමාපියන් හා ගුරුවරුන් හැරුණු විට විවිධ හේතූන් නිසා ළමා පොත් පිළිබඳ ව උනන්දුවක් දක්වන වෙනත් අය ද සිටිති. ශිෂ්‍යයන්, පර්යේෂකයන්, කර්තෘන්, පොත් වෙළෙඳුන්, පොත් ප්‍රකාශකයන් වැනි අය සහ උපදෙස් හා තොරතුරු ලබා ගැනීමේ මාර්ගයක් ලෙස පළාතේ මහජන පුස්තකාලයේ සේවය බලාපොරොත්තු වන අය ද මේ සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකිය. එම නිසා වැඩිහිටි පාඨකයන් සඳහා අරමුණු කර ගත් ළමා පොත් කියවීම හා සම්බන්ධ සේවාවක් සෑම මහජන පුස්තකාලයක ම තිබිය යුතු ය. එමෙන් ම මෙම සේවාව ළමා පුස්තකාලයට සම්බන්ධ කළ යුතු ය. මෙම සේවාව සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා දෙකක් නම් ළමා පොත් එකතුවක් හා ළමා පොත් හා කියවීම් පිළිබඳ ද්‍රව්‍ය එකතුවක් ය. එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ ළමා සාහිත්‍යය පිළිබඳ අධ්‍යයන විවිධ අධ්‍යයන මට්ටම්වල දී ඉතා වැදගත් කොට සලකනු ලැබේ. එනමුත් මෙම අධ්‍යයන සඳහා ඇති පහසුකම් ඉතා අඩු මට්ටමක පවතී. මීට ප්‍රධාන හේතුව ළමා පොත් එකතුන් දියුණු කර ඇත්තේ ශිෂ්‍යයන්ගේ රුචි අරුචිකම් අනුව නො ව, ළමයින් සඳහා එම පොත් කෙතරම් අදාළ වන්නේ දැයි පමණක් සැලකීම අනුව නිසයි.

මුද්‍රිත පිටපත් සොයා ගැනීමට අපහසු ළමා පොත් හා නැවත මුද්‍රණය වන ළමා පොත් වල මිල ගණන් ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. එනමුත් පරිත්‍යාග, මිල දී ගැනීම් ආදිය මගින් පුස්තකාල විසින් ගොඩනගා ගත් ඓතිහාසික ළමා පොත් එකතුන් කීපයක් තිබේ. අඩු වශයෙන් මේ ආකාරයේ කුඩා පොත් එකතුවක් වත් ගොඩනගා ගැනීමට ඕනෑ ම පුස්තකාලයකට හැකි ය. ඓතිහාසික වටිනාකමක් ඇති පැරණි ළමා පොත්වලට

ඇති වී තිබෙන නව උනන්දුව නිසා, ඒ පොත් නැවත මුද්‍රණය කර ඇත. මෙම පොත් ද එකතුවට ඇතුළත් කළ හැකි ය. ඒ ආකාරයේ එකතුවක් ගොඩනඟා තිබෙන බව නියත අයුරින් ප්‍රසිද්ධියට පත්වුවහොත්. කාර්ය මණ්ඩලයත් මහජනතාවත් පොත් තව තවත් පරිත්‍යාග කිරීමට ධෛර්යවත් වනු ඇත. සම්මාන හෝ ත්‍යාග හෝ ලබා ඇති ළමා පොත් සම්බන්ධයෙන් ළමයින්ට වඩා වැඩිහිටියෝ සාමාන්‍යයෙන් උනන්දුවක් දක්වති.

අලුතෙන් මුද්‍රණය වන පොත් සඳහා වෙන ම එකතුවක් තිබිය යුතුය. කලින් කලට එම එකතුව අලුත් කළ යුතු අතර පැරණි පොත් ක්‍රමානුකූල ව ඉවත් කළ යුතුය. එම එකතුවට ම සම්බන්ධ කොට වත්මන් ප්‍රකාශකයන්ගේ නාමාවලියක් ද පවත්වා ගෙන යාම ප්‍රයෝජනවත් වේ.

එමෙන් ම ළමා සාහිත්‍යයේ ඉතිහාසය හා ඒ පිළිබඳ විවේචනාත්මක කෘති, ප්‍රකාශයට පත් කළ පොත් නාමාවලි හා පොත් ලේඛන (ප්‍රධාන එකතුන් පිළිබඳ නාමාවලීන් ද ඇතුළු) හා ප්‍රදර්ශන නාමාවලි ඇතුළත් එකතුවක් ද තිබිය යුතු ය. ළමා පොත් පිළිබඳ වාරසඟරා ද තිබිය යුතු ය.

පුවත්පත් ලිපිවල හා ඡායාරූපවල එකතුවක් ද ප්‍රයෝජනවත් ආකාරයෙන් ගොඩනැඟිය හැකි ය. අදාළ තොරතුරු පිළිබඳ ලිපි ගොණුවක් ද සම්පාදනය කළ යුතු ය. ජාතික හා ප්‍රාදේශීය සහයෝගිතා යෝජනා ක්‍රම පිළිබඳ ව හා ළමා පොත් ක්ෂේත්‍රයය අයත් සංවිධාන හා ආයතන පිළිබඳ තොරතුරු ඇතුළත් විශේෂ එකතුන් මෙම ලිපි ගොණුවට ඇතුළත් කළ හැකිය.

ඒ ආකාරයේ විමර්ශන එකතුවක් මඟින් කාර්යක්ෂම තොරතුරු සේවයක් ලබා දීමට පුස්තකාලයට හැකිවේ. බොහෝ ඉල්ලීම්වලට පිළිතුරු දීමටත් ළමා පුස්තකාලයාධිපතිට හැකිවේ. දේශන පැවැත්වීමේ දී හා ප්‍රදර්ශන පැවැත්වීමේ දී අවශ්‍ය සම්පත් එම එකතුන්ගෙන් ලැබීම විශේෂඥ කාර්ය මණ්ඩලයට අතිශයින් වැදගත් වේ.

නවවසන පරිච්ඡේදය

# අනෙකුත් නියෝජිතායතන මඟින් ළමයින්ට සේවා සැපයීම

තමන්ගේ ම කැමැත්තෙන් පුස්තකාලවලට නොපැමිණෙන ළමයින්ට සේවා සැපයිය හැකි එක් මාර්ගයක් නම් ළමයින් කෙරෙහි උනන්දුවක් දක්වන නියෝජිතායතන, සංවිධාන හා ආයතන මඟින් ක්‍රියා කිරීම යි. මෙම ආයතන සමඟ විවිධාකාරයෙන් සහයෝගිතා ඇති කර ගත හැකි ය. ද්‍රව්‍ය එකතුන් ළමයින්ට ලබා දිය හැකිය. ළමයින් සාමාන්‍යයෙන් හමු වන ස්ථානවල දී හෝ පුස්තකාලයේ දී හෝ දේශන, සාකච්ඡා නැති නම් කතාන්දර කීමේ වැඩ සටහන් සංවිධාන කළ හැකිය. ඒ සංවිධානවල ම පොත් එකතුවක් කාර්යක්ෂම ලෙස දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපදේශක සේවයක් ලබා දීමට පුස්තකාලයාධිපතිට හැකිය. විශේෂ ළමා කණ්ඩායම් සඳහා පවත්නා පුස්තකාල සේවා සඳහා හොඳ ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය. එවැනි ප්‍රසිද්ධිය ලබා දිය හැකි හොඳ ක්‍රමයක් නම් සුදුසු සංවිධාන හෝ ආයතන හෝ මඟිනි.

## පෙර පාසල් ළමයි

කථාවල හෝ පොත්වල අඩංගු අත්දැකීම් පෙර පාසල් ළමයින්ට ඉතා වැදගත් වේ. කියවීමේ රුචිකත්වය පිළිබඳ බීජ වපුරනු ලබන්නේ ළමයා පාසල් යාමටත් පෙරය. උසස් භාෂා පළපුරුද්දක් ළමයා ලබා ගන්නේ පොත් හඬනගා කියවීම, පොත් දෙස බැලීම, ඒවා පිළිබඳ ව කතාබහ කිරීම ආදී ක්‍රියාවන් මඟිනි. මෙම කටයුතුවල දී ළමයා සමඟ එක් වීම සඳහා කාරුණික වැඩිහිටියකු අවශ්‍යවේ.

තම දෙමාපියන් විසින් කැඳවා ගෙන එනු ලැබුවොත් විනා, පාසල් යන වයසට අඩු ළමයින් සාමාන්‍යයෙන් පුස්තකාලයකට පැමිණේ යැයි සිතිය නො හැකිය. කෙසේ වුවත්, පෙර පාසල් ළමයින්ට පුස්තකාලයට සම්බන්ධ විය හැකි බවත් එම ළමයින්

සඳහා පුස්තකාලයේ පොත් ඇති බවත් බොහෝ දෙමාපියෝ නො දනිති. දෙමාපියන්ට කෙළින් ම උදවු කිරීමට අමතර ව, දිස්ත්‍රික් හෙදි නිලධාරීන්ගේත් සෞඛ්‍ය නිලධාරීන්ගේත් පෙර පාසල් ක්‍රීඩා පිටි උපදේශකවරුන්ගේත් පෙර පාසල් ළමයින් පිළිබඳ පාඨමාලා පවත්වන විද්‍යාලවලත් සහාය ලබා ගැනීමට පුස්තකාලයාධිපතිට හැකිය. පෙර පාසල් ළමයින්ගෙන් විශාල සංඛ්‍යාවක් යම් යම් සංවිධානවල ක්ෂේත්‍රයට අයත් බව පෙනේ. මෙම සංවිධාන සමග සහයෝගිතාවක් ඇති කර ගැනීමෙන් ළමයින් විශාල සංඛ්‍යාවක් වෙත ළඟා වීමට මහජන පුස්තකාලයට හැකියාව ලැබේ.

සමහර ළමයි දුරකුම් මධ්‍යස්ථානවලට හෝ බාලාංශ පන්තිවලට පැමිණෙති. දුරකුම් පාසල් හා දුරකුම් පන්ති කීපයක් රජය මගින් පවත්වා ගෙන යනු ලැබේ. එහෙත්, බ්‍රිතාන්‍යයේ මේ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී නැති අතර, මෑතක ඇති වූ ආර්ථික වාතාවරණය යටතේ ඒවාට නොයෙක් බාධක එල්ල වී ඇත. පෞද්ගලික දුරකුම් පාසල් කීපයක් ද ඇත. පෙර පාසල්වල සෙල්ලම් කණ්ඩායම්වලට පැමිණීමට ළමයින් වැඩි සංඛ්‍යාවක් නැඹුරුවක් දක්වති. බ්‍රිතාන්‍යයේ පෙර පාසල් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද්දේ 1960 ගණන්වල ආරම්භයේ දී ය. දනට එය පුළුල් වශයෙන් ක්‍රියාත්මක වේ. සෙල්ලම් කණ්ඩායම් කුඩාය. ළමයින් පැමිණෙන සෑම වාරයක දී ම දෙමාපියන් විසින් ගාස්තුවක් ගෙවනු ලැබේ. දේවස්ථාන, ප්‍රජා මධ්‍යස්ථාන, පෞද්ගලික නිවාස හා පුස්තකාල ආදී ස්ථානවල පවා මේවා සංවිධානය කරනු ලැබේ. මෙම ස්ථාන පරීක්ෂාවට ද ලක් කරනු ලැබේ. සෙල්ලම් කණ්ඩායම් ප්‍රාදේශීය සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කළ යුතුය. සෙල්ලම් කණ්ඩායම්වල සංවිධායකට සාමාන්‍යයෙන් වැටුපක් ගෙවනු ලබන නමුත් ඔහු වැඩි වශයෙන් ම යැපෙන්නේ ස්වේච්ඡා ආධාර මතයි. සෙල්ලම් කණ්ඩායමට පැමිණෙන ළමයින්ගේ දෙමාපියන්ගේ ආධාර මෙහි දී විශේෂයෙන් ම වැදගත් වේ. මධ්‍යම පන්තිය කෙරෙහි වැඩි පක්ෂපාතිත්වයක් දක්වන ස්වයං ආධාර ලබන සංවිධානයක් ලෙස සෙල්ලම් කණ්ඩායම් ව්‍යාපාරය ආරම්භ වුවත් සමාජානුයෝජනය පිළිබඳ පලපුරුද්දත් නිර්මාණශීලිත්වයත්

වඩා පුළුල් භාෂා ව්‍යවහාරයත් ලබා දීම ආදි කරුණු සම්බන්ධයෙන් සෙල්ලම් කණ්ඩායම්වල වටිනාකම වහා හඳුනා ගන්නා ලදී. පළාත් අධිකාරී ආයතන හා පුණ්‍යායතන විසින් මෙම සෙල්ලම් කණ්ඩායම් සඳහා අරමුදල් සපයා අධ්‍යාපනික වශයෙන් ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ප්‍රදේශවල පිහිටුවන ලදී. ඒ සඳහා ගාස්තු ගෙවීමට ආර්ථික ශක්තියක් නොමැති ළමයින්ගේ ගාස්තු පළාත් අධිකාරී ආයතන විසින් ගෙවනු ලැබේ. සෙල්ලම් කණ්ඩායම් හා සුරැකුම් පාසල් දෛනික ව විවෘත ව තබන කාලය, සාමාන්‍ය පාසල් කාලයට වඩා සාමාන්‍යයෙන් අඩු නිසා, පූර්ණ කාලීන ව රැකියාවේ නියුතු මවුවරුන්ට ඒවායින් සැලසෙන ප්‍රයෝජනය සුළුය. එම නිසා රැකියාවල නියුතු මවුවරු දිවා සුරැකුම් මධ්‍යස්ථානවල පිහිට පතති. එහෙත් පවතින ඉල්ලුම සපුරාලීමට තරම් ප්‍රමාණවත් මධ්‍යස්ථාන නොමැති නිසා උදේ සිට සවස් වන තුරු ළමයින් රැක බලා ගන්නන්ගේ ද පිහිට පතති. සාමාන්‍යයෙන් ඒ අය වග කියනු ලබන්නේ ළමයින් දෙ දෙනකුට හෝ තුන් දෙනකුට හෝ පමණි. බොහෝ විට මේ අය ද මවුවරු වෙති. මේ අය නීතිමය වශයෙන් ලියා පදිංචි විය යුතුය. ඔවුන්ගේ නිවාස පරීක්ෂණවලට ද භාජනයවේ.

සුරැකුම් හෙදියන් හා සුරැකුම් ගුරුවරුන් සඳහා පිළිගත් පූර්ණ කාලීන පුහුණු පාඨමාලා තිබේ. සෙල්ලම් කණ්ඩායම්වල නායකයන් හා සහායකයන් සඳහා කෙටි කාලීන පාඨමාලා තිබේ. මෑතක සිට බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සංස්ථාවේ ද සහයෝගය ඇති ව ළමයින් රැක බලා ගන්නන් සඳහා ද පාඨමාලා සංවිධානය කර ඇත. මේ සෑම පාඨමාලාවකට ම සම්බන්ධ වීමට ළමා පුස්තකාලයාධිපතිට හැකිය. කාර්යයන් කීපයක් මඟින් පුස්තකාලයාධිපතිට පාඨමාලාවලට සම්බන්ධ විය හැකි ය. ළමයින්ට කතන්දර කීමේ හා කියවීමේ වැදගත්කම පිළිබඳ ව කථා කිරීම. කණ්ඩායම් වලට කතන්දර කීමේ කලාව පිළිබඳ ව කථා කිරීම, සුදුසු පොත් හඳුන්වා දීම යනාදිය එම කටයුතු වේ. කණ්ඩායම් වෙත ගොස් කතන්දර කීමට වඩා පුහුණු පාඨමාලාවකට සහභාගි වීම පුස්තකාලයාධිපතිගේ කාලය වඩා ඵලදායී ලෙස යෙදීමක් විය හැකි යි. එසේ වුවත් වරින් වර

ප්‍රදර්ශන පැවැත්වීමත් දෙමාපිය රැස්වීම්වල දී කථා පැවැත්වීමත් ප්‍රයෝජනවත් හා අවශ්‍ය කාර්යයන් වේ. සෙල්ලම් කණ්ඩායම් වලටත් සුරැකුම් මධ්‍යස්ථාන වලටත් ළමයින් රැක බලා ගන්නන්ටත් පොත් නිකුත් කළ හැකිය. මේ ආයතන හෝ ළමයින් රැක බලා ගන්නන් හෝ පුස්තකාලය නුදුරින් පිහිටා ඇත්නම් ධෛර්යවන්ත ළමයින් එහි රැගෙන ඒමට කළ හැකිය.

ළමයින් රැක බලා ගන්නන් වෙනුවෙන් බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සංස්ථාව ඉදිරිපත් කළ වැඩ සටහන් සඳහා සකස් කරන ලද පොත්වල මහජන පුස්තකාල ප්‍රයෝජනයට ගත යුතු බැව් විස්තර වේ.

පෙර පාසල් ළමයි බොහෝ දෙනෙක් තම මවුවරුන් සමඟ සෞඛ්‍ය මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සායනයකට හෝ යති. මෙම ස්ථාන මවුවරුන් මුණ ගැසීම සඳහා හොඳ ස්ථාන වේ. පුස්තකාලයාධිපතීන් දෙ දෙනකුට පළාතේ ඇති සායනයකට නිතර යාහැකි නම්, මවුවරුන්ට කථා කිරීමට එක් පුස්තකාලයාධිපතිවරයෙකුට හැකි වන අතර, ළමයින්ට කථා කියවීමට හා පොත් පෙන්වීමට අනෙක් පුස්තකාලයාධිපතිට හැකිවේ. අඩු මිලට උසස් තත්ත්වයේ පොත් ලබා දීමෙන් සමහර පොත් වෙළඳුන් සහයෝගය දක්වා ඇත. කියවීමේ පුරුද්ද ඇති කිරීමේ දී ඊට ඉවහල් වන වැදගත් ම සාධකයක් නම් ළමයින්ට පොත්වල අයිතිය ලබා දීමයි. අඩු මිලට ලබා ගත හැකි ගුණාත්මක බැවින් උසස් විවිධ පොත් පිළිබඳ ව බොහෝ දෙමව්පියෝ නො දනිති. කුඩා ළමයින්ට මතු වන විශේෂ ප්‍රශ්න සඳහා විසඳුම් ලබා ගත හැකි පොත් මවුවරුන්ට පෙන්වා දිය හැකිවේ. වඩාත් ම උණුසුම් ප්‍රතිචාරයක් ලැබුණේ දරුකමට හදා ගත් ළමයින් සිටින දෙමාපියන් ගෙනි. ඊට හේතුව දරුකමට හදා ගැනීම පිළිබඳ ව එම දරුවන්ට විස්තර කර දීම සඳහා උදව් කර ගත හැකි පොත් තිබීමයි. බොහෝ නාගරික ප්‍රදේශවල දැනට බිහිවෙමින් පවතින මවු හවුල්වල ද විශේෂ ලක්ෂණයක් වන්නේ පොත්පත් හා සම්බන්ධ ක්‍රියාකාරකම්ය.

බ්‍රිතාන්‍යයේ වයස අවුරුදු පහට අඩු ළමයින් සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම දරන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව නො ව, සමාජ සේවා දෙපාර්තමේන්තුවයි. කෙසේ වුවත් ආකාර දෙකකට

විධිමත් අධ්‍යාපන පද්ධතිය ද සම්බන්ධවේ. පෙර පාසල් ළමයින්ගේ දෙමාපියන් සඳහා පුස්තකාල පොත් එකතුවක් පවත්වාගෙන යාමට සමහර ළදරු පාසල් කැමැත්තක් දක්වයි. ළමයින් සමඟ සම්බන්ධතාවක් ගොඩනඟා ගැනීමේ මාර්ගයක් ලෙස ප්‍රධාන ගුරුවරුන් ද මෙය පිළිගනු ඇත.

ප්‍රළාතේ රෝහලේ හෝ මාතෘ නිවාසයේ හෝ මවුවරුන් තම දරුවන් සමඟ සිටින අවස්ථාවල දී කතන්දර කියවීමේ අගය හා මවුවරුන්ට පුස්තකාලයෙන් ලබා දිය හැකි සහයෝගය පිළිබඳ ව පත්‍රිකා මවුවරුන්ට බෙදා දීම තවත් ක්‍රමයකි. එහෙත් මේ ක්‍රමය වඩාත් යෝග්‍ය වන්නේ ඇමරිකාවටයි. ඊට හේතුව එහි අලුත් මවුවරුන්ට තොරතුරු ලබා දීම පුරුද්දක් වශයෙන් සිදු කෙරෙන බැවිනි.

## පාසලෙහි ළමයි

බ්‍රිතාන්‍යයේ බොහෝ මහජන පුස්තකාල පද්ධතීන් විසින් ඉතා දියුණු පාසල් පුස්තකාල සේවයක් සපයනු ලැබේ. එයට මුදල් සපයනු ලබන්නේ අධ්‍යාපන කාරක සභාව මගිනි. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ නියෝජිත පදනමක් මත මහජන පුස්තකාල විසිනි. ඒ ආකාරයේ සේවාවක් මගින් සාමාන්‍යයෙන් පාසල්වලට යම් යම් ද්‍රව්‍ය ලබා දේ. එමෙන් ම මධ්‍යම මිල දී ගැනීමේ සේවයක් ද ඊට අමතර ව පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීම, සංවිධානය, භාවිතය හා පාසල් පුස්තකාල සැලසුම් කිරීම සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ටත් ගුරුවරුන්ටත් පුස්තකාලයාධිපතින්ටත් අධ්‍යාපන පරිපාලකයින්ටත් අවශ්‍ය උපදෙස් හා උදවු ලබා දීම ද සිදු කෙරේ.

පාසල් පුස්තකාල සේවය සාමාන්‍යයෙන් පාසල සමඟ කෙළින් ම කටයුතු කරයි. ඊට අමතර ව සෑම මහජන පුස්තකාල සේවා ස්ථානයක ම කාර්ය මණ්ඩල විසින් ප්‍රාදේශීය පාසල් සමඟ සම්බන්ධතාවක් ගොඩනඟා ගත යුතු ය. ඒ මගින් වයස අවුරුදු පහත් දහසයත් අතර සමස්ත ජනගහනය වෙත සේවය සැලසීමට පුස්තකාලයාධිපතිට හැකි වේ. සංක්‍රමණය වූ පවුල්වල ළමයින්, ආබාධිත ළමයින්, කියවීමේ අපහසුතා ඇති ළමයින්,

වැනි විශේෂ සමූහ වෙත සේවය සැලසීමේ ප්‍රයෝජනවත් මාර්ගයකි, පාසල් සමඟ වැඩ කිරීම. යම් කිසි උත්සාහයක් නොගත හොත්, මෙවැනි ළමයින්ට කිසි දිනෙක පුස්තකාලවලින් ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි වනු ඇත.

කෙසේ වුවත්, මහජන පුස්තකාල විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් ස්වාධීන ව ක්‍රියාත්මක වන නිසා ම සමහර ළමයි ඒවා අගය කරති. එම නිසා පාසල් පුස්තකාලවල නොමැති නිදහසක් මහජන පුස්තකාලවල තිබෙන බව පෙනේ. මේ කරුණු පිළිබඳ ව පුස්තකාලයාධිපති දැන සිටිය යුතුය. පුස්තකාලය පාසලේ තවත් කොටසක් පමණක් වීමට ඉඩ නොතැබිය යුතු ය. ප්‍රදේශයේ ගුරුවරුන් සමඟ හොඳ සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම මගින් ළමයින් විශාල ප්‍රමාණයක් එකම අවස්ථාවේ එකම තොරතුරු ලබාගැනීමට, පැමිණීම වැනි අවස්ථාවන් මඟහරවා ගත හැකි ය. ගුරු දෙගුරු සංගමයට ආරාධනා කිරීම මගින් හෝ සවස් කාලයක පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම ආදිය මගින් හෝ දෙමාපියන් සමග සම්බන්ධතාවක් වර්ධනය කර ගැනීමට පුස්තකාලයධිපතිට හැකි වේ.

ළමයින් විසින් පාසලේ දී කරනු ලබන නොයෙක් වැඩ, විශේෂයෙන් පුස්තකාලයෙන් ලබා ගත් දේ ප්‍රයෝජනයට ගෙන ඇති නම් ඒවා ප්‍රදර්ශනය කළ හැකිය. ඒ සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දීමෙන් ළමයින් මෙන් ම දෙමාපියන් ද පුස්තකාලයට පැමිණීම දිරිමත් කළ හැකිය. එවැනි බොහෝ ප්‍රදර්ශන කෙරෙහි ඔවුහු රුචියක් දක්වති. උදාහරණ වශයෙන් දේශීය අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රදර්ශනයක් දැක්විය හැකිය. ළමයින් විසින් කරනු ලද මේ නිර්මාණවල පිටපත් ලබා ගෙන අනාගත ප්‍රයෝජනය සඳහා පුස්තකාලයේ ගබඩා කර තැබීමට පුස්තකාලයාධිපතිට හැකිය. ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ගුරුවරුන් හා උපදේශකයන් සමඟ හොඳ සම්බන්ධතාවක් ගුරු මධ්‍යස්ථාන මගින් ගොඩ නඟා ගත හැකි ය. පසු ගිය දස වසර තිස්සේ බ්‍රිතාන්‍යයේ අධ්‍යාපන බලධාරීන් විසින් මේවා පිහිටුවා ඇත. ගුරුවරුන්ට එම ස්ථානවල දී හමු වී විෂයමාලා වැනි, වෘත්තීය කරුණු පිළිබඳ ව අවිධිමත් ලෙස සාකච්ඡා කිරීමටත්

පාඨමාලා දේශන ආදිය සංවිධාන කර ගැනීමටත් ප්‍රදර්ශන පැවැත්වීමටත් වටිනා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගබඩාකර තැබීමටත් ඒ මධ්‍යස්ථාන යොදා ගත හැකි ය. එම නිසා මෙම ගුරු මධ්‍යස්ථාන, පොත් ප්‍රදර්ශන පැවැත්වීමටත් පොත් හා පාසල් පුස්තකාල පිළිබඳ පාඨමාලා පැවැත්වීමටත් යෝග්‍ය ස්ථානවේ. සමහර ප්‍රදේශවල ඇති ගුරු මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් පවතින ගැටලු නිරාකරණය කර ගන්නා මධ්‍යස්ථාන වශයෙන් කටයුතු කරයි. උදාහරණ වශයෙන් බර්මිංහැම් නුවර ඇති භාෂා මධ්‍යස්ථානය දක්විය හැකි ය. ඉංග්‍රීසි භාෂාව දෙ වන භාෂාවක් වශයෙන් උගන්වන ගුරුවරු එහි සිට, ආසියාතු ළමයින් වැඩි ප්‍රමාණයක් සිටින පාසල් කරා යති. එසේ ගොස් එම පාසල්වල ගුරුවරුන් සඳහා පාඨමාලා සංවිධාන කරති. අනෙකුත් ගුරු මධ්‍යස්ථාන මගින් කලා, සංගීත හා නාට්‍ය උපදේශකයන් සඳහා පදනමක් සලසා දෙනු ලැබේ. ඔවුන්ගේ දැනුම පුස්තකාලයාධිපතින්ට ද ප්‍රයෝජනවත් වන අතර එම උපදේශකයන්ට අවශ්‍ය පොත්පත් හා තොරතුරු ලබා දීමට ද පුස්තකාලයාධිපතිට හැකිය.

ළමයින් හා ළමා අධ්‍යාපනය පිළිබඳ ව පුළුල් වශයෙන් උනන්දුවක් දක්වන ගුරු සංවිධාන හා අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධතාවක් පුස්තකාලයාධිපති විසින් ඇති කර ගත යුතුය. පාසල් පුස්තකාල සංගම්, විශේෂිත විෂයයක් ඉගැන්වීම හා සම්බන්ධ සංවිධාන, ළමයින්ගේ විශේෂිත අවශ්‍යතා සම්බන්ධ ව කටයුතු කරන සංවිධාන වැනි සංවිධාන තිබේ. මේ සංවිධාන බොහොමයක ප්‍රාදේශීය ශාඛා තිබේ. එම නිසා පුස්තකාලයාධිපතීන්ගේ අදහස් එම සංවිධාන පිළිගනු ඇත. බොහෝ අවස්ථාවල දී පුස්තකාල කාර්ය මණ්ඩලයේ කෙනෙක් පාසල් පුස්තකාල සංගමයේ ප්‍රාදේශීය ශාඛා කමිටුවේ සාමාජිකයෙක් වේ. මහජන පුස්තකාල පද්ධතියක් සහිත සෑම ප්‍රදේශයක ම ගුරු පුහුණු ආයතනයක් නොතිබීමට පුළුවන. එහෙත් පවතින ආයතනවල පුස්තකාලයාධිපතීන් මගින් ප්‍රාදේශීය මහජන පුස්තකාල සේවාව සමඟ සම්බන්ධතාවක් ගොඩනැඟිය හැකිය. පුහුණුව ලබන්නා වුත් මෙම සේවයේ වටිනාකම තේරුම් ගත්තා වූත් ගුරුවරයකු පොත්වලින් හා පුස්තකාලවලින් වඩා පලදායී

ලෙස ප්‍රයෝජන ලබා ගන්නා ගුරුවරුයකු බවට පත් වීමට ඇති ඉඩ කඩ වැඩිය. අවසාන වශයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කාර්යාලය සමඟ සම්බන්ධතාවක් ඇති කර ගත යුතු ය. පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට ලබා දිය හැකි සේවය ආයතනයෙන් ආයතනයට වෙනස් වේ. පුස්තකාලයට ළමයින් එවීමට පෞද්ගලික පාසල් කැමැති වුවත් රජයේ පාසල්වල ප්‍රතිචාරය කුමක් වේ ද යන්න ප්‍රශ්නයකි. එසේ ළමයින් එවීමේ දී යම් කිසි ගාස්තුවක් අය කිරීමට පුස්තකාල අධිකාරියට සිදු විය හැකි ය. පෞද්ගලික පාසල් සඳහා සේවා සැලසීමට මහජන පුස්තකාල අරමුදල් ලබා ගැනීම රඳා පවතින්නේ එවැනි සේවයක් සඳහා ඇති ඉල්ලුම මතයි.

## ආබාධිත ළමයි සහ රෝහල්වල සිටින ළමයි

ආබාධිත ළමයින්ට පොත්වලින් ලබා ගත හැකි අගනා ප්‍රයෝජන පිළිබඳ ව රොබට් ටොඩ් (Robert Tod) හා ඩොරති බට්ලර් (Dorothy Butler) වැනි ලේඛකයන් ලියා ඇති ලිපිවලින් පැහැදිලි වේ. ඔවුන්ගේ ආබාධිත බව ශාරීරික වුවත් මානසික වුවත් පොත්වලින් ලැබිය හැකි ප්‍රයෝජනය විශාලය. විශේෂ උත්සාහයක් නොකළ හොත් ආබාධිත ළමයින්ට පුස්තකාලවලින් ප්‍රයෝජන ලබා ගත නො හැකි ය. මේ ළමයින්ට ආරම්භයේ දී ලැබෙන පළපුරුද්ද සීමාසහිත විය හැකි ය. එය තව දුරටත් දියුණු කිරීම මගින් උසස් ප්‍රයෝජන ලබා ගත හැකි ය. මානසික වශයෙන් ආබාධිත ළමයින්ට මහජන පුස්තකාලයට පැමිණීමට සැලැස්වීමෙන් ඔවුන්ගේ සමාජ අත්දැකීම් ප්‍රයෝජනවත් ලෙස පුළුල් කළ හැකි වේ. මේ සම්බන්ධයෙන් පුස්තකාලයාධිපතීන්ගේ උදවු ලබා ගැනීමට විශේෂ පාසල්වල ගුරුවරු හැම විට ම බලාපොරොත්තු වෙති.

සමහර ළමයින්ට නිවසේ දී ම සේවා සැලසිය හැකි වුවත් බොහෝ ළමයින්ට පාසල්වල දී හෝ රෝහල්වල දී හෝ සේවා සැලසිය හැකි ය. බුද්ධි ඵලය 55%ට වඩා අඩු ළමයින්ට ඉගැන්වීම සඳහා වෙන ම පාසල් එංගලන්තයේ ඇත. මේ පාසල්වල සිටින ළමයින්ගෙන් වැඩි දෙනෙක් ශාරීරික වශයෙන් ද ආබාධිත අය වෙති. 1971 අප්‍රේල් මාසයෙන් පසු මේ අය ද එම අධ්‍යාපන

පද්ධතියේ එක් කොටසක් බවට පත් කර ඇත. ඊට කලින් එම වගකීම දරන ලද්දේ සෞඛ්‍ය අධිකාරීන් විසිනි. එවැනි ආබාධිත ළමයින් කනිෂ්ඨ පුහුණු මධ්‍යස්ථාන වෙත කැඳවන ලදී. එම මධ්‍යස්ථානවල කාර්යයන්ගෙන් වැඩි කොටසක් වෙන් කර ඇත්තේ එම ළමයින්ට සාමාන්‍ය පරිසරය තුළ හැකි තරම් දුරට ක්‍රියා කිරීමට අවකාශ සැලසීමටයි. කාලයෙන් වැඩි කොටසක් වෙන් කර ඇත්තේ අධ්‍යාපනික නාට්‍ය සඳහාය. ළමයින් කීප දෙනක් සරල පොත් කියවීමට ඉගෙන ගනිති. එමෙන් ම සාමාන්‍ය පුස්තකාල සේවාවට වඩා පුස්තකාල නැරඹීම සඳහා අවස්ථාව ලබා දීම වැදගත් සමාජ අත්දැකීමක් වේ. සාමාන්‍ය පාසල්වල නොමැති පහසුකම් බොහෝ විට විශේෂ පාසල්වල තිබේ. ළමයින් පුස්තකාල නැරඹීම සඳහා ගෙන යා හැකි කුඩා බස් රථයක් තිබීම උදාහරණයක් වශයෙන් සඳහන් කළ හැකිය. එමෙන් ම ළමයින් සමඟ හොඳ සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම සඳහා පුස්තකාල කාර්ය මණ්ඩල ද නිතර පාසලට පැමිණිය යුතු ය. ළමයින් පුස්තකාලවලට ගෙන්වා ගැනීම ඒ මගින් දිරිමත් කළ හැකිය. මෙම ළමයින්ට අවශ්‍ය වන්නේ සරල කතන්දර සහිත වර්ණවත් පින්තූර පොත් හෝ හඳුනාගත හැකි විෂයයන් පිළිබඳ පින්තූර අඩංගු පොත් නිසා, පුස්තකාලයේ ඇති සාමාන්‍ය පොත් එකතුවෙන් ඔවුන්ට සේවා සැලසිය හැකිය.

දැන් බොහෝ විට ළමයින් රෝහල්වල තබන්නේ හැකි තරම් කෙටි කාලයකටය. සුළු කෙටිකාලීන ප්‍රතිකාරයක් සඳහා රෝහලකට යන බොහෝ ළමයින්ට පුස්තකාල සේවයක් අවශ්‍ය වේ යැයි සිතිය නො හැකි ය. ඊට හේතුව ඔවුන්ගේ කියවීමේ අවශ්‍යතා චිත්‍රකථා පොත් මගින් හා ඔවුන්ගේ දෙමාපියන් හා නෑදෑයින් විසින් ලබා දෙන පොත් මගින් සම්පූර්ණ වන නිසා ය. කෙසේ වුවත්, ළමා පුස්තකාලවලට ලබා දිය හැකි එක් ප්‍රයෝජනවත් සේවයක් නම්, ළමයින්ට තේරුම් ගත හැකි ආකාරයෙන් රෝහල් අත්දැකීම් විස්තර කර ඇති පොත් පිළිබඳ ප්‍රචාරයක් දෙමාපියන් අතර ඇති කිරීමයි. මහා බ්‍රිතාන්‍යයේ රෝගීන් සඳහා ඇති පුස්තකාල සේවා ආකාර තුනකින් සපයනු ලැබේ. බොහෝ විට, රෝහල් තුළ ස්වාධීන ලෙස පුස්තකාල

පිහිටුවා ඇත. ඒ සඳහා අරමුදල් රෝහල විසින් සම්පාදනය කරනු ලැබේ. මේ ආකාර දියුණු පුස්තකාලයක් ලන්ඩන් නුවර ශාන්ත තෝමස් රෝහලේ පිහිටා ඇත. අනෙක් අවස්ථාවල දී මහජන පුස්තකාල සේවයේම කොටසක් ලෙස පුස්තකාලයටත් ලබා දෙනු ඇත. පුස්තකාලය සඳහා ඉඩ පහසුකම් රෝහල ලබා දේ. එය සාමාන්‍ය ශාඛා පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මක වන අතර, මහජන පුස්තකාල විසින් පොත් සහ කාර්ය මණ්ඩල ලබා දෙනු ඇත. ඒ සඳහා රෝහල් අධිකාරිය විසින් පාරිතෝෂිකයක් දෙනු ලැබේ. ස්වේච්ඡා සංවිධාන විසින් ද රෝහල් පුස්තකාල සැපයීම සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇත. ශාන්ත ජෝන් හා රතු කුරුස පුස්තකාල උදාහරණ වශයෙන් දක්විය හැකිය. මෙම ක්‍රම තුනෙන් කුමන ක්‍රමයකින් හෝ රෝහල් පුස්තකාල සේවයක් රෝගීන් සඳහා ලබා දෙන්නේ නම්, එම පොත් එකතුන්ට ළමා පොත් එක් නොකිරීමට හේතුවක් නොමැත. මහ රෝහලක කාර්ය මණ්ඩලයට විශේෂඥ ළමා පුස්තකාලයාධිපතිවරකු ඇතුළත් කිරීමට ඇති ඉඩකඩ අඩුය. එනමුත් අවශ්‍ය අවස්ථාවල දී ප්‍රාදේශීය ළමා පුස්තකාලයෙන් උපදෙස් අපේක්ෂා කළ හැකි ය.

දීර්ඝ කාලයක් සඳහා රෝහල් ගතවන ළමයින් වෙනුවෙන් අඛණ්ඩ අධ්‍යාපනයක් ලබා දීමට සාමාන්‍යයෙන් කටයුතු කරනු ලැබේ. දීර්ඝ කාලීන ව ළමයින් නැවතී සිටින රෝහල්වල පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් සහිත පාසලක් තිබීමට පුළුවන. එහි දී ගුරුවරයා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. පාසල් පුස්තකාල ජංගම සේවයක් ක්‍රියාත්මක වන ප්‍රදේශවල, සාමාන්‍ය වැඩ සටහනේ කොටසක් ලෙස රෝහල් පාසල බැලීමට පැමිණිය හැකිය. ජංගම පුස්තකාලයට පැමිණිය නොහැකි ළමයින්ට කථා කිරීම සඳහා එක් පුස්තකාලයාපතිවරයකු රෝහලට යා යුතුය. පොත් තෝරා ගත හැකි අයට උදවු කිරීම සඳහා අනෙක් පුස්තකාලයාධිපති ජංගම පුස්තකාලය තුළ නැවතී සිටිය යුතු ය. පොත් ට්‍රොලිය ගෙන යාම, කියවීම හෝ කතන්දර කීම සඳහා වෘත්තීය කාර්ය මණ්ඩලයක් යොදා ගැනීමට ආර්ථික වශයෙන් ශක්තියක් ඇත්තේ බලධාරීන් සුළු පිරිසකට පමණි. ඒ නිසා ස්වේච්ඡාවෙන් උදවු කරන්නන්ගේ ප්‍රයෝජන ලබා ගැනීම

අවශ්‍යය. පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී උපදෙස් ලබා ගැනීමටත් ස්වේච්ඡා කාර්ය මණ්ඩල පුහුණු කිරීමටත් පුස්තකාල පද්ධතිය සංවිධාන කිරීමටත් වෘත්තීය කාර්ය මණ්ඩලය යොදා ගත යුතු ය. සෑම ළමයකුට ම නිරන්තරයෙන් අවධානය යොමු වන පරිදි එවැනි තත්ත්වයක් ඇති කළ යුතුය.

බ්‍රිතාන්‍යයේ ළමා පොත් සංගමයේ ශාඛා විසින් ප්‍රයෝජනවත් සේවයක් සලසා ඇත. එනම් රෝහල්වල සිටින ළමයින් තනි තනි ව හෝ සමූහ වශයෙන් හෝ ගෙන ඔවුන්ට කතන්දර කීම සඳහා එම ශාඛාවල සාමාජිකයන් ස්වේච්ඡාවෙන් යොදා ගැනීමයි. සුදුසු පොත් නිර්දේශ කිරීම හා ඒවා කඩිනමින් ලබා දීමෙන් පුස්තකාලයාධිපතිට උදවු විය හැකිය. ළමයින් රෝහල්වල සිටින කාලය දීර්ඝ වුවත් කෙටි වුවත් ඔවුන්ගේ රුචි අරුචිකම් අනෙකුත් ළමයින්ගේ රුචි අරුචිකම්වලට සමානය. එනමුත් ඔවුන්ගෙන් වැඩි දෙනකු අඩුවෙන් කියවන අය නිසා, සිත් ගන්නාසුලු සරල පොත් විශාල ප්‍රමාණයක් අවශ්‍යවේ. රෝහල්වල සිටින ළමයින් සඳහා පොත් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතුය. රෝගියාගේ ම තත්ත්වය ඉතා ම පැහැදිලි ලෙස නිරූපණය වන පොත් තෝරා ගැනීමෙන් වැළකිය යුතුය.

අන්ධ හා බිහිරි ළමයින්ට, සාමාන්‍ය ළමයින්ට මෙන් බුද්ධි මට්ටමක් තිබුණ ද ඔවුන් සතු විශේෂ ගැටලු තිබේ. අන්ධ ළමයින් සංඛ්‍යාවෙන් සුළු වුවත්, බ්‍රිතාන්‍යයේ ජාතික පුස්තකාලය මගින් මෙවැනි ළමයින්ට පටිගත කරන ලද කතන්දර සපයනු ලැබේ. ඒවා විශේෂයෙන් ම නිවාඩු කාලවල දී වැදගත් වේ. ප්‍රජාවට ඒකාබද්ධ වීම සඳහා අන්ධ ළමයින්ට අවස්ථාවක් ලබා දීම ඉතා අවශ්‍යය. කතන්දර වැඩ සටහන්වලට ඔවුන් ගෙන ඒම සඳහා ඔවුන්ගේ දෙමාපියන් දිරිමත් කිරීම අවශ්‍ය ය. අර්ධ වශයෙන් දෘශ්‍යාබාධිත ළමයි සාමාන්‍ය පාසල්වල ඉගෙනීම ලබති. ඔවුන් සඳහා පැහැදිලි වූත් හොඳින් ඉඩ තබා මුද්‍රණය කරන ලද්දා වූත් විශාල අකුරු සහිත පොත් අවශ්‍ය වේ.

භාෂාමය අත්දැකීම් කෙළින් ම ලද නොහැකි බැවින් කියවීමේ දී බිහිරි අයට විශේෂ ගැටලු ඇති වේ. මේ නිසා ඔවුන්ට කිසිවක් පැහැදිලි කර දීම අපහසුවේ. ඔවුන්ට අවශ්‍ය වන්නේ ද ඔවුන්ගේ සම වයස් සමූහවලට අවශ්‍ය මට්ටමේ පොත් ය.

එනමුත් ඒවා සරල භාෂා මට්ටමකින් ලියන ලද ඒවා විය යුතු ය. උසස් ළමා පොත්වල සරල අනුවර්තන ලබා දීමේ වැඩ සටහනක් මෑතක දී බ්‍රිතාන්‍යයේ ආරම්භ කරන ලදී.

## සුළු ජාතීන් සමූහ

ළමයින් සඳහා ලිඛිත සාහිත්‍ය සම්ප්‍රදායක් නොමැති සංස්කෘතීන්ට අයත් ළමයි ලෝකය පුරා සිටිති. ඉංග්‍රීසි ළමා සාහිත්‍යයේ ඉතිහාසය කෙතරම් කෙටි ද යන්න පිළිබඳ ව කල්පනා කරන විට, මෙය පුදුමයක් නොවේ. වර්තමානයේ එය ලෝකයේ උසස් ම හා දීර්ඝතම සාහිත්‍යය වශයෙන් හැඳින්වේ. තරුණ වියට පත් ව, රැකියා අපේක්ෂාවෙන් සිටින තරුණයන් ඉන්නා සමාජයක, භාෂාමය වශයෙන් පහසුකම් ලබා දීම අතිශයින් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් පොත්වලට හා පුස්තකාලවලට ඉටු කළ හැකිය. එමෙන් ම සංස්කෘතික සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම හා හැම පුද්ගලයකුට ම තම සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ හැඟීමක් ලබා දීම සම්බන්ධයෙන් ඇති සැලකිල්ල වැඩි වෙමින් පවතී. ලිඛිත සාහිත්‍යයක් කෘත්‍රිම වශයෙන් නිර්මාණය කිරීමෙන් පලක් නැත. හොඳින් සංවර්ධනය වූ පුස්තකාල සම්ප්‍රදායක් ඇති රටවල වුවත් සංචාරක එඬේර චර්යාවන් සහිත සංස්කෘතික සමූහ වෙත එළඹීම විශේෂයෙන් ම දුෂ්කරය. ජිප්සිවරුන්, රතු ඉන්දියන්වරුන්, එස්කිමෝවරුන්, ඕස්ට්‍රේලියානු ආදි පදිංචිකරුවන් උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මෙම සමූහවල ළමයින් ලබන අත්දැකීම් බහුතර ජනයාගේ ළමයින් ලබන අත්දැකීම්වලට වඩා වෙනස් ය. සාම්ප්‍රදායික ජීවන රටාවක් තුළ අඛණ්ඩව ජීවත් වන අයට පොත් සහ පුස්තකාල අවශ්‍ය නොවිය හැකිය. එනමුත් මෙම සමාජවල පවත්නා කියවීමේ සම්ප්‍රදායේ දුර්වලතාව නිසා පොදු සමාජයට පිවිසීමට උත්සාහ දරන අයට එය අවාසියක් ව පවතී.

## රැකවරණය ලබන ළමයි

දෙමාපියන්ගේ රැකවරණය නොලැබෙන අපචාරී ළමයින්ට ප්‍රජාවේ ආරක්ෂාව ලැබේ. පවුලකට වඩා විශාල කණ්ඩායමක ජීවත් වන ළමයකුට පෞද්ගලික ලෝකයකට එළඹීමට,

පොත් අවකාශ සලසා දේ. එවැනි අවස්ථාවක පෞද්ගලිකත්වය ඉතා වටිනා වෙළෙඳ භාණ්ඩයක් වේ. එමෙන් ම පොත්වලට නව වටිනාකමක් ලැබේ. මෙහි දී මහජන පුස්තකාලයට ආකාර දෙකකින් සහාය වීමට හැකිය. අදාළ ආයතනය හෝ රැකවරණ මධ්‍යස්ථානය හෝ අසල පුස්තකාලය පිහිටා ඇත්නම් විවේක ඇති අවස්ථාවල දී පුස්තකාලයට පැමිණීමට ළමයින් දිරිමත් කළ හැකිවේ. ළමයින් රැක බලා ගන්නා අය වෙත යාමට ද පුස්තකාලයාධිපතිට පුළුවන. ළමයින් විසින් පුස්තකාලයෙන් ගනු ලබන පොත් හැකි තරම් දුරට හොඳ තත්ත්වයෙන් ආපසු ලබා දීම පිළිබඳ ව ඔවුන්ගේ අවධානය යොමු කර වීමට පුස්තකාලයාධිපතිට එහි දී හැකි වනු ඇත. එමෙන් ම නැති වන හෝ හානි සිදු වන හෝ පොත් සම්බන්ධයෙන් ඔවුන්ට මූල්‍යමය වශයෙන් වගකීමක් නොමැති බව ද පුස්තකාලයාධිපති ඔවුන්ට දන්වීම වැදගත් ය. එවන් වගකීමක් දැරීමට ඇතොත් වැඩිහිටියන් ළමයින්ට පුස්තකාලය භාවිත කිරීමට ඉඩ නොදීමට පුළුවන. ළමා ආයතනය හෝ ළමා සුරැකුම් මධ්‍යස්ථානය හෝ පුස්තකාලයට දුරස්ථව පිහිටා ඇත්නම් හෝ ළමයින්ට පුස්තකාලයට යාමට විවේකයක් නොමැති නම් එම ස්ථානයේ කුඩා පොත් එකතුවක් තැන්පත් කළ හැකිය.

## තරුණ සංවිධාන

යොවුන් වියේ සියලු ම වයස් මට්ටම්වලට අයත් අයගේ අවශ්‍යතා සපුරා ලීමේ කාර්යයෙහි තරුණ සංවිධාන විශාල සංඛ්‍යාවක් නිරත ව සිටිති. මේ සංවිධාන වලින් සමහරක් ඉතා දර්ශනීය ස්ථානවල පිහිටා ඇත. ඒවායේ කිසි යම් නිහඬ තැනක සහරා හා පොත් ලබා ගැනීමට තබා ඇත. තරුණ සංවිධානවලට අයත් තරුණ සමාජවල හෝ සංවිධානවල හෝ රැස්වීම් ශාලාවල මහජන පුස්තකාල විසින් පොදු පොත් එකතුවක් තැන්පත් කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජනය සීමිත ය. පොදු එකතුවක් වෙනුවට විශේෂිත ක්‍රියාකාරකම් සඳහා උපකාරී වන පොත් එකතුන් පවත්වා ගෙන යාම ප්‍රයෝජනවත් වේ. මෙහිදී පොත් පිළිබඳ ව හා පුස්තකාල පිළිබඳ ව, සංවිධානවල සාමාජිකයන් සමඟ සාකච්ඡා කිරීමට පුස්තකාලයාධිපතිට

හැකිය. සංවිධානවල සාමාජිකයන්ට ද ඔවුන්ගේ කටයුතුවල කොටසක් වශයෙන්, වරින් වර පුස්තකාලවලට පැමිණිය හැකිය. තරුණ සංවිධාන සඳහා සපයන සේවාවන් පිළිබඳ ප්‍රචාරයක් තරුණ නායකයන් පුහුණු කරන අභ්‍යාස පාඨමාලාවල දී ලබා දිය යුතු ය. බොහෝ තරුණ කටයුතුවල දී ඉගෙනීම කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන තරුණ සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යාමෙන් පාඨක සංඛ්‍යාව වැඩි කර ගැනීමට ද මහජන පුස්තකාලයට හැකිය.

**දෙමාපියෝ**

බොහෝ ආයතනවලට හා සංවිධානවලට දෙමාපිය හවුල් සම්බන්ධ වී සිටිති. මේවා අතර බහුල වශයෙන් ම දක්නට ලැබෙන්නේ බොහෝ පාසල්වලට සම්බන්ධ ගුරු දෙගුරු සමිති සමාගම්ය. ගුරු දෙගුරු සමිති මෙන් ම ක්‍රීඩා සමාජ, ප්‍රජා සංවිධාන හා අනෙකුත් විවිධ සමිති පිහිටුවා ගැනීම මඟින් ද පාසල්වල විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීමටත් ගැටලු නිරාකරණය කර ගැනීමටත් හැකිවේ.

දෙමාපියන් කෙරෙහි යොමු වූ ද ළමා පුස්තකාලයාධිපතීන්ට විශේෂයෙන් ම වැදගත් වූ ද සංවිධානයක් බ්‍රිතාන්‍යයෙහි ඇත. එය ළමා පොත් සංගම් සංවිධානය යනුවෙන් හැඳින් වේ. මෙම සංවිධානයේ අරමුණ දෙමාපියන් අතර සමකාලීන ළමා පොත් පිළිබඳ දැනුම හා ඇගයීම වර්ධනය කිරීම යි. එය 1964 දී ආරම්භ කරන ලදී. එහි ශාඛා සමිති රටේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇත. 1968 වන විට, එය ජාතික සංගමයක ප්‍රමාණයට වර්ධනය විය. මෙම සංගමය සමහර ප්‍රදේශවල මහජන පුස්තකාල සමඟ ඉතා සමීප ව කටයුතු කර තිබේ. ළමා පුස්තකාලයාධිපතීන් සංගමයේ කමිටු සාමාජිකයන් වශයෙන්ද පත් කර ගෙන ඇත. සංගමයේ සාමාජිකයන්ගේ සහාය ළමා පුස්තකාලයාධිපතීන්ට අතිශයින් වැදගත්. වේ. ඒ වෙනුවෙන්, සංගමය සඳහාද විශාල කාර්ය භාරයක් පුස්තකාලයාධිපතිට ඉටුකළ හැකිය. උදාහරණ වශයෙන්, දේශකයන් පිළිබඳ තොරතුරු සැපයීම, විවිධ ක්‍රියාකාරකම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, පොත් ලැයිස්තු සැපයීම හා ප්‍රදර්ශන පැවැත්වීම වැනි උදවු ළමා පුස්තකාලයාධිපතිට දිය හැකිය.

මෙම පරිච්ඡේදයේ සඳහන් කරන ලද සියලු ම නියෝජිත කණ්ඩායම් සමඟ සම්බන්ධතා පැවැත්වීම ළමා පුස්තකාලයාධිපති විසින් කළ යුතු යැයි කල්පනා කිරීම ප්‍රායෝගික නො වේ. එහෙත් හැකි තාක් දුරට මෙම නියෝජිත කණ්ඩායම් මගින් ළමයින් හැකිතරම් විශාල ප්‍රමාණයකට සේවා සැපයීම ළමා පුස්තකාලයාධිපතිගේ වගකීම වේ.

## දහ වන පරිච්ඡේදය

# ව්‍යාප්ති කටයුතු

'ව්‍යාප්ති කටයුතු' යන පදය අවුරුදු බොහෝ ගණනක් තිස්සේ පුස්තකාලයාධිපතිත්වය සම්බන්ධයෙන් බහුල ව භාවිත වූවකි. දැන් එය යල් පැන ගිය සංකල්පයක් සේ සැලකේ. කෙසේ වුවත්, මෙහි දී මෙම පදය යොදා ගනු ලබන්නේ, සාමාන්‍ය බැහැර දීමේ හා තොරතුරු සැපයීමේ සේවාවන්ට අමතර ව, පවත්නා කටයුතු විස්තර කිරීම සඳහාය.

එම කටයුතු පුස්තකාලය තුළ සිදු වන ඒවා විය හැකි ය. නැත හොත් වෙනත් ආයතනයක හෝ සංවිධානයක හෝ සහයෝගය අවශ්‍ය වන, පුස්තකාලය විසින් ආරම්භ කරන ලද කටයුතු විය හැකිය. පුස්තකාලය සම්බන්ධ වන ඕනෑ ම කාර්යයක අරමුණ විය යුත්තේ කියවීමේ රුචිය වර්ධනය කිරීමත් පොත් හා පුස්තකාල භාවිතය වර්ධනය කිරීමත්ය.

මෙම අරමුණ ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පුස්තකාලයට පැවරෙන කාර්යයන් ඇත්ත වශයෙන් ම එතරම් අසීරු නො වේ. එහෙත් පුස්තකාලයාධිපති සමාජ සේවකයකු, ළමයින් රැකබලා ගන්නකු හෝ ගුරුවරයකු වශයෙන් පුහුණුවක් ලබා නැත. ළමයි සමඟ පුස්තකාල කටයුතුවල නිරත වීමේ දී මේ සියලු ම අංශවලට සම්බන්ධ වීමට පුස්තකාලයාධිපතිට සිදු වුවත්, ඔහුගේ පරම කටයුත්ත විය යුත්තේ, පොත් සහ අනෙකුත් සම්පත් සම්බන්ධ කාර්යයි. ඉන් ඔහුට අසමාන තෘප්තියක් ලැබේ.

ඉටු කරනු ලබන ඕනෑ ම කටයුත්තක් ඉතා ඉහළ මට්ටමින් ඉටු කළ යුතුය. එය විශාල වශයෙන් රඳා පවතින්නේ පුස්තකාලයේ ඇති සම්පත් හා පහසුකම් මතයි. සේවාවන්ට බාධාවක් නොවන අයුරින්, කුඩා ළමා කණ්ඩායම්වලට කතන්දර කීම හා අවිධිමත් දේශන ආදිය සංවිධාන කිරීම බොහෝ පුස්තකාලවලට කළ හැකිය. එනමුත් චිත්‍රපට දර්ශන, කැසට් පට හෝ තැටි භාවිත කිරීම සඳහා වඩා දියුණු පහසු කම් අවශ්‍ය වේ.

මෙම කටයුතු ඉටු කර ගැනීමේ හැකියාව රඳා පවතින්නේ පුස්තකාලය පිහිටා ඇති ප්‍රදේශය මතයි. පහසුකම් සැපයීමේ දී ප්‍රමුඛත්වය දිය යුතු දේ පිළිබඳ ව පුස්තකාලයාධිපති විසින් පිළිවෙළක් කර ගත යුතුය.

## පාසල් වේලාවන් තුළ දී පන්ති වශයෙන් පැමිණීම

පන්ති වශයෙන් පැමිණීම සඳහා බොහෝ පුස්තකාල ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. ඊට හේතුව එය පාසල් වියේ සිටින සියලුම ළමයින් වෙත ළඟා වීමේ හොඳ ක්‍රමයක් වීමයි. යටත් පිරිසෙයින්, පුස්තකාලය පිහිටි ස්ථානය ගැන හා එය ඕනෑ ම අයකුට භාවිත කළ හැකි බවත් යන කරුණු වත් එවිට ළමයින්ට දැන ගත හැකිය. කෙසේ වුවත්, මෙම වැඩ සටහනේ සාර්ථකත්වය රඳා පවතින්නේ පාසල් බලධාරීන් හා ගුරුවරුන් සමඟ ඇති කර ගන්නා සහයෝගිතාව මතයි. පන්ති වශයෙන් පැමිණීම ප්‍රායෝගික වශයෙන් වැදගත් වන්නේ, පුස්තකාලය පාසලට සමීප ව පිහිටා තිබේ නම් පමණි. විශාල දුර ප්‍රමාණයක් පයින් ගමන් කිරීමට හෝ පොදු ප්‍රවාහන ක්‍රමයක් භාවිත කිරීමට සිදු වුවහොත් ගැටලු මතු වීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවල දී, පාසලකට එසේ සහභාගිවීමට හැකි වන්නේ අඩු වශයෙන් වරකට ළමයින් තිස් දෙනකු වත් සහභාගි කර ගැනීමට පුස්තකාලයාධිපතිට හැකි නම් පමණි. ප්‍රයෝජනවත් ක්‍රියාකාරකමක් කිරීමට, අඩු වශයෙන් පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙ දෙනකු වත් ඒ සඳහා අවශ්‍ය වේ. එම නිසා පන්ති වැඩ සටහන් ඉතා පරෙස්සමෙන් කලින් සැලසුම් කර ගත යුතු ය. පුස්තකාලයාධිපතීන් පාසලට ගොස් ළමයින් කණ්ඩායම කී දෙනකුගෙන් සමන්විත දැයි ස්ථිර ව ම දැන ගත යුතු ය. ළමයින්ගේ රුචි අරුචිකම් හා හැකියාවන් පිළිබඳ අවබෝධයක් ද ලබා ගත යුතු ය. පුස්තකාලයට පැමිණි විට කළ යුතු දේ පිළිබඳ ව සාකච්ඡා කළ යුතුය. වයස අවුරුදු හත හෝ ඊට අඩු සහභාගි වන මෙවැනි වැඩ සටහනක ප්‍රධාන ම ලක්ෂණය කතන්දර කීමයි. ඊට වඩා වයසින් වැඩි ළමයින්ට කුඩා කණ්ඩායම් වශයෙන් පුස්තකාලය භාවිත කළ හැකි ය. එහි දී ඔවුන්ට පාසලේ දී අධ්‍යයනය කරනු ලබන දේ හා සම්බන්ධ පුස්තකාල ද්‍රව්‍ය පරිහරණය කළ හැකිය.

පාසල්වලට ගිය විට, පුස්තකාල පිළිබඳ ව උවමනාවට වඩා උපදෙස් ළමයින්ට දීමට පුස්තකාලයාධිපතීහු බොහෝ විට පෙළඹෙති. පුස්තකාලයට පැමිණීමේ අරමුණ, ආධුනික පුස්තකාලයාධිපතීන් කණ්ඩායමක් බිහි කිරීම නො ව, පුස්තකාලය ලබා දෙන ප්‍රයෝජනවත් හා විනෝදාත්මක සේවය පිළිබඳවත් එම සේවය අවශ්‍ය අයට නිදහසේ එය ලබා ගැනීමට ඇති අවස්ථාව පිළිබඳවත් ළමයින් තුළ හැඟීමක් ඇති කිරීම බව පුස්තකාලයාධිපති මතක තබා ගත යුතුය. ළමයින්ට කැමැති විට නැවත වරක් පුස්තකාලයට පැමිණීමට සිත් දෙන පරිදි ඔවුන් තුළ විශ්වාසයක් ඇති කළ යුතුය.

භාවිතය මගින් ලබන අධ්‍යාපනය ළමා පුස්තකාල කටයුතු හා සම්බන්ධ වැදගත් සංකල්පයකි. ඒ මගින් ඉටු කරනු ලබන කාර්යයන්ගෙන් වැඩි කොටසක් පසු කාලයේ දී වඩා විධිමත් පුහුණුවක් ලැබීම සඳහා පදනමක් වනු ඇත. උදාහරණ වශයෙන්, තොරතුරු සෙවීමේ දී සංඛ්‍යාත්මක හා අකාරාදි පිළිවෙළ පිළිබඳ හොඳ අවබෝධයකුත් නිවැරැදි වචනය හෝ සංඛ්‍යාව හෝ සොයා ගැනීමේ හැකියාවකුත් අත්‍යවශ්‍ය වේ. ක්‍රමානුකූල ව පොත් අහුරා ඇති අන්දමත් ඒ සඳහා විෂය සූචියක් යොදා ගන්නා අන්දමත් පොතේ පටුන හා සූචිය මගින් ඉක්මනින් තොරතුරු ලබා ගන්නා අන්දමත් පිළිබඳ ව ළමයින්ට පෙන්වා දීමෙන් ඔවුන් තුළ ආත්ම ශක්තිය හා විශ්වාසය ඇති කළ හැකි ය. කාර්යක්ෂම ලෙස පුස්තකාල භාවිත කිරීමේ හැකියාවක් ලබා දිය යුත්තේ, ළමා වියේ දී පීඩනයක් ඇති නොවන ආකාරයෙන් හා ප්‍රසන්න ආකාරයෙන් බව ළමයින් සමඟ කටයුතු කරන පුස්තකාලයාධිපති නිතර ම සිත් තබා ගත යුතුය. ඒ සඳහා කාරුණික වැඩිහිටියකුගේ උපකාරය බෙහෙවින් බලපායි.

සමහර ගුරුවරුන් පුස්තකාලයට නිතර පැමිණීමට කැමැත්තක් දක්වන අතර, සමහර අය කලාතුරකින් පැමිණෙති. එසේ පැමිණෙන්නේ ළමා පොත් සතියක දී හෝ ළමා සංවර්ධනයේ යම් කිසි විශේෂ අවධියක දී හෝ විය හැකි ය. අලුත් පුස්තකාලයක් විවෘත කරන්නේ නම් හෝ පරණ පුස්තකාලයක් පුළුල් කරන්නේ නම් හෝ එසේ විවෘත කිරීමත් සමඟ ම හැකි තරම් අසල පිහිටි පාසල්වලට පැමිණීමට සංවිධාන කිරීම ඉතා

කදිම යි. ළමයින්ට හොඳින් කියවීමට හැකි වන අවධියේ දී පන්ති වශයෙන් පැමිණීම පලදායී ලෙස සංවිධාන කළ හැකිය. හඳුන්වා දීමේ දේශන, කතන්දර කීම, පුස්තකාල ද්‍රව්‍ය බැහැර ගෙන යාමට හෝ භාවිත කිරීමට අවස්ථාව සලසා දීම හැරුණ විට මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කරන ලද අනෙක් ඕනෑ ම ක්‍රියාකාරකමක් පන්තිවලට පැමිණි අවස්ථාවල දී කළ හැකිය.

## කතන්දර කියන වේලාව

කතන්දරවලට සවන් දීම, ළමා සංවර්ධනයේ වැදගත් කොටසකි. වටිනා අත්දැකීම් ලබා දීමත් භාෂා සංවර්ධනයට උපකාර වීමත් කියවන්න පුරුදු වීමට ළමයා උනන්දු කිරීමත් ඒ මඟින් සැලසේ. කියවීමේ හැකියාව ලබා ගෙන දීර්ඝ කාලයකට පසු ව වුව ද, කතන්දර ඇසීමෙන් ළමයි විනෝදයක් හා ප්‍රයෝජනයක් ලබති. නිතිපතා නින්දට යාමට පෙර නිවසේ දී කතන්දර ඇසීමේ අත්දැකීම ලැබීමට බොහෝ ළමයි වාසනාවන්ත වෙති. අනෙක් අය පාසලේ දී හෝ පුස්තකාලයේ දී හෝ එම දැනුම ලබා ගනිති. වයසින් වැඩි ළමයින් සඳහා අලුත් පොත් හඳුන්වා දීමටත් ඔවුන් සාමාන්‍යයෙන් නොකියවන පොත් කියවීමට ධෛර්යවත් කිරීමටත් කතන්දර කීම හොඳ උපායකි.

අවශ්‍ය සම්පත් අනුව බලන විට, පුස්තකාලවලට පහසුවෙන් ම සංවිධාන කළ හැකි ක්‍රියාකාරකමකි, කතන්දර කීම. බාධා නොපැමිණෙන, පහසු තැනක ළමයින් වාඩි කළ යුතු ය. කතන්දර කීම සඳහා පොත් රාක්කවලින් හෝ තිරවලින් වෙන් කරන ලද කොටසක් සුදුසු වේ. කවර වයසක ළමයකුට වුව ද පැයක් එක ඉරියව්වක සිටීම දුෂ්කර දෙයකි. සාමාන්‍යයෙන් බාල වයසේ ළමයකු සඳහා විනාඩි විස්සක් ප්‍රමාණවත් වන අතර උපරිම කාලය විනාඩි තිහක් හෝ හතළිහක් විය යුතුය. කාලය එම ප්‍රමාණයටත් වඩා වැඩි නම් වැඩ සටහන අතරතුර දී ළමයින්ට එහා මෙහා ඇවිද යම් යම් දේවලට සහභාගි විය හැකි ක්‍රියාකාරම් ඇතුළත් කළ යුතුය.

කතන්දර කීමේ වැඩ සටහනක් සඳහා වැය වන වියදම, ඒ සඳහා කාර්ය මණ්ඩලය විසින් යොදවනු ලබන කාලය මත රඳා පවතී. කතන්ද්‍රය කීමට ගන්නා කාලය පමණක් නොව

එයට සූදානම් වීම ද මීට ඇතුළත් වේ. ඒ වියදම සාධාරණ වන පරිදි අඩු වශයෙන් ළමයින් විස්සක් විසි පහක් පමණ සංඛ්‍යාවක් වත් සිටිය යුතු ය. ළමයින් සංඛ්‍යාව විසි පහකට වැඩි වුවහොත්, ළමයින් සියලු දෙනා සමඟ ම සම්බන්ධතාවක් ඇති කර ගැනීමටත් එය පවත්වා ගෙන යාමටත් කතන්දර කීම අසීරු විය හැකිය. සියලු ම ළමයින් සමාන වයස් සමූහයක අය නම්, එය පහසුවක් වේ. ළමයින් වයසින් වැඩි වන විට, එක් එක් ඉරියව්වක වැඩි වේලාවක් ගත කිරීමටත් අවධානය යොමු කිරීමටත් ඔවුන්ට හැකිවේ. එනමුත් පවුල් හවුල් සඳහාත් පුස්තකාලයාධිපති සූදානමින් සිටිය යුතු ය. විවිධ වයස් සීමාවලට අයත් ළමයින්ට එක වර සේවය සැලසෙන පරිදි, නිවාඩු-වාර ක්‍රියාකාරකම් විශේෂයෙන් සැලසුම් කළ යුතුය.

පොතක් උපයෝගී කොට නො ගෙන, මතකයෙන් කතන්දර කීමට හැකි වන පරිදි කතා එකතුවක් පුස්තකාලයාධිපති විසින් මතක තබා ගැනීම යෝග්‍ය වුවත්, කතන්දර පොතක් ළඟ තබා ගැනීම හොඳ අදහසක් වනු ඇත. කතන්දර පොත්වලින් ලබා ගන්නා බව ඉන් ළමයාට අවධාරණය වේ. කතන්දර කීමේ පුළුල් වැඩ සටහන්වලට සම්බන්ධ ව සිටින ඕනෑ ම අයකු කතන්දර කීමට පමණක් නො ව, කතන්දර කියවීමට ද හැකියාවක් ලබා ගත යුතු ය. ළමයින්ගේ අවධානය යොමු කර ගැනීමට හැකි වන ආකාරයට සෑම කථාවක් ම සකස් කර ගත යුතුය. නුහුරු වචන පැහැදිලි කරමින්, කටහඬ වෙනස් කරමින් කථාව පරෙස්සමෙන් සකස් කර ගත යුතු ය.

එක ම වර්ගයේ සාම්ප්‍රදායික කථා, කෙටි කථා සහ පින්තූර පොත් යොදා ගැනීමට ඇති පහසු ම දේවල්ය. සාම්ප්‍රදායික කථා ඇසීමට වැඩි දෙනෙක් ප්‍රිය කරති. කෙටි කථා ද අසන්නන්ගේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් කර ගත යුතුය. එක් දීර්ඝ කෙටි කථාවකට වඩා කෙටි කථා කීපයක් දන සිටීම සාමාන්‍යයෙන් වඩා ප්‍රයෝජනවත් ය. බාල වයසේ ළමයින් සඳහා වූ වැඩ සටහන්වලට පද්‍ය ගායනා ද ඇතුළත් කළ හැකි ය. කථාව ආරම්භ කිරීමට පෙර, ළමයින් කණ්ඩායම පාලනයට නතු

කර ගත යුතු ය. එහා මෙහා ගමන් කිරීම අධෛර්යවත් කළ යුතු ය. කතන්දර කීමේ වැඩ සටහන් ආරම්භ කිරීම හා අවසාන කිරීම සඳහා නිශ්චිත රටාවක් අනුගමනය කිරීම යෝග්‍යවේ.

කතන්දර තෝරා ගැනීමේ දී මෙන් ම කතන්දර පොත් තෝරා ගැනීමේ දී ද ඒ සඳහා විවිධ මඟ පෙන්වීම් තිබේ. මෙම ක්ෂේත්‍රය සඳහා සේවාස්ථ පුහුණු විශේෂයෙන් ම ප්‍රයෝජනවත් වේ. කතන්දර ඉදිරිපත් කිරීමේ විලාසය ඒ ඒ පුද්ගලයාගේ ස්වභාවය මත රඳා පවතී. සමහර අය මේ සඳහා නාට්‍යමය උපක්‍රම හා දෘශ්‍යාධාර යොදා ගනිති. තවත් සමහර අය එවැනි දේ නොමැති වුවත් සමාන හොඳ ප්‍රතිචාරයක් ලබා ගනිති. සමහර අයට කතන්දර ඉදිරිපත් කිරීමේ විශේෂ හැකියාවක් පැවතියත් සෑම පුස්තකාලයාධිපතිවරයකු විසින් ම එම හැකියාව දියුණු කර ගත යුතුය.

## පුස්තකාලය තුළ වෙනත් සමූහ ක්‍රියාකාරකම්

ඉඩ ප්‍රමාණය සීමිත නම් සමූහ ක්‍රියාකාරකම් සාපේක්ෂ වශයෙන් අක්‍රියවේ. පොත් හඳුන්වා දීම, ඒවායේ චරිත පිළිබඳ ව සාකච්ඡා කිරීම හා රසවත් සිද්ධීන් හඬ නඟා කියවීම ආදී දේ පුස්තකාලයාධිපතිට කළ හැකිය. මෙහි අරමුණ වනුයේ අසන්නන් පොත් කියවීම සඳහා දිරි ගැන්වීම හෙයින්, පොත් පිළිබඳ දේශන ඉදිරිපත් කළ යුත්තේ පොත් බහුල ව ලබා ගත හැකි නම් පමණි.

බාහිර දේශකයන් යොදා ගැනීම නිසා විවිධ ප්‍රශ්න මතු විය හැකි ය. පුස්තකාලය තුළ කථා පැවැත්වීම සඳහා බාහිර අයට ආරාධනා කරන්නේ නම්, එයට සවන් දීම සඳහා සැලකිය යුතු ළමයින් පිරිසක් සිටින්නේ ද යන්න පිළිබඳ ව පුස්තකාලයාධිපති ස්ථිරව ම දැන ගත යුතුය. පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් තම විනෝදාංශ හා රුචි අරුචිකම් පිළිබඳ ව සාකච්ඡා කිරීමට කැමැති විය හැකිය. නිරන්තර ශ්‍රාවක පිරිසක් ගෙන්වා ගැනීමට එය හොඳ මාර්ගයකි. සමහර අවස්ථාවල දී ගාස්තුවක් ගෙවීම අවශ්‍ය විය හැකිය. කර්තෘන්ට ගාස්තුවක් ගෙවීමට අවශ්‍ය වුවත් සමහර අවස්ථාවල දී ඔවුන්ගේ ප්‍රකාශකයින් විසින් ඔවුන්ට අනුග්‍රහ දැක්වීමට ඉඩ ඇත.

ළමා පුස්තකාලවලට සාම්ප්‍රදායික ලෙස සම්බන්ධ වූ විවිධ විනෝදාංශ තිබේ. වෙස් ක්‍රීඩාව හා මුද්දර එකතු කිරීම නිදසුන් වශයෙන් දැක්විය හැකිය. ඒ ආකාරයේ පුස්තකාල සමාජයක් ආරම්භ කරන්නේ නම්, එය ළමයින්ගෙන් ප්‍රකාශ වූ රුචි අරුචිකම් මත හෝ ඔවුන්ගේ ඉල්ලීම් මත හෝ ආරම්භ කිරීම ඉතා මත් යෝග්‍ය වේ. එමෙන් ම එම විෂයයන් පිළිබඳ ව පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් යමක් දැන ගැනීම ද ප්‍රඥාගෝචරය.

නිර්මාණාත්මක ක්‍රියාකාරකම් විශාල වශයෙන් රඳා පවතින්නේ පුස්තකාල කාර්ය මණ්ඩලයේ දක්ෂතා හා පවතින පහසුකම් මතයි. නිර්මාණාත්මක නාට්‍ය සඳහා විශාල ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවේ. නිර්මාණාත්මක ශිල්පීය ක්‍රියාකාරකම් සඳහා ද ඉඩ පමණක් නො ව, අවශ්‍ය පහසුකම් ද තිබිය යුතු ය. සහභාගිවන්නන්ගේ ඇඳුම් පැළඳුම් ආරක්ෂා කළ යුතු ද වේ. ශිල්පීය ක්‍රියාකාරකම් කෙරෙහි උනන්දු කිරීමට හෝ එම ක්‍රියාකාරකම් කෙසේ කළ යුතු ද යන්න පිළිබඳ ව අදහස් ලබා ගැනීමට හෝ පොත්පත් හඳුන්වා දිය යුතුය. රූකඩ සෑදීම හා රූකඩ සංදර්ශන ඉදිරිපත් කිරීම, නාට්‍ය හා සම්බන්ධ කෙරෙන තවත් ශිල්පයකි.

ක්‍රියාත්මක කිරීමේ පහසුකම් තිබේ නම් චිත්‍රපටි,ස්ලයිඩ් රූප, තැටි හා කැසට් පටි ආදිය යොදා ගත හැකිය. ළමා කථා මත පදනම් වූ චිත්‍රපට, කුලියට ලබා ගත හැකිය. කතන්දර කීමේ වැඩ සටහන්වල දී ඊට යෝග්‍ය අයුරින් සංගීතය ද උපයෝගී කර ගත හැකිය.

අවශ්‍ය සම්පත් තිබේ නම්, ඕනෑ ම ළමා කණ්ඩායමකට සුදුසු වන අයුරින්, කතන්දර, ශිල්පීය ක්‍රියාකාරකම් හා දේශන ඇතුළත් මිශ්‍ර වැඩ සටහන් සැලසුම් කළ හැකි ය. එක් කැනේඩියානු පුස්තකාලයක් විසින් උපන් දින සාද වැඩ සටහන් පිළිබඳ අදහස හඳුන්වා දෙන ලදී. පැය දෙකක කාලයකින් යුක්ත මෙම වැඩ සටහනට කතන්දර, උපන් දින පිළිබඳ දේශන, ඇඳුම් මැසීම පිළිබඳ ශිල්පීය ක්‍රියාකාරම් හා රූකඩ දර්ශනයක් ද ඇතුළත් විය. උපන් දින සමරන ළමයාගේ දෙමාපියන්ට ඊට සහභාගි වීම සඳහා ඉඩ පහසුකම් කලින් වෙන් කර ගත හැකි

වේ. සහභාගිවන්නන් සඳහා කෑම බීම සැපයීමත් තරඟන්නන් එක්රැස් කිරීමත් ළමයාගේ දෙමාපියන්ගේ වගකීම වේ. පුස්තකාලය පිළිබඳ හොඳ ආකල්පයක් ඇති කිරීම සඳහාත් වඩා පුළුල් ජන සංඛ්‍යාවක් වෙත පුස්තකාල සේවය හඳුන්වා දීම සඳහාත් මෙය හොඳ මාර්ගයක් බව අවබෝධ විය.

## ප්‍රශ්න විචාරාත්මක තරඟ

පුස්තකාලවල තොරතුරු ලබා දීමේ කාර්ය අවධාරණය කිරීම අවශ්‍ය නිසා, විවිධාකාර ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් සංවිධාන කිරීමට ළමා පුස්තකාලයාධිපතීන්ට හැකි ය. ප්‍රශ්න විචාරාත්මක තරගයක අරමුණ කුමක් දැයි නිවැරැදි ව තීරණය කිරීම අවශ්‍යය. එහි අරමුණ තොරතුරු ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් පොත්පත්වලට අනුබල දීමද නැති නම් පොත් වශයෙන් පමණක් අනුබල දීමද? එවන් ප්‍රශ්න සංඛ්‍යාවට සීමාවක් තිබේ. එම ප්‍රශ්න පොත් පිළිබඳ ව හෝ සාමාන්‍ය දැනීම පිළිබඳ ව හෝ වීමට පුළුවන.

ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්වල අරමුණ ප්‍රබන්ධ කථා කියවීම වර්ධනය කිරීම නම්, ඒ සඳහා පරෙස්සමෙන් සූදානම් විය යුතුවේ. පොත් පිළිබඳ ව ප්‍රශ්න අසන විට එම පොත්වල මාතෘකා තුළින් නිවේදනය කළ යුතු අතර, එම පොත්වල පිටපත් බොහෝමයක් ලබා ගැනීමට සැලැස්විය යුතුය. මෙම කාර්යයට පළාතේ පාසල්වලට ද සම්බන්ධ විය හැකිය. නියමිත වයස් සීමාවකට අයත් ළමයින් කණ්ඩායමක් තෝරා ගැනීමේ වගකීම සෑම පාසලකට ම පැවරේ. මෙම තරඟ සංවිධානය කරන ආකාරය ඒ ඒ ප්‍රදේශ අනුව රඳා පවතිනු ඇත.

විනෝදය පිණිස වෙනත් පුද්ගලයින්ට ද පොත් පිළිබඳ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් කළ හැකි ය. සාමාන්‍ය දැනීම පිළිබඳ ප්‍රශ්න විචාරාත්මක තරග සංවිධානය කළ හැකි හොඳ ම ක්‍රමය එය වේ. ප්‍රශ්න මාලාවක් සකස් කිරීම පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් සිදු කරන අතර ළමයින් විසින් යම් කිසි කාලයක් තුළ ඒවාට පිළිතුරු සපයනු ලැබේ. විවිධ වයස් මට්ටම් අනුව ප්‍රශ්න සකස් කළ හැකි ය. සතුන් පිළිබඳ ව වැනි පොදු තේමාවක් යටතේ ප්‍රශ්න සකස් කළ හැකිය.

## කියවීමේ වැඩ සටහන්

ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්වලත් කියවීමේ වැඩ සටහන්වලත් අරමුණු එක සමානය. මෙම වැඩ සටහන් මගින් කියවීම සඳහා ළමයින් තුළ පෙළඹවීමක් ඇති කළ හැකි ය. කියවීමේ වැඩ සටහන් සාමාන්‍යයෙන් සංවිධාන කරනු ලබන්නේ යම් කිසි විශේෂිත කාල පරිච්ඡේදයක් තුළ දී ය. එහි දී පොත්වල නම් ලැයිස්තුවක් සකස් කරනු ලැබේ. සෑම ළමයකු ම එම විශේෂිත කාල පරිච්ඡේදය තුළ දී යම් පොත් සංඛ්‍යාවක් කියවිය යුතුය. මෙම වැඩ සටහනෙහි ප්‍රගතිය වාර්තා කිරීම සඳහා පුස්තකාලය විසින් හෝ ළමයකු විසින් හෝ ලොග් පොතක් හෝ සටහන් හෝ පවත්වා ගෙන යා යුතු ය. කියවීමේ වැඩ සටහන් අනිසි ලෙස යොදා ගත හැකි බවට අදහස් ප්‍රකාශ වී ඇත. එමෙන් ම නියමිත කාලය තුළ පොත් කියවා අවසන් කළ යුතු නිසා ළමයින් අවබෝධයකින් තොර ව, ඉක්මනින් පොත් කියවා ගෙන යන බවත් පෙන්වා දී ඇත. කෙසේ වුවත්, කියවීමේ වැඩ සටහන් හා ප්‍රශ්න මාලා මගින් පාඨකයන් ධෛර්යවත් කළ හැකි ය. ජීවිතයේ පසු කාලයේ දී පොත් හා තොරතුරු සෙවීම් සඳහා අවශ්‍ය කුසලතා පුරුදු පුහුණු වීමේ අවස්ථාව එමගින් ලැබේ.

සමහර අවස්ථාවල දී පුස්තකාලයට අලුත් සාමාජිකයන් ඇද ගැනීමට පුස්තකාලයාධිපති කෙතරම් උත්සාහයක් දරන්නේ ද යත්, නිරතුරු ව පුස්තකාලය භාවිත කරන ළමයින්ගේ අවශ්‍යතාවන් ගැන සොයා බැලීම පැහැර හැරේ. කියවීමේ වැඩ සටහන් සාර්ථක ව අවසන් කරන ළමයින්ට යම් ආකාරයක පිළිගැනීමක් ලබා දීම තුළින් ඔවුන් දිරි ගැන්විය හැකිය. මෙවැනි ක්‍රියාකාරකම් තුළින් ළමයින් වැඩි දෙනෙක් විශාල සතුටක් හා තෘප්තියක් ලබති.

## තනි ව කළ හැකි ක්‍රියාකාරකම්

බ්‍රිතාන්‍යයේ සමහර ළමා පුස්තකාලවල බොහෝ කාලයක් තිස්සේ වෙස් ක්‍රීඩා සමාජ ක්‍රියාත්මක වුවත්, විවිධාකාර අධ්‍යාපනික ක්‍රීඩා සැපයීමේ නෝර්වේජියානු ආදර්ශය අනුගමනය කර ඇත්තේ පුස්තකාල කීපයක පමණි.

මෙම පරිච්ඡේදයේ විස්තර කරන ලද බොහෝ ක්‍රියාකාරකම් සපයන පුස්තකාල සමාජවලට අඛණ්ඩ පදනමක් මත වර්ෂය පුරා ම ක්‍රියාත්මක විය හැකිය. පාසල් යන වයසේ ළමයින් සඳහා වූ පුස්තකාල ක්‍රියාකාරකම් යොදා ගත යුත්තේ සවස් වරුවේ හා නිවාඩු දිනවල දීය. ළමයින් පාසලේ දී යෙදෙන ක්‍රියාකාරකම්වලට බෙහෙවින් වෙනස් ක්‍රියාකාරකම්, පාසල් කාලයෙන් පසු යෙදිය යුතු යැයි අපේක්ෂා නොකළ යුතු ය. කෙසේ වුවත්, දෙමාපියන් වැඩ අවසන් වී ගෙදර පැමිණෙන තුරු ම වැඩිහිටියකු නොමැති ව සිටින ළමයින් විශාල සංඛ්‍යාව සඳහා පුස්තකාලය යහපත් ස්ථානයක් නම්, ක්‍රියාකාරකමක් සංවිධානය කිරීම හොඳ අදහසක් බව පුස්තකාලයාධිපතිට හැඟී යා හැකි ය. පෙර පාසල්, සෙල්ලම් කණ්ඩායම්, පාසල්, රෝහල් හා තරුණ සමූහ ආදියට සහභාගි වීමේ වැදගත්කම පෙර පරිච්ඡේදයේ දී සාකච්ඡා කරන ලදී. ප්‍රසිද්ධ උද්‍යානවල හා වෙනත් විවෘත ස්ථානවල පුස්තකාලයාධිපතීන් විසින් කතන්දර කීම පසු ගිය වර්ෂ කීපය තුළ බෙහෙවින් ජනප්‍රිය වී තිබේ.

මෙහි අරමුණ ළමයින්ට පුස්තකාල හඳුන්වා දීමට වඩා කතන්දර හඳුන්වා දීම යි. පුස්තකාලය තුළ සිදු කෙරෙන සේවයට මේ මගින් හානියක් සිදු නො වේ. එය නීත්‍යානුකූල ක්‍රියාකාරකමකි. එංගලන්තයේ ලන්ඩන් නුවර පුස්තකාලවල බාහිර කටයුතු සඳහා අර්ධ-කාලීන කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබේ. වෙනත් ආකර්ෂණ ඉතා අඩු වුත් ප්‍රචාරක කටයුතු සාපේක්ෂ වශයෙන් පහසු වුත් ළමයින්ට පහසුවෙන් පැමිණිය හැකි වුත් කුඩා ප්‍රජාවල, ළමා පුස්තකාල කටයුතු වඩාත් ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ හැකිය. මෙම කටයුතුවලට සම්බන්ධ වන කාර්ය මණ්ඩල තුළ සාමාජිකයන් නියම පෞරුෂත්වයෙන් හා නම්‍යතාවෙන් යුක්ත විය යුතු ය. පුස්තකාල පහසුකම්, වයස හා පලපුරුද්ද ඒ සඳහා සුදුසුකම් නො වේ. එහෙත් මෙම කටයුතුවල අගය හා කාර්යක්ෂමතාව ඇගැයීමේ දී, වෘත්තීය විශේෂඥ ඥානය ලබා ගැනීම වැදගත් වේ. අත්හදා බැලීම් අවශ්‍ය වුවත් අසාර්ථක සේ ඔප්පු වන වැඩ සටහනක් දිගට ම කර ගෙන යෑමේ පලක් නැත.

## එකොළොස් වන පරිච්ඡේදය

# ප්‍රදර්ශන

ළමා පුස්තකාලයාධිපතිත්වයේ වැදගත් ලක්ෂණයක් නම් පොත්පත් වර්ධනය කිරීම යි. ඒවා වර්ධනය කිරීමේ එක් ක්‍රමයක් නම්, ඒවා අලංකාර ලෙස ප්‍රදර්ශනය කිරීමයි. පුස්තකාලය ඇතුළත පමණක් නො ව, ඉන් බාහිර ව ද ප්‍රදර්ශන පැවැත්විය හැකිය.

ප්‍රදර්ශන පැවැත්වීම ඕනෑ ම ළමා පුස්තකාලයක නිරන්තර ලක්ෂණයක් විය යුතු ය. පොත් එකතුවේ යම් යම් අංශ කෙරෙහි අවධානය යොමු කර වීමටත් වර්ගීකරණ ක්‍රම මගින් සාමාන්‍යයෙන් වෙන් කර ඇති පොත් එක් කිරීමටත් පොත් කියවීම විනෝදාංශයක් විය හැකි බව කෙරෙහි අවධානය යොමු කර වීමටත් කාලීන හෝ ජාතික සිදු වීම් නිරූපණය කිරීමටත් හොඳ මාර්ගයක් ලෙස ප්‍රදර්ශන සැලකිය හැකිය. එමෙන් ම පුස්තකාල හෝ පාසල් කටයුතුවල කොටසක් වශයෙන් ළමයින් විසින් නිපදවන ලද දේ ද ප්‍රදර්ශනය කළ හැකිය.

තමන් විසින් නිපදවන ලද දේ ප්‍රදර්ශනය කෙරෙන ආකාරය දැකීමට ළමයින් ප්‍රිය කරන අතර ඒ සඳහා දෙමාපියන් ද දිරිමත් කළ හැකිය. පාසලක යම් කිසි පන්තියක් විසින් ව්‍යාපෘතියක් කිරීමේ දී පුස්තකාලයේ පොත් එකතුවෙන් වැදගත් ප්‍රයෝජනයක් ලබා ගෙන තිබේ නම්, එම පොත් මෙන් ම ව්‍යාපෘති කටයුතු ද ප්‍රදර්ශනය කළ හැකිය. ඒ ආකාරයේ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමට හා ආරක්ෂා කිරීමට කෞතුකාගාරවල තිබෙන ආකාරයේ වීදුරු ආවරණ තිබේ නම්, කෞතුකාගාර වැනි බාහිර මාර්ගවලින් ලබා ගන්නා ත්‍රිමාණ භාණ්ඩ වුව ද ප්‍රදර්ශනය කළ හැකිය.

වැඩිහිටි හෝ ළමා හෝ යම් සමූහයකට දේශනයක් පැවැත්වීමට පුස්තකාලයාධිපති යන සෑම අවස්ථාවක ම එම අවස්ථාවට උචිත පරිදි කුඩා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම

ප්‍රයෝජනවත් වේ. ඒ ආකාරයේ ප්‍රදර්ශනයක් පැවැත්වීමට ලැබෙන කාලය ඉතා සීමිත නිසා, යොදා ගන්නා උපකරණ ඉතා සරල විය යුතු ය. එවැනි ප්‍රදර්ශනයක් සඳහා අවශ්‍ය මේස හෝ වෙනත් උපකරණ සපයන ලෙස, දේශනය පවත්වන ආයතනයෙන් ඉල්ලා සිටිය යුතු ය.

අනෙකුත් සංවිධාන සමග එක් වී ප්‍රදර්ශන පැවැත්වීමට ද පුස්තකාලයට හැකි ය. අධ්‍යාපනික ආයතන, ගුරු දෙගුරු සමිති, ජාතික ආයතනවල ප්‍රාදේශීය ශාඛා යනාදිය ද පොත් වෙළෙඳුන් හා ප්‍රකාශකයන් ද ඒ ආකාරයේ සංවිධාන විය හැකි ය. එහි අරමුණ විය යුත්තේ සෑම ආකාරයකින් ම කියවීමේ රුචිය වර්ධනය කිරීම හා මහජන පුස්තකාලය භාවිත කිරීමට ළමයින් දිරි ගැන්වීම යි.

සමහර පුස්තකාලවල ප්‍රදර්ශන ශාලා හෝ රැස්වීම් ශාලා හෝ තිබේ. ඒවායේ ප්‍රදර්ශන පැවැත්විය හැකි ය. සමහර අවස්ථාවල දී ප්‍රදර්ශන පැවැත්වීම සඳහා ස්ථාන කුලියට ගැනීමට සිදු වේ. ප්‍රදර්ශනය පවත්වන ස්ථානය මහජනයාට හා වාහනවලට පහසුවෙන් ළඟා විය හැකි වූත් වාහන ගාල් කිරීමේ පහසුකම් ඇත්තා වූත් ස්ථානයක් විය යුතු ය. එමෙන් ම එම ශාලාවේ වැසිකිළි පහසුකම් හා ආහාර පාන ලබා ගැනීමේ පහසුකම් තිබිය යුතු ය. ළමා පොත් සතිය වැනි සිද්ධීන්වලට පොත් ප්‍රදර්ශන සම්බන්ධ කිරීමෙන් වැඩි ප්‍රචාරයක් ලබා ගත හැකි ය. ප්‍රදර්ශනය නරඹන්නන් හට පහසුවෙන් ඔබ මොබ ගමන් කළ හැකි ආකාරයට ප්‍රදර්ශනය සැලසුම් කළ යුතු ය. ළමයින්ට හා වැඩිහිටියන්ට අවශ්‍ය පොත් පහසුවෙන් සොයා ගත හැකි වන පරිදි ප්‍රදර්ශන පුවරු ආරක්ෂිත ලෙස තබා හොඳින් ලේබල් අලවා තිබිය යුතු ය.

ප්‍රදර්ශන පැවැත්වීම, කියවීමේ රුචිය ඇති කිරීමේ ක්‍රියාවලියේ මූලික අවස්ථාව පමණි. පොත් දෙස බැලීමෙන් ඇති වන රුචිය බොහෝ අය තුළ වැඩි කාලයක් නො පවතී. මේ සඳහා වෙනත් ක්‍රියාකාරකම් ද තිබිය යුතු ය. ප්‍රදර්ශනයක් ආරම්භ කිරීමට පෙර, පොත් කවර සැලසුම් කිරීමේ තරග, කථා ලිවීමේ තරග වැනි කටයුතු සංවිධානය කිරීම මඟින් ප්‍රයෝජනවත්

ප්‍රචාරයක් ලබා ගත හැකි වේ. එම තරගවල අවසාන දිනය වශයෙන් ප්‍රදර්ශනය පැවැත්වීමට සතියකට පෙර දිනයක් යොදා ගත හැකි ය. තරගවලින් ජය ගත් අය සඳහා ත්‍යාග ප්‍රදානය ප්‍රදර්ශනය ආරම්භ කිරීමේ උත්සවයේ දී ඉටු කළ හැකි ය. පොත් ප්‍රදර්ශන කාලය තුළ ප්‍රශ්න විචාරාත්මක තරග ද සැලසුම් කළ හැකිය. ප්‍රදර්ශනයට තබා ඇති පොත්වල මාතෘකා, කර්තෘන්, කථා පොත්වල එන විවිධ චරිත ආදිය පිළිබඳ ප්‍රශ්න මෙම තරග සඳහා යොදා ගත හැකිය.

කථා කීම, දේශන, චිත්‍රපට දර්ශන වැනි, කලින් සාකච්ඡා කළ පුස්තකාල ක්‍රියාකාරකම් සැලසුම් කළ හැකිය. එවැනි අවස්ථාවල දී ළමයින්ට දේශන පැවැත්වීම සඳහා කර්තෘන්ට හා ළමා පොත් චිත්‍රශිල්පීන්ට ආරාධනා කළ හැකිය. එවැනි කටයුතුවලට අනුග්‍රහය දැක්වීමට බොහෝ විට ප්‍රකාශකයෝ ද කැමැත්තක් දක්වති. ඇමරිකානු ළමා පුස්තකාලයාධිපතීන්ට මෙවැනි කටයුතුවල දී, එහි ළමා පොත් සංගමයේ සහාය ලැබී ඇත. ප්‍රකාශකයෝ ද විශාල වශයෙන් උපකාර කරති.

පොත් වෙළෙඳුන්ගේ සහාය ඇති ව පොත් අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථානයක් ද පිහිටුවිය හැකිය. එය පොත් ප්‍රදර්ශනයක අත්‍යවශ්‍ය අංගයකි. ඒ ආකාරයේ අලෙවි මධ්‍යස්ථානයක් සැලසුම් කරන්නේ නම්, පොත්වලින් ප්‍රමාණවත් පිටපත් රැගෙන ඒමට හැකිවන පරිදි කල් ඇති ව එම ප්‍රකාශකයන් සම්බන්ධ කර ගත යුතුය. ප්‍රදර්ශනයට තබන භාණ්ඩ පිළිබඳ පුළුල් ප්‍රසිද්ධියක් ලබා දිය යුතුය.

### දොළොස් වන පරිච්ඡේදය

# මහජන සම්බන්ධතා සහ ප්‍රචාරක කටයුතු

ළමයින්ට පහසුවෙන් ළඟා විය නොහැකි ස්ථානවල සමහර පුස්තකාල පිහිටා ඇත. තවත් සමහරක් බැලූ බැල්මට සිත් ඇද ගන්නාසුලු නොවේ. මේ ගැන සැලකිලිමත් වීම හැරුණුවිට පුස්තකාල සේවාවන් කෙරෙහි ළමයින්ගේ අවධානය යොමු කිරීම පිණිස යම් කිසි දෙයක් අවශ්‍යයෙන් කළ යුතු වේ. ළමයින්ට සේවාවන් ලබා දීම පුස්තකාල සේවාවලින් එකක් වන අතර එය ප්‍රචාරය කිරීම ද ඉතා පහසු ය.

කෙසේ වුවත්, පුස්තකාල පද්ධතියේ ප්‍රචාරක ප්‍රතිපත්තිවලට අනුකූල ව කටයුතු කිරීමට ළමා පුස්තකාල කාර්ය මණ්ඩලයට සිදු වේ. සමහර පුස්තකාල පද්ධතීන් දැනට මත් පවත්නා සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගනියි. යම් කිසි වැඩ සටහනක් සඳහා ප්‍රසිද්ධියක් ලබා දීම අවශ්‍යය යැයි පුස්තකාලයට හැඟී යන්නේ නම්, ප්‍රථමයෙන් ම කළ යුත්තේ පුවත් පත්වලින් ද ගුවන් විදුලියෙන් ද රූපවාහිනියෙන් ද ප්‍රචාරය කිරීම සඳහා දැන්වීමක් සකස් කිරීම යි. එය, වැඩ සටහන පිළිබඳ සරල භාෂාවෙන් ලියන ලද්දක් විය යුතු ය. ඒ පිළිබඳ වැඩි තොරතුරු ලබා ගත හැකි අයගේ නම සහ දුරකථන අංකය ද දැන්වීමේ සඳහන් කළ යුතුය. බ්‍රිතාන්‍යයේ නම් නිවාඩු කාලය තුළ ළමයින්ගේ ක්‍රියාකාරකම් හා පුස්තකාලයාධිපතීන් විසින් ලබා දෙන ප්‍රයෝජනවත් පොත් ලැයිස්තු පිළිබඳ ව සමහර ජාතික පුවත් පත්වල ප්‍රසිද්ධ කරනු ලැබේ. එනමුත් එවැනි ප්‍රචාරයක් කිරීමට පෙර ඉන් ඇති වන පලවිපාක ගැන පුස්තකාලයාධිපති පරීක්ෂාකාරී ව සිතා බැලිය යුතුය. විශේෂඥ ළමා පුස්තකාලයාධිපතීහු, තමන්ගේ රාජකාරි ජීවිතයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පුස්තකාලයෙන් පිටත ගත කරති. එසේ බාහිර ව ගත කරන කාලයෙන් වැඩි ප්‍රමාණයක් යම් ආකාරයක මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදවති. එහි දී ඔවුහු වැඩිහිටියන්

හෝ ළමයින් හෝ සමඟ කථා බහ කරති. කලින් සඳහන් කළ ආකාරයට තමන්ගේ ම කැමැත්තෙන් පුස්තකාලයට පැමිණෙන්නේ ළමයින්ගෙන් සුළු ප්‍රමාණයකි. සමහර ළමයින් පුස්තකාලයට හඳුන්වා දෙනු ලබන්නේ ඔවුන්ගේ දෙමාපියන් හෝ ගුරුවරුන් හෝ මිතුරන් හෝ විසිනි. ළමයින්ගෙන් වැඩි දෙනකු ඒ සඳහා දිරිමත් කළ යුතුය. පුස්තකාලයාධිපති මෙන් ම වැඩිහිටි නියෝජිතයකු ද ඒ සඳහා ඉදිරිපත් විය යුතුය.

තනි තනි ව හෝ සාමූහික වශයෙන් හෝ පුද්ගලයන්ට කථා කිරීමට පුස්තකාලයාධිපති සූදානම් විය යුතුය. යම් පුද්ගලයකු හමු වීමට සැලසුම් කරන්නේ නම්, එම පුද්ගලයා හෝ එම පුද්ගලයා නියෝජනය වන කණ්ඩායම හෝ පුස්තකාලයෙන් බලාපොරොත්තු වන උපකාරය කුමක් ද යන්න පිළිබඳ පුස්තකාලයාධිපති පැහැදිලි අවබෝධයකින් සිටිය යුතුය. අනෙකුත් පුද්ගලයන්ගේ ගැටලු පිළිබඳ ව පුස්තකාලයාධිපති සානුකම්පිත හා ආචාරශීලී බවක් දක්විය යුතුය. පුස්තකාලයාධිපතිත්වය සේවා වෘත්තියකි. පුස්තකාල භාවිතයට මිනිසුන් බලෙන් යොමු කර විය නො හැකිය. සමහර පුද්ගලයන් හමු වීමට යාම ප්‍රයෝජනවත් නොවීමට ඉඩ තිබේ. ළමයින්ට සේවාවක් ලබා දීමට කල්පනා කිරීමට පෙර, වැඩිහිටියන්ගේ සහයෝගය අවශ්‍ය වේ. එබැවින් ඇතැම් කටයුතු අසාර්ථක වුවත් ඉන් අධෛර්යවත් නොවිය යුතුය. අනෙක් පුද්ගලයන්ගේ සිත්වල ඇති වන බාධක ඉවත් කිරීම පුස්තකාලයාධිපතිගේ කාර්යය වේ. නිදසුනක් වශයෙන්, ඉතා ළාබාල හෝ ආබාධිත හෝ ළමයින් පොත්වලට හානි කිරීම හා අස්ථාන ගත කිරීම ගැන ඔවුන්ට වගකිව යුතු වැඩිහිටියන් තුළ බියක් ඇති විය හැකිය.

ඇතැම් අවස්ථාවල දී සමූහවලට කථා කිරීමට වඩා පුද්ගලයන්ට කථා කිරීම පහසුය. මහජන සම්බන්ධතා පිළිබඳ එතරම් අත්දැකීම් නැති අය මේ අදහසට එකඟ නොවිය හැකිය. පුද්ගලයකුට වඩා සමූහයකට අම්හිරි යමක් කීම වඩා පහසුය. නිදසුන් වශයෙන් පොත් පත් පරෙස්සමෙන් රැක බලා ගැනීම, පොත් ඇල්ලීමට පෙර අත් සෝදා ගැනීම, පොත් පත් කුඩා ළමයින්ගෙන් සහ කෘමීන්ගෙන් ආරක්ෂා කර ගැනීම, පොත්වල

පිටු නැමීමෙන් වැළකීම ආදි උපදෙස් දක්විය හැකි ය. ළමයින්ට තනි තනි ව මෙම උපදෙස් දීම ඉතාමත් දුෂ්කර මෙන් ම කාලය නාස්ති වන ක්‍රියාවකි. සමූහයකට උපදෙස් ලබා දෙන විට, පෞද්ගලිකත්වයෙන් තොර ව සමූහයට ම ලබා දෙන උපදෙස් සේ සලකා ඒවා පිළිගනු ලැබේ. පුද්ගලයන්ට තනි තනි ව එම උපදෙස් ලබා දීමට උත්සාහ කිරීමේ දී, සමහර විට එය ඔවුන්ට කරන අපහාසයක් සේ සැලකීමටත් නුරුස්නා බවක් ඇති වීමටත් පුළුවන.

ළමයින් සඳහා පවත්වන කථා, පුස්තකාලය භාවිත කරන ආකාරය පිළිබඳ ව හෝ පොත් පිළිබඳ ව හෝ විය හැකි ය. වැඩිහිටියන් සඳහා පවත්වන කථා, ළමයින් සඳහා වන පුස්තකාල සේවාවන්, කියවීමේ වටිනාකම්, දැනට පවත්නා ළමා පොත් ආදිය පිළිබඳ විය හැකිය. මේ ආකාරයේ දේශන පැවැත්වීමේ දී දෘශ්‍යාධාර යොදා ගැනීම ප්‍රයෝජනවත් වේ. තමන් ප්‍රකාශ කරන දේ පැහැදිලි කිරීමට හා දේශනයට සවන් දුන් අයට දේශනයෙන් පසු නැරඹීමට කුඩා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම ද ප්‍රයෝජනවත් වේ. දේශනයේ දී සඳහන් කරන ලද කරුණු නැවත මතක් කිරීම හා තව දුරටත් තහවුරු කිරීම සඳහා, පුස්තකාල සේවාවන් පිළිබඳ පත්‍රිකා හා පොත් ලැයිස්තු බෙදා දීම ද ප්‍රයෝජනවත් වේ. වීඩියෝ පටි සහ ස්ලයිඩ්-රූප වැඩ සටහන් යොදා ගැනීමෙන් රූපවාහිනියේ බලපෑමට හුරු වී සිටින ප්‍රේක්ෂකයන් ඇද ගැනීමට හැකි වනවා පමණක් නො ව, ප්‍රසිද්ධියේ කථා පැවැත්වීමට මැලි, එහෙත් එවන් වැඩ සටහනකින් පසු අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දියහැකි පුස්තකාලයාධිපතිට ද එය පලදායී වේ. තම දේශනවල දී දෘශ්‍යාධාර යොදා ගන්නා පුස්තකාලයාධිපති, එම උපකරණ කාර්යක්ෂම ලෙස සවි කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් නියම අයුරින් පුහුණුවක් ලැබිය යුතුය.

ප්‍රචාරක ද්‍රව්‍ය ප්‍රධාන වර්ග හතරකට බෙදිය හැකි ය. පුස්තකාල සේවාවන් පිළිබඳ පෝස්ටර් හා පත්‍රිකා, විශේෂ පුස්තකාල කටයුතු පිළිබඳ තොරතුරු හා පොත් ලැයිස්තු එම

වර්ග හතර යි. මුද්‍රිත ප්‍රචාරක ද්‍රව්‍ය ආකර්ෂණීය වුවත් මිල අධික ය. කෙසේ වුවත්, නවීන ප්‍රතිරූපණ ක්‍රම මගින් විශිෂ්ට නිපැයුම් ලබා ගත හැකිය. වෘත්තීයමය වශයෙන් කරන ලද දේවලට ළමයින් හුරු පුරුදු වී ඇත. එම නිසා පත්‍රිකා, වැඩ සටහන් හෝ පොත් ලැයිස්තු ආදිය හැකි තරම් වෘත්තීයමය නිමාවෙකින් සකස් කළ යුතු ය. චිත්‍ර ශිල්පය හා මෝස්තර කලාව ගැන සුදුසුකම් හා පුහුණුවක් ඇති අයකු සමහර පුස්තකාලවල සේවයට යොදවා ගෙන ඇත. පුස්තකාලයෙන් පළ කෙරෙන සියලු ප්‍රකාශන සඳහා නියමිත සැලැස්මක් හා රීතියක් පවත්වා ගැනීම හොඳ අදහසකි. ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනවලට, ප්‍රචාරක දැන්වීම් සැපයීමටත් සාමාන්‍යයෙන් ප්‍රකාශකයෝ කැමැත්තක් දක්වති.

සමහර පෝස්ටර, ප්‍රාදේශීය වශයෙන් තාවකාලික ව යොදා ගැනීමට සිදු වන ඒවා ය. අලංකාර ලෙස පෝස්ටර නිර්මාණය කළ අය, කාර්ය මණ්ඩලයේ සිටීමට පුළුවන. ප්‍රදර්ශනය කිරීම සඳහා සකස් කෙරෙන වඩා විසිතුරු පෝස්ටර, විවිධ සේවා ස්ථානවලට යැවිය හැකිය. පුළුල් ප්‍රචාරයක් අවශ්‍ය වන විශේෂ සේවා හෝ සිදු වීම් පිළිබඳ පෝස්ටර, වඩා හොඳින් සැලසුම් කළ යුතුය. ඒවා පුස්තකාලවලත් පාසල්වලත් වෙනත් ස්ථානයකත් ප්‍රදර්ශනය කළ හැකි ආකාරයට සකස් කළ යුතුය. ප්‍රජාවේ සිටින විශේෂ සමූහ සඳහා ඇති සේවාවන් කෙරෙහි අවධානය යොමුකර වන නව පෝස්ටර වරින් වර සකස් කිරීමට පුස්තකාල පද්ධතියට හැකිය.

පුස්තකාල සේවය සඳහා විවිධ හඳුන්වා දීමේ පත්‍රිකා සකස් කිරීමේ දී ළමා පුස්තකාලයාධිපති ඊට සම්බන්ධවේ. සමස්ත පුස්තකාල සේවය පිළිබඳවම තොරතුරු අවධාරණය කරන පත්‍රිකාවක ළමා පුස්තකාලය පිළිබඳ ව ද කොටසක් ඇතුළත් කළ හැකිය. ගුරුවරුන් දෙමව්පියන් හෝ ළමයින් අරමුණු කර ගෙන ද පත්‍රිකා සකස් කළ හැකිය. එසේ නැති නම් වයස අවුරුදු පහෙන් පහළ ළමයින් සඳහා හෝ යෞවනයන් සඳහා හෝ සැපයෙන සේවාවල යම් ස්වරූපයක් ඉදිරිපත් වන ආකාරයෙන් ඒවා සැලසුම් කළ හැකිය. මෙහි අරමුණ පුස්තකාලය වඩා

ප්‍රයෝජන ලබා ගත හැකි ස්ථානයක් බවට පත් කර ලීමයි. අමතර තොරතුරු ලබා ගත හැකි, කාර්ය මණ්ඩලයේ අයකුගේ නම පත්‍රිකාවේ සඳහන් කිරීම වැදගත් වේ. එමෙන් ම සඳහන් කරන තොරතුරු, ඉතා ම වැදගත් මූලික කරුණුවලට පමණක් සීමා කළ යුතුය. මෙවැනි පත්‍රිකා කියවීමට ජනතාව නැඹුරු කිරීම පහසු කාර්යයක් නො වේ. සංකීර්ණ, විධිමත් ආකාරයකින් නො ව, සැහැල්ලු, සරල ආකාරයකින් පත්‍රිකාවේ කරුණු ඉදිරිපත් කිරීමෙන් වැඩි ප්‍රයෝජන ලබා ගත හැකිය.

පුස්තකාලයේ වැඩ සටහන් පිළිබඳ ව නිවේදනය කිරීමේ දී දින, වේලාවන්, හා ස්ථාන පිළිබඳ වැදගත් තොරතුරු වඩා පහසුවෙන් දැකිය හැකි ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

ළමා පුස්තකාලයක වඩාත් ම පොදු ප්‍රචාරක මාධ්‍යය නම් පොත් ලැයිස්තු වේ. පොත් ලැයිස්තුවක වැදගත් ම කොටස පොත්වල නාම ලේඛනය වුවත්, පුස්තකාල සේවය පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු එහි පිට කවරයේ සඳහන් කළ හැකි ය. පොත් ලැයිස්තුව සකස් කිරීමට පෙර එය සකස් කිරීමේ අරමුණ පැහැදිලි ව තහවුරු කර ගත යුතු ය. පොත් ලැයිස්තු සකස් කිරීම, පුස්තකාලයාධිපති විසින් ඉටු කරනු ලබන නිර්මාණාත්මක කාර්ය කීපයෙන් එකකි. එය, බොහෝ පුස්තකාලයාධිපතීන් තෘප්තියක් ලබන කාර්යයකි.

ළමා පුස්තකාලයාධිපතිවරයා විසින් කණ්ඩායම් තුනක් සඳහා ලැයිස්තු සකස් කිරීමට ඉඩ ඇත. ළමයි. දෙමාපියෝ සහ ගුරුවරු එම කණ්ඩායම් තුන වෙති. මේ සියලු ම කණ්ඩායම් සඳහා එක් ලැයිස්තුවක් සකස් කිරීමට වඩා එක් එක් කණ්ඩායම අරමුණු කර ගෙන වෙන ම ලැයිස්තු පිළියෙල කිරීම මැනවි. එක් කණ්ඩායමක් සඳහා සකස් කරන ලද ලැයිස්තුවක් වෙනත් කණ්ඩායමක අවශ්‍යතා සඳහා යොදා ගැනීමට සමහර අවස්ථාවල දී සිදු වේ. නිදසුන් වශයෙන් ළමයින් සඳහා සකස් කරන ලද ළමා කථා පොත් ලැයිස්තුවකින් එවැනි පොත් අවශ්‍ය දෙමාපියකුට හෝ වැඩිහිටියකුට හෝ අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිවේ.

පොත් ලැයිස්තු සකස් කිරීමේ ප්‍රධාන අරමුණ නම්, පොත් තොගය භාවිත කිරීම කෙරෙහි උනන්දු කිරීමත් රස විඳිය හැකි පොත් තෝරා ගැනීමට ළමයින්ට උදවු කිරීමත්ය. පුස්තකාලය භාවිත කරන, විවිධ මට්ටම්වල සිටින සියලු ම ළමයින් සඳහා දීර්ඝ පොත් ලැයිස්තුවක් සකස් කිරීමට වඩා යම් මාතෘකාවක් පිළිබඳ ව හෝ යම් වයස් සීමාවන් සඳහා හෝ කෙටි වුත් සරල වුත් ලැයිස්තුවක් සකස් කිරීම වඩා ප්‍රයෝජනවත් වේ. ලැයිස්තුවේ සඳහන් පොත්වල පිටපත් සැලකිය යුතු ප්‍රමාණයක් පොත් තොගයේ තිබිය යුතුය. ලැයිස්තුවේ සඳහන් පොත් පුස්තකාලයේ නොමැති නම්, ළමයින් තුළ බලාපොරොත්තු කඩ වූ හැඟීමක් ඇති වීමට පුළුවන.

ළමා පුස්තකාලයක් පිළිබඳව කල්පනා කරන විට යම්කිසි චිත්ත රූපයක් අපේ සිත් තුළ ඇති වේ. පරිස්සමින් තෝරාගත් පොත් හොඳින් අසුරා තැබීම, එම පොත් විවිධ වයස් කාණ්ඩවලට ගැළපෙන ක්ෂේත්‍ර අනුව පිළියෙල කිරීම ඒ තුළ අපට දැකිය හැකි ය. එහෙත් ළමා පුස්තකාල පදයෙන් ඊට වඩා යමක් අදහස් වේ.

ළමයින් සඳහා ලියවුණු පොත් පිළිබඳ විශේෂඥතාවක් හා ළමයින් පිළිබඳ අවබෝධයක් ළමා පුස්තකාලයාධිපති තුළ තිබිය යුතු ය.

ළමා පුස්තකාලයක තිබිය යුතු සියලු ම අංග හා ළමා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ යටකී කරුණු මෙම පොතෙහි විස්තරාත්මකව සඳහන්ව ඇත.

ශීලා පී රායි මෙම පොතේ කතුවරියයි. රායි මහත්මිය එක්සත් රාජධානියේ බර්මින්හැම් බහුතාක්ෂණික ආයතනයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක හැටියට කටයුතු කර ඇත.

මෙම පොත සිංහලට පරිවර්තනය කළ පී.ඩී. අමරසිරි මහතා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් කටයුතු කරයි. ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිදරයෙකි.

ISBN 955-9011-82-0

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/19
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ............

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ............

Date : 2017/10/19

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*